# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2292/18 - 2022 අගෝස්තු මස 09 වැනි අඟහරුවාදා - 2022.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්.ඩී.බී. 3/2013 (**ii**)

**1971 අංක 52 දරන වෙළඳ නැව් පනත**

1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ 126 සහ 127 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 321 වන වගන්තිය යටතේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය.

2022 අගෝස්තු මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. (1) මේ නියෝග 2022 අංක 11 දරන වෙළඳ නැව් (සමුද්‍රීය කම්කරු) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර එම නියෝග 2023 පෙබරවාරි මස 04 දින සිට බලාත්මක විය යුතු ය.

(2) කලින් කල සංශෝධිත (මේ නියෝගවල "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2006 සමුද්‍රීය කම්කරු සම්මුතිය සහ එම සම්මුතියට පසුව සිදුකරනු ලබන යම් සංශෝධනයක් බලාත්මක කිරීම මේ නියෝගවල කාර්යය විය යුතු ය.


1A - G 37248 — 08 (2022/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

*මේ නියෝගවල අදාළත්වය*

2. (1) මේ නියෝගයේ (2) වන සහ (3) වන අනු නියෝගවල විධි විධාන වලට යටත්ව, මේ නියෝග -

(අ) කවර හෝ තැනක තිබිය හැකි ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ඇති නැව් සඳහා;

(ආ) ශ්‍රී ලංකා ජල තීරයේ ඇති වෙනත් යම් විදේශ නැව් සඳහා;

(ඇ) (අ) හෝ (ආ) ඡේදයේ සඳහන් යම් නෞකාවක සිටින මුහුදු යාත්‍රාකරුවන් සඳහා; සහ

(ඈ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නන් සඳහා,

අදාළ විය යුතු ය.

(2) අන්‍යාකාරයෙන් ප්‍රකාශිතව විධිවිධාන සලසා ඇත්නම් මිස, මේ නියෝග -

(අ) රට අභ්‍යන්තර ජලාශයන්ට සීමා වී, ආරක්ෂිත ජලාශ හෝ ඒවාට තදාසන්න වූ ජලාශවලට සීමා වී යාත්‍රාකරණයේ යෙදෙන නෞකා සඳහා;

(ආ) සාමාන්‍යයෙන් වාණිජ කටයුතුවල නොයෙදෙන නෞකා සඳහා;

(ඇ) ධීවර කටයුතුවල හෝ ඊට සමාන කටයුතුවල යෙදෙන නෞකා සඳහා සහ රුවල් නැව් සහ චීන නැව් වැනි සාම්ප්‍රදායික ලෙස ඉදිකරන ලද නැව් සඳහා;

(ඈ) යුද නැව් හෝ නැව් ආධාරක සඳහා;

(ඉ) 2017 වෙළඳ නැව් (කුඩා වාණිජ යාත්‍රා) නියෝග අදාළ වන නැව් සඳහා; සහ

(ඊ) (199 වන අධිකාරය වූ) දියත් කිරීම පිළිබඳ ආඥාපනත අදාළ වන නැව් සඳහා,

අදාළ නොවිය යුතු ය.

(3) (අ) (මෙහි මින්මතු අධ්‍යක්ෂ-ජනරාල්වරයා යනුවෙන් සඳහන් කරනු ලබන) වෙළඳ නැව් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, දළ ටොන් ප්‍රමාණය 200ට වඩා අඩු වන සහ ජාත්‍යන්තර මුහුදු ගමන්වල යෙදී නොසිටින යම් ශ්‍රී ලංකා නෞකාවක් සඳහා මේ නියෝගවල යම් විධිවිධානයක් අදාළ කර ගැනීම සාධාරණ හෝ ප්‍රායෝගික නොවන බවට කලින් කලට තීරණය කරනු ලබන අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, තීරණය කරනු ලබන පරිදි සාමාන්‍යයෙන් හෝ යම් කාලයක් සඳහා හෝ යම් මුහුදු ගමනක් සඳහා එම නෞකාව හෝ යම් නිශ්චිත නෞකා වර්ග නිදහස් කරනු ලැබිය හැකි ය.

(ආ) (3) (අ)අනුනියෝගය යටතේ යම් නිදහස් කිරීමක් ප්‍රදානය කිරීමේ දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සුදුසු යැයි සිතන ශ්‍රී ලංකා නෞකාවක් හෝ යම් නිශ්චිත ශ්‍රී ලංකා නෞකා වර්ග මත අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් යම් කොන්දේසි පනවනු ලැබිය හැකි ය.

(ඇ) (3) වන අනුනියෝගයේ (අ) සහ (ආ) ඡේදවල බලතල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, මේ නියෝගවල හෝ සම්මුති සංග්‍රහයේ අ කොටසේ සඳහන් යම් විධිවිධානයක් වෙනුවට, වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට සහ යම් මුහුදු යාත්‍රාකරුවකුගේ රැකියා ගිවිසුමේ හෝ සාමූහික ගිවිසුමක හෝ වෙනත් පියවරවල නියමයන්ට අනුකූලව ක්‍රියා කළ යුතු බවට වන නියමයක්, කොන්දේසිවල ඇතුළත් විය හැකි ය.

(ඈ) යම් නිදහස් කිරීමකට, සම්මුතියේ A3.1 වන ප්‍රමිතිය (නවාතැන් සහ විනෝදාත්මක පහසුකම්) මගින් ප්‍රකාශිතවම අවසර ලබා දෙන අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සම්මුතියේ A3.1 වන ප්‍රමිතියේ සඳහන් නියමයන්ගෙන් සමහර හෝ සියලුම නියමයන්ගෙන් යම් නැවක් නිදහස් කරනු ලැබිය හැකි ය.

(3)

(i) නෞකාවේ ඇති ඉඩකඩ;

(ii) නිදහස් කිරීම මගින් නෞකාවේ ව්‍යුහයට සිදුකරන බලපෑම;

(iii) නිදහස් කිරීම මගින් නෞකාවේ සිටින තැනැත්තන්ගේ ආරක්ෂාවට සිදුකරන බලපෑම;

(iv) නිදහස් කිරීම මගින් මුහුදු යාත්‍රාකරුවන්ගේ අපහසුතාව කෙරෙහි වන බලපෑම; සහ

(v) සතුටුදායක විකල්ප වැඩපිළිවෙලවල්,

පිළිබඳ සැලකිල්ලට ගනිමින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එසේ කිරීම සාධාරණ සහ ප්‍රයෝගික වේ යැයි සලකනු ලබන්නේ නම් පමණක් ඔහු විසින් (3) වන අනුනියෝගයේ (ඈ) ඡේදය යටතේ වන නිදහස් කිරීම ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(ඊ) ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජලතීරයේ කාර්යයේ නියැළී සිටින දළ ටොන් ප්‍රමාණය 3000ට අඩු නැවක් අධ්‍යක්ෂ-ජනරාල්-වරයා විසින් සම්මුතියේ A.2.5.2 වන ප්‍රමිතියේ නිශ්චිතව දක්වා ඇති නියමයන්ගෙන් ඕනෑම නියමයකින් නිදහස් කරනු ලැබිය හැකි ය.

(උ) මේ නියෝගය යටතේ වන යම් නිදහස් කිරීමක්-

(i) ලිඛිතව ලබා දිය යුතු ය;

(ii) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි නියම මත ප්‍රදානය කළ යුතු ය; සහ

(iii) නෞකාවේ අයිතිකරු වෙත ලිඛිතව දැන්වීමක් ලබා දීමෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(ඌ) (3) වන අනුනියෝගයේ (අ) සහ (ඈ) ඡේද යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් පිළිබඳ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු ය.

## II වන කොටස

### *මුහුදු යාත්‍රාකරුවන්ට නැව්වල රාජකාරි කිරීම සඳහා වන අවම අවශ්‍යතා*

3. (1) වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු නැවක සේවයේ යෙදවීම හෝ කාර්යය පැවරීම හෝ රාජකාරි කිරීම නොකළ යුතු ය.

(2) වයස අවුරුදු දහඅටට අඩු කිසිම මුහුදු යාත්‍රාකරුවකු නැවක කෝකිවරයා ලෙස සේවයේ යෙදවීම හෝ කාර්යය පැවරීම හෝ රාජකාරි කිරීම නොකළ යුතු ය.

(3) (1) වන සහ (2) වන අනුනියෝග උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර එහි වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

4. (1) (2) වන අනුනියෝගයට යටත්ව, වයස අවුරුදු දහඅටට අඩු මුහුදු යාත්‍රාකරුවකු රාත්‍රී කාලයේ දී නෞකාස්ථ සේවයේ යෙදවීම, කාර්යය පැවරීම හෝ රාජකාරි කිරීම නොකළ යුතු ය.

(2) (අ) ස්ථාපිත වැඩසටහන් සහ කාර්ය සටහන්වලට අනුකූල වන මුහුදු යාත්‍රාකරුගේ ඵලදායී පුහුණුව යොදා ගැනීමෙන් එය දුර්වල වන අවස්ථාවක; හෝ

(ආ) මුහුදු යාත්‍රාකරු රාත්‍රී කාලයේ දී තම කාර්ය ඉටු කරන බව සහ කළ යුතු රාජකාරිය-

(i) STCW සම්මුතියේ II/1 වන සහ II/3 වන නියෝග යටතේ නැව් තට්ටු නිලධරයකු සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(ii) STCW සම්මුතියේ III/1 වන නියෝගය යටතේ ඉංජිනේරු නිලධරයකු සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(iii) STCW සම්මුතියේ II/4 වන නියෝගය යටතේ යාත්‍රාකරණ මුරකාවල නිලනොලත් නැවියකු සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(iv) STCW සම්මුතියේ III/4 වන නියෝගය යටතේ එන්ජින් කාමරවල මුරකාවල නිල නොලත් නැවියකු සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(v) STCW සම්මුතියේ II/5 වන නියෝගය යටතේ නිල නොලත් නැවියකු සමත් නැව් තට්ටු මුහුදු යාත්‍රාකරුවකු ලෙස සමත් වීම සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(vi) STCW සම්මුතියේ III/5 වන නියෝගය යටතේ නිල නොලත් නැවියකු සමත් ඇංජින් කාමර මුහුදු යාත්‍රාකරුවකු ලෙස සමත් වීම සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(vii) STCW සම්මුතියේ III/6 වන නියෝගය යටතේ විද්‍යුත්-කාර්මික නිලධරයකු සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(viii) STCW සම්මුතියේ III/7 වන නියෝගය යටතේ විද්‍යුත්-කාර්මික නිල නොලත් නැවියකු සඳහා වන පුහුණුවේ කොටසක් වන;

(ix) STCW සම්මුතියේ IV/2 වන නියෝගය යටතේ ගුවන්විදුලි සේවක පිරිස සඳහා වන පුහුණුවේ කොටසක් වන; සහ

(x) STCW සම්මුතියේ VII වන නියෝගය යටතේ විකල්ප සහතිකයක් ලබා ගැනීම සඳහා වන පුහුණුවේ කොටසක් වන,

බව කාර්යයේ හෝ පිළිගත් පුහුණු වැඩසටහනේ නිශ්චිත ස්වභාවය මගින් නියම කරනු ලබන අවස්ථාවක, (1) වන අනු නියෝගයේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

(3) මේ නියෝගයේ "රාත්‍රී කාලය" යන්නෙන්-

(i) අනුගාමී පැය නවයකට නොඅඩු කාලසීමාවක්; සහ

(ii) (මෙරට වේලාවෙන්) මධ්‍යම රාත්‍රිය පසු නොවන වේලාවකින් ආරම්භ වී පෙ.ව. 5ට පෙර නොවන වේලාවකින් අවසන් වන කාලසීමාවක්,

අදහස් වේ.

(4) වයස අවුරුදු දහඅටට අඩු යම් තැනැත්තකු විසින්-

(අ) අධි-පීඩන පරිසරයක දී කිරීමට සිදුවන සහ මුහුදු යාත්‍රාකරුව අධි-පීඩන සහ අවපීඩන අවදානම්-වලට ලක්වීමට ඉඩ ඇති යම් කාර්යයක්;

(ආ) නෞකාස්ථ රෝගීන් රැකබලා ගැනීමට සම්බන්ධ හෝ එම රෝගීන් හා සම්බන්ධ වන යම් කාර්යයක්;

(ඇ) මුහුදු යාත්‍රාකරුව වෝල්ට් අගය 1000ට වැඩි විදුලි වෝල්ටීයතාවකට නිරාවරණය විය හැකි යම් කාර්යයක්;

(ඈ) මුහුදු යාත්‍රාකරුව-

(i) ඔහුගේ කොන්දෙ අමාරුවකට හේතු විය හැකි හෝ කොඳු ඇට පෙළට හානි විය හැකි කම්පනවලට; හෝ

(ii) අඩු- සංඛ්‍යාත කම්පනයකට,

නිරාවරණය විය හැකි යම් කාර්යයක්; හෝ

(ඉ) (i) IMDG සංග්‍රහයේ අන්තරාදායක භාණ්ඩ ලැයිස්තුවේ ලැයිස්තුගත යම් ද්‍රව්‍යයක්; හෝ

(ii) IBC සංග්‍රහයේ 17 වන පරිච්ඡේදයේ ලැයිස්තුගත යම් හානිකර ද්‍රවයක්,

පරිහරණය කිරීම සම්බන්ධ වන යම් කාර්යයක්,

සහ පනතේ 321අ වගන්තිය යටතේ නිකුත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් හි නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි යම් තැනැත්තකුගේ සෞඛ්‍යය හෝ ආරක්ෂාව අනතුරෙහි හෙළිය හැකි වෙනත් යම් කාර්යයක් සිදු කරනු නොලැබිය යුතු ය.

(5) (1) වන සහ (4) වන අනුනියෝග උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර එහි වරදකරු කරනු ලැබූ විට ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

5. (1) මුහුදු යාත්‍රාකරුවකු විසින් මුහුදේ දී සිදු කිරීමට නියමිත රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා ඔවුන් වෛද්‍යමය වශයෙන් යෝග්‍ය වන බව සහතික කරන වලංගු වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් දරන අවස්ථාවක දී හැර, නෞකා අයිතිකරුවකු විසින් මුහුදු යාත්‍රාකරුවන්ට නැව්වල රාජකාරි කිරීමට අවසර නොදිය යුතු ය.

(2) සංශෝධිත පරිදි STCW සම්මුතියේ නියමයන්ට අනුකූලව මුහුදු යාත්‍රාකරුවකු වෙත නිකුත් කරන ලද වලංගු වෛද්‍ය යෝග්‍යතා සහතිකයක්, (1) වන අනුනියෝගයේ සඳහන් අවශ්‍යතා සපුරාලීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) වලංගු වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් නිකුත් කරනු ලැබුවේ යම් මුහුදු යාත්‍රාකරුවකු වෙත ද එම මුහුදු යාත්‍රාකරු විසින්, එම සහතිකය ඔහු නෞකාවේ සේවය කරන කාලසීමාව අතරතුර නෞකාස්ථව රැගෙන යා යුතු ය.

(4) (1) වන අනුනියෝගය යටතේ නිකුත් කරන ලද වෛද්‍ය යෝග්‍යතා සහතිකයෙහි-

(අ) ඉටු කළ යුතු රාජකාරිය සඳහා වර්ණ දෘෂ්ටිය අවශ්‍යතාවක් වන අවස්ථාවක දී, මුහුදු යාත්‍රාකරුගේ ශ්‍රවනය, පෙනීම සහ වර්ණ දෘෂ්ටිය යන සියල්ලම සතුටුදායක වන බව සඳහන් කළ යුතු ය; සහ

(ආ) මුහුදු යාත්‍රාකරු, මුහුදු සේවය හේතුවෙන් උග්‍ර විය හැකි හෝ ඔහුව මුහුදු සේවය සඳහා නුසුදුසු කරන්නා වූ හෝ නෞකාස්ථ තැනැත්තන්ගේ සෞඛ්‍යය අනතුරට හෙළන්නා වූ යම් වෛද්‍යමය තත්ත්වයකින් නොපෙළෙන බව සඳහන් කළ යුතු ය.

(5) (අ) (1) වන අනුනියෝගයේ සඳහන් වෛද්‍ය යෝග්‍යතා සහතිකය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත වෛද්‍ය වෘත්තිකයකු විසින් හෝ නෞකාව විසින් දරනු ලබන ධජය අයත් රාජ්‍යය විසින් අනුමත වෛද්‍ය වෘත්තිකයකු මගින් පමණක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) හුදෙක්ම දෘෂ්ටිය පිළිබඳ සහතිකයක් වන අවස්ථාවක දී, එම සහතිකය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අනුමත තැනැත්තකු විසින් හෝ නෞකාව විසින් දරනු ලබන ධජය අයත් රාජ්‍යය විසින් අනුමත එවැනි සහතිකයක් නිකුත් කිරීමට සුදුසුකම් ලබන තැනැත්තකු විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ඇ) වෛද්‍ය වෘත්තිකයන් විසින්, වෛද්‍ය පරීක්ෂණ පිළිබඳ කාර්ය පටිපාටි භාරගැනීමේ දී ඔවුන්ගේ වෛද්‍ය මතය ක්‍රියාත්මක කිරීමේ දී සම්පූර්ණ වෘත්තිමය නිදහස භුක්ති විඳිය යුතු ය.

(6) අනුමත වෛද්‍ය වෘත්තිකයන් සහ මුහුදු යාත්‍රාකරන අපේක්ෂකයන්ගේ සහ සේවයේ යෙදී සිටින මුහුදු යාත්‍රා කරුවන්ගේ වෛද්‍ය යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීමට සම්බන්ධ වෙනත් සියලුම තැනැත්තන් විසින්, යම් පසු සංස්කරණ ඇතුළු මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන පෙර මුහුදු සහ වරින්වර පැවැත්වෙන වෛද්‍ය යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) මාර්ගෝපදේශ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO), ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) හෝ ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් පළ කරන ලද වෙනත් යම් අදාළ ජාත්‍යන්තර මාර්ගෝපදේශ අනුගමනය කරනු ලැබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, වෛද්‍ය වෘත්තිකයන් අනුමත වෛද්‍ය වෘත්තිකයන් ලෙස පිළිගැනීම සඳහා විධිවිධාන පනවනු ලැබිය යුතු අතර එම වෛද්‍ය වෘත්තිකයන් සඳහා අධීක්ෂණය කිරීමේ සහ ඇගයීමේ විධිවිධාන පනවනු ලැබිය යුතු ය.

(8) මුහුදු යාත්‍රාකරුවකුගේ වැඩ කිරීමේ හැකියාව මත විශේෂයෙන් ම කාලය, වැඩ ක්ෂේත්‍රය හෝ වෙළඳ ප්‍රදේශය සම්බන්ධයෙන් පනවන ලද සීමා කිරීම් සහිත වෛද්‍ය සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවක දී හෝ අනුමත වෛද්‍ය වෘත්තික-යකු විසින් මුහුදු යාත්‍රාකරු වෙත වෛද්‍ය සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක දී රජයේ විශේෂ වෛද්‍ය උපදේශකවරයකු විසින් මුහුදු යාත්‍රාකරුව පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය.

(9) මුහුදු යාත්‍රාකරුවකු විසින් සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයකුගෙන් වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් ලබා ගත හැකි අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, හදිසි අවස්ථාවන් හි දී මුහුදු යාත්‍රාකරුට නැව ඊළඟ වරායට සේන්දු වන තෙක් වලංගු වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් නොමැතිව සේවය කිරීමට අවසර දෙනු ලැබිය හැකි ය. එසේ වුව ද-

(අ) එම අවසර දීමේ කාල පරිච්ඡේදය මාස තුනක් නොඉක්මවිය යුතු ය; සහ

(ආ) මුහුදු යාත්‍රාකරු සතුව ආසන්න දිනයක දී කල් ඉකුත් වූ වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් තිබිය යුතු ය.

(10) වෛද්‍ය යෝග්‍යතා සහතිකයක වලංගු කාලය යම් මුහුදු ගමනක ගමන් කාලය අතරතුර දී අවසන් වන අවස්ථාවක, මුහුදු යාත්‍රාකරුවකු විසින් සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයකුගෙන් වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් ලබා ගත හැකි අවස්ථාවක දී, නැව ඊළඟ වරායට සේන්දු වන තෙක් වෛද්‍ය යෝග්‍යතා සහතිකය වලංගුව පවතිනු ඇත. එසේ වුවද, එම කාල පරිච්ඡේදය මාස තුනක් නොඉක්මවිය යුතු ය.

(11) අදාළ මුහුදු යාත්‍රාකරු විසින් සිදුකළ යුතු නිශ්චිත රාජකාරි හේතුවෙන් හෝ STCW සම්මුතිය යටතේ හෝ කෙටි කාල පරිච්ඡේදයක් අවශ්‍ය වන අවස්ථාවක දී හැර,

(අ) වෛද්‍ය යෝග්‍යතා සහතිකයක් අවුරුදු දෙකක උපරිම කාලයක් සඳහා වලංගු විය යුතු නමුත් මුහුදු යාත්‍රාකරු වයස අවුරුදු දහඅටට අඩු වන්නේ නම් හෝ වයස අවුරුදු පනස් පහට වැඩි වන්නේ නම්, එවිට උපරිම වලංගු කාලය එක් අවුරුද්දක් විය යුතු ය;

(ආ) වර්ණ දෘෂ්ටිය පිළිබඳ සහතිකයක් අවුරුදු හයක කාල පරිච්ඡේදයක් සඳහා වලංගු විය යුතු ය.

(12) මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර එහි වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

6. (1) යම් මුහුදු යාත්‍රාකරුවකු-

(අ) නෞකාස්ථ පෞද්ගලික ආරක්ෂාව සඳහා වන පුහුණුව සාර්ථකව අවසන් කර ඇති අවස්ථාවක දී හැර; සහ

(ආ) මුහුදු යාත්‍රාකරුගේ කාර්ය ඉටු කිරීම සඳහා නිපුණත්වය ඇති හෝ අන්‍යාකාරයෙන් සුදුසුකම් ලත් තැනැත්තකු ලෙස පුහුණු කරනු ලැබූ හෝ සහතික කරනු ලබන අවස්ථාවක දී හැර,

ඔහුට නැවක රාජකාරි කිරීමට අවසර නොදිය යුතු ය.

(2) මේ නියෝගයේ (1) වන අනුනියෝගයේ සඳහන් පුහුණු කිරීමේ සහ සහතික කිරීමේ අවශ්‍යතා STCW සම්මුතියට අනුකූල විය යුතු ය.

7. (1) මේ නියෝගය යටතේ යම් තැනැත්තකු ශ්‍රී ලංකාවේ හෝ විදේශ නැවක සේවා යෝජකයකු හෝ නැවේ අයිතිකරු වෙනුවට යම් මුහුදු යාත්‍රාකරුවකු බඳවා ගැනීම හා පත් කිරීම සම්බන්ධයෙන් වන ව්‍යාපාරයක්, ඍජුව හෝ වක්‍රව, ශ්‍රී ලංකාවේ දී පවත්වාගෙන යාම සඳහා ලියාපදිංචි හා සහතික ලත් තැනැත්තකු වන්නේ නම් මිස, එවැනි ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ නෞකා හෝ විදේශ ධජය දරන නෞකා සඳහා ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරුවන් සැපයීම සඳහා ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකු විසින්, සම්මුතියේ A 1.4 හි දක්වා ඇති ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය.

(3) මුහුදු යාත්‍රාකරුවකු ශ්‍රී ලංකාවේ නෞකාවක සේවයේ යෙදවීමට අපේක්ෂා කරන තැනැත්තකු විසින්-

(අ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සහ ශ්‍රී ලංකාවේ පුරවැසියන් මුහුදු යාත්‍රාකරුවන් ලෙස සපයන මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකුගෙන් මුහුදු යාත්‍රාකරුවකු තෝරා ගත යුතු ය;

(ආ) සම්මුති රාජ්‍යය තුළ ක්‍රියාත්මක මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකුගෙන් මුහුදු යාත්‍රාකරුවකු තෝරාගත යුතු ය; හෝ

(ඇ) සම්මුති රාජ්‍යය තුළ ක්‍රියාත්මක නොවන සම්මුතියේ 1.4 වන නියෝගයේ සහ A 1.4 වන ප්‍රමිතියේ නියමයන්ට අනුකූල වන මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකුගෙන් මුහුදු යාත්‍රාකරුවකු තෝරා ගත යුතු ය.

(4) (අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලය ලබා දීමේ සහතිකයක බලය යටතේ හැර යම් තැනැත්තකු විසින් මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවයේ නිරත නොවිය යුතු ය.

(ආ) මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවයේ නිරත වීමට අපේක්ෂා කරන තැනැත්තකු විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ ඉල්ලුම් පත්‍රයක් ලැබීමෙන් පසු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රයේ ඇතුළත් කරුණු සලකා බලා, මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවය ස්ථාපිත කිරීම සඳහා බලය ලබා දීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය, නැතහොත් ඔහු විසින් බලය ලබා දීමේ සහතිකයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වාර්තා කරනු ලැබිය යුතු ය.

(ඈ) එම බලය ලබා දීමේ සහතිකය, පෙරාතුව ප්‍රත්‍යාදිෂ්ට කර, අත්හිටුවා හෝ ආපසු ගෙන ඇත්නම් මිස, (6) වන උප-නියෝගයට යටත්ව, එය නිකුත් කරන ලද දින සිට වසර පහක කාලයක් සඳහා වලංගු විය යුතු අතර එහි නිශ්චිතව දක්වා ඇති නියම හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(5) මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකු විසින්-

(අ) මුහුදු යාත්‍රාකරුවන් විසින් සුදුසුකම් ලබන රැකියා ලබා ගැනීම වැළක්වීමට හෝ ඊට බාධා කිරීමට අදහස් කරන ක්‍රම, යාන්ත්‍රණ හෝ ලැයිස්තු භාවිතා නොකළ යුතු ය;

(ආ) නෞකාවේ අයිතිකරු විසින් දැරිය යුතු වීසා බලපත්‍රවල වියදම ඇතුළත් නොවන, වෛද්‍ය යෝග්‍යතා සහතිකය, අඛණ්ඩ නිදහස් කිරීමේ සහතිකය සහ විදේශ ගමන් බලපත්‍රය හෝ ඊට සමාන වෙනත් පුද්ගලික ගමන් කිරීමේ ලේඛනයක් ලබා ගැනීමේ දී මුහුදු යාත්‍රාකරු විසින් දැරිය යුතු වියදම හැර, මුහුදු යාත්‍රාකරු විසින් සම්පූර්ණයෙන් හෝ කොටසක් ලෙස සෘජුව හෝ වක්‍රව දැරිය යුතු ගාස්තු හෝ වෙනත් අය කිරීම් පනවනු නොලැබිය යුතු ය;

(ඇ) සේවාව හරහා බඳවා ගන්නා ලද හෝ පත් කරන ලද සියලුම මුහුදු යාත්‍රාකරුවන් පිළිබඳ යාවත්කාලීන රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු අතර එය අධ්‍යක්ෂ-ජනරාල්වරයා හට පරීක්ෂා කළ හැකි වන ලෙස තැබිය යුතු ය;

(ඈ) සේවයේ යෙදවීමට පෙරාතුව හෝ සේවයේ යොදවන අතරතුර මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුම් යටතේ ඔවුන්ගේ අයිතීන් සහ කාර්යයන් පිළිබඳ ඔවුන් දැනුවත් වී සිටින බවට සහ ඔවුන් විසින් රැකියා ගිවිසුම් අත්සන් කිරීමට පෙර සහ පසු ඔවුන්ගේ රැකියා ගිවිසුම් පරීක්ෂා කිරීමට සහ ගිවිසුම්වල පිටපතක් ලබා ගැනීමට සුදුසු වැඩපිළිවෙලවල් සිදු කර ඇති බවට සහතික විය යුතු ය;

(ඉ) සේවා සපයන්නා විසින් බඳවා ගන්නා ලද හෝ පත් කරන ලද මුහුදු යාත්‍රාකරුවන් සුදුසුකම් ලත් තැනැත්තන් වන බව හා අදාළ රැකියාව සඳහා අවශ්‍ය ලේඛන ඔවුන් සතු බව සහ මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුම්, මේ නියෝගවලට සහ නැවේ ධජය අයත් රාජ්‍යයේ නියෝගවලට සහ රැකියා ගිවිසුමේ කොටසක් වන යම් සාමූහික කේවල් කිරීමේ ගිවිසුමකට අනුකූල විය යුතු බවට සත්‍යාපනය කරනු ලැබිය යුතු ය;

(ඊ) නෞකාවේ අයිතිකරු විසින්, නැව විදේශීය වරායක අතරමං වීමක දී නැවේ සිටින මුහුදු යාත්‍රාකරුවන් ආරක්ෂා කර ගැනීමේ ක්‍රම ඔහු සතු වන බවට හැකිතාක් ප්‍රායෝගිකව, සහතික විය යුතු ය;

(උ) බඳවා ගැනීමේ ක්‍රියාවලියේ දී මුහුදු යාත්‍රාකරුවකු විසින් දැරීමට අපේක්ෂිත යම් වියදම් පිළිබඳ පළ කරනු ලැබිය යුතු ය;

(ඌ) මුහුදු යාත්‍රාකරුවන් මුහුදු සේවයේ යෙදී සිටිය දී, ඔවුන්ගේ පවුල්වල අය මුහුදු යාත්‍රාකරුවන් පිළිබඳ තොරතුරු හෝ යම් උපදෙස් සඳහා වන ඉල්ලීම් ක්ෂණිකව සහ සානුකම්පිතව සහ කිසිදු වියදමකින් තොරව සිදුවන බවට සහතික විය යුතු ය;

(එ) ඔවුන් විසින් මුහුදු යාත්‍රාකරුවන්ට ලබා දෙන නැව්වල යාවත්කාලීන ලැයිස්තු පවත්වාගෙන යා යුතු අතර හදිසි අවස්ථාවක දී ඕනෑම වේලාවක මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවය සම්බන්ධ කර ගත හැකි ක්‍රමයක් ඇති බවට සහතික විය යුතු ය;

(ඒ) එහි කළමනාකරණය සහ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් ලෙස පුහුණුවීම් ලබා ඇති බවට සහ මෙම සන්දර්භයේ දී ඔවුනට පවරනු ලබන රාජකාරිවල ප්‍රමාණයට සමුද්‍රීය කර්මාන්තය පිළිබඳ අදාළ දැනුම ඔවුන් සතුවන බවට සහතික විය යුතු ය;

(ඔ) යම් තුවාලයකට (සුළු තුවාල හැර) හෝ මරණයකට, අතුරුදහන්වීමකට, නැතිවීමකට හෝ ශ්‍රී ලංකාවේ ජාතිකයකු විසින් කරන ලද මිනීමැරුමකට හෝ ඔහුව ඝාතනය කිරීමකට හේතුවන නෞකාස්ථ යම් සිදුවීමක් හෝ අහඹු අවස්ථාවක් පිළිබඳ තොරතුරු ලැබුණු පසු හැකිතාක් ඉක්මණින් එනම්, පැය විසිහතරක් ගතවීමට පෙර ඒ බව අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත වාර්තා කළ බවට සහතික විය යුතු ය;

(ඕ) රැකියාව සඳහා ඉදිරිපත් කරන ලද සියලුම අනිවාර්ය සහතික සහ ලේඛන යාවත්කාලීනව පවතින බවට සහ වංචනික ලෙස ලබාගත් ඒවා නොවන බවට සහ රැකියා යොමු සත්‍යාපනය කර ඇති බවට සහතික විය යුතු ය;

(ක) මුහුදු යාත්‍රාකරුවන්, යම් නිශ්චිත නෞකාවල හෝ නිශ්චිත සමාගම් විසින් සේවයේ යෙදවීම පිළිබඳ අර්පණයට අදාළව ඔවුන්ගේ සේවක පිරිස විසින් සූරාකෑමට යටත් නොවන බවට සහතික විය යුතු ය;

(ග) මුහුදු යාත්‍රාකරුවන් යෙදවීමට නියමිත රැකියාවලට අදාළ යම් නිශ්චිත කොන්දේසි පිළිබඳ සහ නිශ්චිත නෞකා අයිතිකරුවන් පිළිබඳ සහ ඔවුන්ගේ රැකියාවට අදාළ ප්‍රතිපත්ති පිළිබඳ ඔවුන් දැනුවත් කර ඇති බවට සහතික විය යුතු ය;

(ච) මරණ වන්දි ගෙවීම හෝ ආබාධිත බවට වන්දි ගෙවීම නෞකාවේ අයිතිකරු විසින් අනිසි ප්‍රමාදයකින් තොරව සිදුකරවා ගැනීමට උත්සාහ කළ යුතු ය;

(ජ) (i) මුහුදු යාත්‍රාකරුවන් පත් කරනු ලබන විට, නැව්වල දී කම්කරු කොන්දේසි, නෞකා අයිතිකරුවකු සහ නියෝජිත මුහුදු යාත්‍රාකරුවන්ගේ සංවිධානය අතර අවසන් වූ අදාළ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම්වලට අනුකූල වන බවට සත්‍යාපනය කිරීම සඳහා; සහ

(ii) ප්‍රතිපත්තියේ සඳහන් කරුණක් ලෙස, මේ නියෝගවලට හෝ සාමූහික ගිවිසුම්වලට අනුකූල වන මුහුදු යාත්‍රාකරුවන් සඳහා රැකියාවේ නියම හා කොන්දේසි ප්‍රදානය කරන නෞකා අයිතිකරුවන් වෙත පමණක් මුහුදු යාත්‍රාකරුවන් සැපයීම සඳහා,

කාර්ය පටිපාටි තිබිය යුතු ය;

(ට) අශක්නුතාව හෝ විනය නොමැතිකම පිළිබඳ අවස්ථා සමග කටයුතු කරන අතරතුර, අනුගමනය කරන ලද කාර්ය පටිපාටි, ස්වභාවික නීතියේ මූලධර්මවලට, රටේ නීතිය සහ එහි භාවිතයට, සහ අදාළ වන ඕනෑම අවස්ථාවක සාමූහික කේවල් කිරීමේ ගිවිසුම්වලට අනුකූල වන බවට සහතික විය යුතු ය;

(ඩ) මේ නියෝග යටතේ ප්‍රදානය කරන ලද බලය ලබාදීමේ සහතිකයෙහි පිටපතක්, බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා පරිශ්‍රයේ මහජනයාට ප්‍රවේශ විය හැකි ස්ථානයක කැපී පෙනෙන ලෙස ප්‍රදර්ශනය කර ඇති බවට සහතික විය යුතු ය;

(ණ) බලය ලබා දීමේ සහතිකය වාර්ෂිකව සත්‍යාපනය කිරීම සඳහා එය නියමිතව තිබූ දිනට මාස තුනකට පෙර සහ ඒ සඳහා සූදානම් වී සිටින ලෙස අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත සිහි කැඳවීමක් යවනු ලබන බවට සහතික විය යුතු ය;

(ත) සේවාවෙහි කටයුතුවලට අදාළව සිදු කරන ලද යම් පැමිණිලි පරීක්ෂා කර බලා ඒවාට ප්‍රතිචාර දැක්විය යුතු අතර නොවිසඳන ලද යම් පැමිණිලි පිළිබඳ අධ්‍යක්ෂ-ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය; සහ

(ද) (i) බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවාව මගින් මුහුදු යාත්‍රාකරුගේ බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස; හෝ

(ii) මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුම යටතේ, නෞකාවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රා කරුගේ බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස,

මුහුදු යාත්‍රාකරු විසින් දරනු ලැබිය හැකි මුල්‍ය හානිය වෙනුවෙන් මුහුදු යාත්‍රාකරුවකුට වන්දි ගෙවීම සඳහා (11) වන අනුනියෝගයේ නියම කර ඇති පරිදි බැංකු ඇපකරයක් මගින් ආරක්ෂණ ක්‍රමයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(6) (අ) අදාළ සේවාව මගින් මේ නියෝගයේ සඳහන් නියම සහ ශ්‍රී ලංකාවේ නීතියේ වෙනත් යම් අදාළ නියම සපුරාලන බව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පළමු වරට පත්වනු ලබන සත්‍යාපනයෙන් පසුව පමණක් මේ නියෝගයේ (4) වන අනු-නියෝගයේ සඳහන් බලය ලබා දීමේ සහතිකය නිකුත් කරනු ලැබිය යුතු ය.

(ආ) බලය ලබා දීමේ සහතිකය, සංවත්සර දිනයට පෙර සහ පසු මාස තුනක් ඇතුළත නිකුත් කිරීමේ බලධරයා විසින් පවත්වනු ලබන වාර්ෂික සත්‍යාපනයට යටත් විය යුතු ය. ඉහත සඳහන් කාල රාමුව ඇතුළත කිසිඳු වාර්ෂික සත්‍යාපනයක් පවත්වනු නොලබන්නේ නම්, බලය ලබා දීමේ සහතිකය වලංගු නොවන අතර පළමු වරට පවත්වනු ලබන සත්‍යාපනයකින් පසු අලුත් බලය ලබාදීමේ සහතිකයක් ලබා ගත යුතු ය. මේ නියෝගයේ අනුකූලත්වය සහතික කිරීම සඳහා වන ලේඛන සත්‍යාපනය ඇතුළු මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නාගේ සාමාන්‍ය පරීක්ෂාවක්, වාර්ෂික සත්‍යාපනයට ඇතුළත් විය යුතු ය.

(ඇ) මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකු මේ නියෝගයේ යම් විධිවිධානයකට අනුකූල වීමට අපොහොසත් වී ඇති බව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් සෑහීමකට පත්වන්නේ නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දීමෙන් පසු, බලය ලබාදීමේ සහතිකය අත්හිටුවීම හෝ ආපසු ගැනීම කරනු ලැබිය හැකි ය.

(ඈ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, බලය ලබාදීමේ සහතිකයක් නිකුත් කිරීමට හෝ නැවත අලුත් කිරීමට සහ ආරම්භක සහ වාර්ෂික සත්‍යාපනයන් පැවැත්වීමට අපේක්ෂා කරන යම් තැනැත්තකුගෙන් ගාස්තුවක් අයකරනු ලැබිය හැකි ය.

(ඉ) බලය ලබාදීමේ සහතිකය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතියකින් තිබිය යුතු ය.

(7) (අ) මුහුදු යාත්‍රාකරුවන්ගේ-

(i) සුදුසුකම්;
(ii) රැකියා වාර්තාව;
(iii) රැකියාවට අදාළ පෞද්ගලික දත්ත; සහ
(iv) රැකියාවට අදාළ වෛද්‍ය දත්ත,

මේ නියෝගයේ (5) වන අනු-නියෝගයේ (ඇ) ඡේදයේ සඳහන් රෙජිස්ටරයෙහි ඇතුළත් විය නමුත් ඒවාට සීමා නොවිය යුතු අතර මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවාව මගින් යම් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකු වෙත සපයන ලද සියලුම මුහුදු යාත්‍රාකරුවන් පිළිබඳ සියලු සහ සම්පූර්ණ වාර්තා එහි අන්තර්ගත විය යුතු ය.

(ආ) රෙජිස්ටරය ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් තබාගත හැකි ය, එසේ වුවද, එසේ වාර්තා කරන ලද තොරතුරු පහසුවෙන් කියවිය හැකි ආකාරයට නැවත ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) පෞද්ගලිකත්වය පිළිබඳ අයිතිය සහ රහස්‍යභාවය ආරක්ෂා කිරිමේ අවශ්‍යතාව සඳහා නිසි සැලකිල්ල ලබා දෙමින් රෙජිස්ටරය පවත්වාගෙන යා යුතු ය.

(ඈ) රෙජිස්ටරය සාදනු ලැබූ දින සිට යටත් පිරිසෙයින් අවුරුද්දක කාලසීමාවක් සඳහා සහ මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නා විසින් අවසන්වරට යම් අපේක්ෂකයකු වෙත සේවාව ලබා දුන් දිනයෙන් පසු යටත් පිරිසෙයින් අවුරුද්දක කාල සීමාවක් සඳහා රෙජිස්ටරය තබා ගත යුතු ය.

(8) අවශ්‍ය වන්නේ නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා කටයුතුවලට අදාළ පැමිණිලි පිළිබඳ විමර්ශනය කරනු ලැබිය යුතු ය.

(9) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය ලත් යම් නිලධරයකු විසින්, මේ නියෝගයේ කාර්ය සඳහා, යම් අවස්ථාවක-

(අ) යම් මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකුගේ යම් පරිශ්‍රයකට ඇතුළු වී පරීක්ෂා කරනු ලැබිය හැකි ය;

(ආ) යම් නැවකට, මුහුදු යාත්‍රාකරුවකුට හෝ මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකුට අදාළ යම් පොතක්, සහතිකයක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට නියම කිරීම සහ බලගැන්වීම කළ හැකි ය; සහ

(ඇ) යම් තැනැත්තකු තමා ඉදිරියට කැඳවා ප්‍රශ්නවලට පිළිතුරු දෙන ලෙස ඔහුට නියම කරනු ලැබිය හැකි ය.

(10) (අ) බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නා විසින් සෑම අනුප්‍රාප්තික මාසයක ම පළමුවන දින වන විට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතියකින් මාසික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) බඳවා ගැනීමේ හා පත්කිරීමේ සේවා සපයන්නා විසින් නිශ්චිත කාලසීමාව තුළ (අ) ඡේදයේ සඳහන් වාර්තාව සැපයීමට අපොහොසත් වන්නේ නම්, මේ නියෝගය යටතේ නිකුත් කරන ලද බලය ලබාදීමේ සහතිකය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අත්හිටුවීම, අහෝසි කිරීම හෝ ආපසු ගැනීම කළ හැකි ය.

(11) (අ) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ සහ පත්කිරීමේ සේවා සපයන්නකු විසින්, පහත දැක්වෙන වගුවට අනුව අධ්‍යක්ෂ-ජනරාල්වරයාට පක්ෂව බැංකු ඇපකරයක් ලබා දිය යුතු යː-

| *අනුක්‍රමික අංකය* | *විදේශීය නැවකට පත්කරන ලද මුහුදු යාත්‍රාකරුවන්ගේ සංඛ්‍යාව* | *බැංකු ඇපකරයේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින්* |
|---|---|---|
| 1 | 50 ක් දක්වා | මිලියන 1.5 |
| 2 | 51-250 | මිලියන 2.5 |
| 3 | 251-500 | මිලියන 3 |
| 4 | 501 ක් සහ ඊට වැඩි | මිලියන 5 |

(ආ) බැංකු ඇපකරය ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවකින් ලබාගත යුතු ය.

(ඇ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියම කරන ලද බැංකු ඇපකරයක කාලසීමාව දෙන ලද ඕනෑම අවස්ථාවක, අවුරුද්දක කාලසීමාව නොඉක්මවිය යුතු ය.

(ඈ) රැකියා සංඛ්‍යාවේ යම් වෙනසක් වන අවස්ථාවක, බඳවා ගැනීමේ හා පත්කිරීමේ සේවා සපයන්නා විසින් ඉල්ලුම් පත්‍රය සමග අවශ්‍ය බැංකු ඇපකරය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(12) බැංකු ඇපකරය මගින් පහත දැක්වෙන කරුණු ආවරණය කළ යුතු යः-

(අ) යෝග්‍ය හා කඩිනම් ක්‍රමයකට, සාමාන්‍යයෙන් ගුවනින්, ගමන් කිරීමේ වියදම සහ මුහුදු යාත්‍රාකරු සිය නිවසට පැමිණෙන තෙක් ඔහුගේ ආහාර, ඇඳුම් පැළඳුම්, නවාතැන් සැපයීමේ වියදම්, අවශ්‍ය වෛද්‍ය උවටැන්, පුද්ගලික ගමන් හා ප්‍රවාහන වියදම්, මුහුදු යාත්‍රාකරුවකු මරණයට පත් වූ විට ඔහුගේ දේහය ප්‍රවාහනය කිරීමේ වියදම් ඇතුළු අතරමං වූ මුහුදු යාත්‍රාකරුවකු සිය රටට යැවීමේ වියදම්;

(ආ) යෝග්‍ය හා කඩිනම් ක්‍රමයකට, සාමාන්‍යයෙන් ගුවනින්, ගමන් කිරීමේ වියදම සහ ආහාර, ඇඳුම් පැළඳුම්, පානීය ජල සැපයුම, නෞකාස්ථ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය ඉන්ධන, නැව පිටත් වන අවස්ථාවේ සිට මුහුදු යාත්‍රාකරු සිය නිවසට පැමිණෙන තෙක් ඔවුන්ගේ නවාතැන් සඳහා වන වියදම් ඇතුළු අත්හැර දැමූ මුහුදු යාත්‍රාකරුවකු සිය රටට යැවීමේ වියදම් සහ මුහුදු යාත්‍රාකරු නිවසට පැමිණෙන තෙක් අත්හැර දැමීමට හේතුවන ක්‍රියාව හෝ පැහැර හැරීම නිසා දැරීමට සිදුවූ වෙනත් යම් සාධාරණ වියදම් හෝ ගාස්තු;

(ඇ) බඳවා ගැනීමේ සහ පත් කිරීමේ සේවය හෝ අදාළ නෞකාවේ අයිතිකරු විසින්, මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුම හෝ අදාළ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම යටතේ, මුහුදු යාත්‍රාකරුගේ බැඳීම් ඉටු කිරීමට අපොහොසත් වීමේ ප්‍රතිඵලයක් ලෙස නෞකාවේ අයිතිකරු විසින් දරනු ලැබිය හැකි, ඔහු විසින් මුහුදු යාත්‍රාකරුට ගෙවිය යුතු නොගෙවූ වේතන සහ වෙනත් හිමිකම් ඇතුළු යම් මූල්‍ය හානි.

(13) නෞකා අයිතිකරුවන් හෝ සේවා යෝජකයා සහ බඳවා ගැනීමේ හා පත්කිරීමේ සේවය අතර ඇතිවූ ගිවිසුමේ හෝ කොන්ත්‍රාත්තුවේ යම් වෙනසක් සිදුවන්නේ නම්, බඳවා ගැනීමේ සහ පත් කිරීමේ සේවා සපයන්නා විසින්, ගිවිසුමේ පිටපතක් සමග, අවස්ථාවෝචිත පරිදි, අවශ්‍ය බැංකු ඇපකරය සමග අධ්‍යක්ෂ-ජනරාල්වරයාට ඒ බව දැනුම් දිය යුතු ය.

(14) බඳවා ගැනීමේ සහ පත්කිරීමේ සේවා සපයන්නා විසින්, ගිවිසුමේ සිදුවන යම් වෙනසක් පිළිබඳ, එකී වෙනස සිදුවූ දින සිට දින හතක් ඇතුළත අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත දැනුම් දිය යුතු අතර එසේ දැනුම්දීමට අපොහොසත් වුවහොත් බඳවා ගැනීමේ සහ පත්කිරීමේ සේවා සපයන්නා වෙත නිකුත් කරන ලද බලය ලබාදීමේ සහතිකය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අත්හිටුවීම, අහෝසි කිරීම හෝ ආපසු ගැනීම කළ හැකි ය.

(15) (1) වන සහ (3) වන අනු-නියෝග උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර එහි වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයකයට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම යටත් විය යුතු අතර දෙවන වරට හෝ ඉන්පසු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

## III වන කොටස

### *රැකියා කොන්දේසි*

8. (1) යම් තැනැත්තකු සතුව, තමා සහ නෞකාවේ අයිතිකරු හෝ නෞකාවේ අයිතිකරුගේ නියෝජිතයකු විසින් අත්සන් කරන ලද මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුමක් තිබේ නම් මිස, කිසිඳු තැනැත්තකු විසින් මුහුදු යාත්‍රාකරුවකු ලෙස නෞකාස්ථව රාජකාරි නොකළ යුතු ය.

(2) මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුම අත්සන් කරන මුහුදු යාත්‍රාකරුවන්ට, එය අත්සන් කිරීමට පෙර, ගිවිසුම පරීක්ෂා කර ඒ සම්බන්ධයෙන් උපදෙස් ලබාගැනීමට සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම් පිළිබඳ ප්‍රමාණවත් අවබෝධයක් ඇතිව සැහැල්ලුවෙන් ගිවිසුමට එළඹ ඇති බවට වගබලා ගැනීමට අවශ්‍ය වෙනත් පහසුකම් ලබාදිය යුතු බවට නෞකාවේ අයිතිකරු, නෞකාධිපතිවරයා හෝ නැවක සේවය කරන මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින් සහතික විය යුතු ය.

(3) නෞකාවේ අයිතිකරුට සහ අදාළ මුහුදු යාත්‍රාකරුට මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුමේ අත්සන් කරන ලද මුල් පිටපතක් බැගින් තිබිය යුතු ය.

(4) නැවට අදාළව මුහුදු යාත්‍රාකරුගේ එක් එක් රැකියා ගිවිසුම්වල පැහැදිලි, පහසුවෙන් කියවිය හැකි පිටපතක් ද ඇතුළු රැකියා කොන්දේසි පිළිබඳ තොරතුරු නෞකාස්ථව පහසුවෙන් ලබාගත හැකි බවටත් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ යාමට නියමිත වරායන්හි වරාය තත්ත්ව අධිකාරීන් ඇතුළු එසේ දැනුම් දෙන ලද වෙනත් යම් අය විසින් සමාලෝචනය කිරීම සඳහා එම තොරතුරු වෙත ප්‍රවේශ විය හැකි බවටත් නෞකාවේ අයිතිකරු, නෞකාධිපතිවරයා සහ නැවක සේවය කරන මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින් සහතික විය යුතු ය.

(5) සාමූහික කේවල් කිරීමේ ගිවිසුමක් මගින් යම් මුහුදු යාත්‍රාකරුවකුගේ සම්පූර්ණ රැකියා ගිවිසුම හෝ එහි කොටසක් සාදනු ලබන අවස්ථාවක, එම ගිවිසුමේ පිටපතක් නෞකාවෙහි තිබෙන බවට නෞකාවේ අයිතිකරු, නෞකාධිපතිවරයා සහ නැවක සේවය කරන මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින් සහතික විය යුතු ය.

(6) සියලුම මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුම්වල පහත දැක්වෙන කරුණු සෑම අවස්ථාවක දී ම ඇතුළත් විය යුතු යඃ-

(අ) මුහුදු යාත්‍රාකරුවන්ගේ සම්පූර්ණ නම, උපන්දිනය හෝ වයස සහ උපන් ස්ථානය;

(ආ) නෞකාවේ අයිතිකරුගේ නම සහ ලිපිනය;

(ඇ) මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුමට එළඹුණු ස්ථානය සහ දිනය;

(ඈ) මුහුදු යාත්‍රාකරුව සේවයේ යෙදවීමට ඇති හැකියාව;

(ඉ) මුහුදු යාත්‍රාකරුගේ වේතන ප්‍රමාණය හෝ අදාළ වන විට, එය ගණනය කිරීම සඳහා භාවිත කරන ලද සූත්‍රය;

(ඊ) වැටුප් සහිත වාර්ෂික නිවාඩු ගණන හෝ අදාළ වන විට, එය ගණනය කිරීම සඳහා භාවිත කරන ලද සූත්‍රය;

(උ) ගිවිසුම අවසන් කිරීම සහ,

(i) අවිනිශ්චිත කාලසීමාවක් සඳහා ගිවිසුම යොදා ඇත්නම්, එය අවසන් කිරීමට කුමන හෝ පාර්ශ්වයකට හිමි කොන්දේසි මෙන්ම නියමිත දැනුම්දීමේ කාලසීමාව, මුහුදු යාත්‍රාකරුට වඩා නෞකාවේ අයිතිකරුට අඩු නොවිය යුතු බව;

(ii) නිශ්චිත කාලසීමාවක් සඳහා ගිවිසුම සාදා ඇත්නම්, එහි කාලය ඉකුත්වීමට නියමිත දිනය; සහ

(iii) මුහුදු ගමනක් සඳහා ගිවිසුම සාදා ඇත්නම්, ගමනාන්ත වරාය සහ එම වරායට පැමිණීමෙන් පසු, මුහුදු යාත්‍රාකරුව වගකීමෙන් නිදහස් කිරීමට පෙර ඉකුත්වීමට ඇති කාලසීමාව,

යන කරුණු ඇතුළත් ගිවිසුමේ කොන්දේසි;

(ඌ) නෞකාවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරු වෙත සපයනු ලැබිය යුතු සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ රැකවරණ ප්‍රතිලාභ;

(එ) සිය රට බලා යාමට මුහුදු යාත්‍රාකරු සතු හිමිකම;

(ඒ) අදාළ වේ නම්, සාමූහික කේවල් කිරීමේ ගිවිසුම පිළිබඳ සඳහනක්; සහ

(ඔ) සමාන වේතනයකට සහ යම් අතිරේක වේතනයකට රාජකාරි කරන පැය ගණන.

(7) නෞකාවේ අයිතිකරු හෝ එහි අනුමත බඳවාගැනීමේ හා පත්කිරීමේ සේවා සපයන්නා විසින්, මුහුදු යාත්‍රාකරු සමග අත්සන් කරන ලද ගිවිසුම් කොන්දේසි, අත්සන් කරන ලද දින සිට සතියක කාලයක් ඇතුළත නෞකා නිලධරයා වෙත ගොනු කරනු ලැබිය යුතු ය.

(8) (අ) මුහුදු යාත්‍රාකරු විසින් තමා රාජකාරි කරන ලද නැවෙන් නිදහස්වීමට පෙර, පහත (ආ) ඡේදයට අනුකූලව මුහුදු යාත්‍රාකරුගේ නෞකාස්ථ සේවා නියුක්තිය පිළිබඳ වාර්තාවක් ඔහුට ලබාදිය යුතු ය.

(ආ) රැකියා වාර්තාවෙහි-

(i) මුහුදු යාත්‍රාකරුවන්ගේ රාජකාරියේ ගුණාත්මකභාවය හෝ ඔවුන්ගේ වේතන පිළිබඳ කිසිදු ප්‍රකාශයක් ඇතුළත් නොවිය යුතු ය; සහ

(ii) මුහුදු යාත්‍රාකරුගේ සේවය තවදුරටත් ලබාගැනීම සඳහා ඔහුට පහසුකම් සැලසීමට හෝ මුහුදු යාත්‍රාකරුගේ ශ්‍රේණිය උසස් කිරීම හෝ උසස්වීමක් ලබාගැනීම සඳහා මුහුදු සේවා නියමයන් සපුරාලීමට ප්‍රමාණවත් තොරතුරු ඇතුළත් විය යුතු ය.

(ඇ) ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරුවකු සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අඛණ්ඩ නිදහස් කිරීමේ සහතිකය, එම මුහුදු යාත්‍රාකරුගේ රැකියා වාර්තාව ලෙස සලකනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරු රාජකාරි කරන නැවේ නෞකාධිපතිවරයා විසින් අඛණ්ඩ නිදහස් කිරීමේ සහතිකය පිටසන් කරනු ලැබිය යුතු ය.

(9) (අ) යම් මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුමක් කලින් අවසන් කිරීම සඳහා මුහුදු යාත්‍රාකරුවන් සහ නෞකා අයිතික-රුවන් විසින් ඒ බව දැනුම් දිය යුතු අවම කාලසීමාව සාමූහික කේවල් කිරීමේ ගිවිසුමට හෝ මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුමට අනුකූල විය යුතු නමුත් එය දින හතකට වඩා නොඅඩු විය යුතු ය.

(ආ) දැනුම් දිය යුතු අවම කාලසීමාවට වඩා අඩු කාලසීමාවක දී හෝ දැනුම් දීමකින් තොරව රැකියා ගිවිසුම අවසන් කිරීම යුක්ති සහගත වන බව අදාළ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් යටතේ පිළිගනු ලබන අවස්ථාවන්හි දී සහ මෙම අවස්ථා නිශ්චය කිරීමේ දී (අ) ඡේදයට අනුව දැනුම් දිය යුතු අවම කාලසීමාවට වඩා අඩු කාලසීමාවක් දිය හැකි අතර දණ්ඩනයක් නොමැතිව මුහුදු යාත්‍රාකරු විසින් දයානුකම්පාව හෝ වෙනත් හදිසි හේතූන් මත කෙටි දැනුම්දීමකින් හෝ දැනුම් දීමකින් තොරව රැකියා ගිවිසුම අවසන් කිරීමේ අවශ්‍යතාව සලකා බලන බවට නෞකාවේ අයිතිකරු විසින් සහතික විය යුතු ය.

(10) මුහුදු කොල්ලකෑමක හෝ නැවට එරෙහිව සිදුවන සන්නද්ධ මංකොල්ලකෑමක ප්‍රතිඵලයක් ලෙස මුහුදු යාත්‍රාකරුවකු නැවේ හෝ ඉන් පිටත සිරකොට ඇති අවස්ථාවක,

(අ) මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම කල්ඉකුත්වීමේ නියමිත දිනය පසුවී තිබීම; හෝ

(ආ) (9) වන අනු-නියෝගය ප්‍රකාරව මුහුදු යාත්‍රාකරුගේ ගිවිසුමට සම්බන්ධ කුමන හෝ පාර්ශ්වයක් විසින් එය අත්හිටුවීමට හෝ අවසන් කිරීමට දැනුම් දී තිබීම,

යන කරුණු නොසලකා, මුහුදු යාත්‍රකරුගේ රැකියා ගිවිසුම එම සිරකොට තබන කාලයේදීත් අඛණ්ඩව බලපැවැත්වේ.

(11) මේ නියෝගය උල්ලංඝනය කරමින් මුහුදු යාත්‍රාකරුවකු සේවයේ යොදවන හෝ මුහුදු යාත්‍රාකරුවකු සමග මුහුදු යාත්‍රාකරුවකුගේ රැකියා ගිවිසුමට එළඹෙන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර එහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම යටත් විය යුතු අතර දෙවන වරට හෝ ඉන්පසු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, රුපියල් මිලියන දෙකකට නොවැඩි දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

9. (1) නෞකාවේ අයිතිකරු සහ නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින්, නෞකාස්ථ සෑම මුහුදු යාත්‍රාකරුවකුට ම-

(අ) මාසයකට නොවැඩි කාලසීමාවන් අතරතුර දී; සහ

(ආ) නෞකාස්ථ සේවයේ යෙදවීමට අදාළ මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම හෝ යම් සාමූහික ගිවිසුමකට අනුකූලව සම්පූර්ණයෙන්,

වේතන ගෙවනු ලබන බවට සහතික විය යුතු ය.

(2) නෞකාවේ අයිතිකරු සහ නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින්, නෞකාස්ථ සෑම මුහුදු යාත්‍රාකරුවකුට ම-

(අ) වේතන; සහ

(ආ) අතිරේක ගෙවීම්; සහ

(ඇ) මුදල් ගෙවීම විදේශ ව්‍යවහාර මුදලින් සිදුකර ඇති විට, යෙදා ගන්නා ලද විනිමය අනුපාතිකය,

ඇතුළු ගෙවිය යුතු මුදල් සහ ගෙවන ලද මුදල් පිළිබඳ මාසික වාර්තාවක් ලබාදෙන බවට සහතික විය යුතු ය.

(3) නෞකාවේ අයිතිකරු සහ නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින්, මුහුදු යාත්‍රාකරුගේ වේතන සහ අතිරේක ගෙවීම් සියල්ලම හෝ ඒවායින් කොටසක් ඔහුගේ පවුලට හෝ යැපෙන්නන්ට හෝ නෛතික ප්‍රතිලාභීන්ට සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රමයක් මුහුදු යාත්‍රාකරු වෙත සලසා දෙන බවට සහ එම සම්ප්‍රේෂණ ක්‍රමයන්ට-

(අ) මුහුදු යාත්‍රාකරුවකු නෞකාස්ථ රාජකාරි පටන් ගන්නා වේලාවේ දී හෝ රාජකාරි කරන අතරතුර, ඔහු කැමති වේ නම්, බැංකුවක් හරහා මුදල් යැවීමෙන් හෝ ඒ හා සමාන ක්‍රම මගින් විධිමත් කාලසීමාවන් හි දී, ප්‍රේෂණය සඳහා වන මුහුදු යාත්‍රාකරුගේ වේතනවලින් කොටසක්, කොටස් කර බෙදා දීම සඳහා හැකියාව ලබාදෙන ක්‍රමවේදයක්; සහ

(ආ) එසේ බෙදා දුන් කොටස්, නියමිත කාලයේ දී සහ ඍජුවම මුහුදු යාත්‍රාකරු විසින් නම් කරන ලද තැනැත්තාට හෝ තැනැත්තන්ට ප්‍රේෂණය කළ යුතු බවට වන නියමයක්,

ඇතුළත් වන බවට සහතික විය යුතු ය.

(4) නෞකාවේ අයිතිකරු සහ නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින්-

(අ) (3) වන අනු-නියෝගයේ දක්වා ඇති පරිදි මුහුදු යාත්‍රාකරුවකු වෙත සපයන ලද සේවාවක් සඳහා වන යම් අයකිරීමක් සාධාරණ මුදලක් වන බවට; සහ

(ආ) මුදල් හුවමාරු අනුපාතය-

(i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද පවත්නා වෙළඳපොළ අනුපාතයෙන් හෝ නිල වශයෙන් ප්‍රකාශිත අනුපාතයෙන් හෝ නෞකාවේ ප්‍රදර්ශනය කරනු ලබන්නේ යම් රාජ්‍යයක ධජයක් ද එකී රාජ්‍යයේ ජාතික නීතීන්ට අනුකූල වන අනුපාතයෙන් වන බවට; සහ

(ii) මුහුදු යාත්‍රාකරුට අවාසිදායක නොවන බවට,

සහතික විය යුතු ය.

(5) සාමූහික කේවල් කිරීමේ ගිවිසුමේ හෝ මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුමේ ඇතුළත් වේතන, සම්මුතියේ B2.2.2 (ගණනය කිරීම හා ගෙවීම) සහ B2.2.3 (අවම වේතන) පිළිබඳ මාර්ගෝපදේශයන්ට අනුකූල විය යුතු ය.

(6) ශ්‍රී ලංකාවේ නැව්වල අයිතිකරුවන් විසින්, ඔවුන්ගේ නැව්වල නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවන්ගේ වේතනයන්ට අදාළ වැටුප් ලේඛන පිළිබඳ වාර්තා හෝ ඉලෙක්ට්‍රොනික වාර්තා පත් පවත්වාගෙන යා යුතු ය.

(7) මුහුදු මංකොල්ලකෑමක හෝ නැවට එරෙහිව සිදුවන සන්නද්ධ මංකොල්ලකෑමක ප්‍රතිඵලයක් ලෙස මුහුදු යාත්‍රාකරුවකු නැවේ හෝ ඉන් පිටත සිරකොට ඇති අවස්ථාවක,

(අ) මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම;

(ආ) අදාළ යම් සාමූහික කේවල් කිරීමේ ගිවිසුමක්; හෝ

(ඇ) යම් ලිඛිත නීතියක්.

යටතේ වන මුහුදු යාත්‍රාකරුගේ වේතන සහ අනෙකුත් හිමිකම්, සිරකොට තබන සම්පූර්ණ කාලසීමාව තුළ ඔහුට අඛණ්ඩව ගෙවනු ලැබිය යුතු අතර,

(ඈ) මේ නියෝගවලට අනුකූලව මුහුදු යාත්‍රාකරුව නිදහස් කරනු ලබන දිනය හෝ නිසි පරිදි සිය රට බලා යවන දිනය වන තෙක්; හෝ

(ඉ) සිරකොට තබන අතරතුර මුහුදු යාත්‍රාකරු මරණයට පත් වේ නම්, ඔහුගේ මරණය සිදුවන දිනය වන තෙක්,

ගෙවනු ලැබිය යුතු ය.

(8) මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර එහි වරදකරු කරනු ලැබූ, විට රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

10. (1) මේ නියෝගවල කාර්ය සඳහා-

(අ) "රාජකාරි කරන පැය ගණන" යන්නෙන්, නැවේ රාජකාරි කිරීම සඳහා මුහුදු යාත්‍රාකරුවන්ට නියම කරන කාලසීමාව අදහස් වේ; සහ

(ආ) "විවේකීව සිටින පැය ගණන" යන්නෙන්, රාජකාරි කරන පැය ගණනට අයත් නොවන කාලසීමාව අදහස් වන නමුත් ඊට රාජකාරි කරන පැය ගණන අතරතුර ගනු ලබන කෙටි විවේක කාල හෝ පැයක කාලය වන තෙක් ගනු ලබන ආහාර ගැනීමේ විවේක කාල ඇතුළත් නොවේ.

(2) සාමූහික කේවල් කිරීමේ ගිවිසුමට හෝ මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ත ගිවිසුමට අනුව මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන සාමාන්‍ය වැඩ කිරීමේ පැය ගණන පිළිබඳ සම්මතය, සතියට එක් විවේක දිනයක් සහ රජයේ නිවාඩු දිනවල විවේකය සහිතව දිනකට පැය අටක් නොඉක්මවිය යුතු ය.

(3) නැවේ අයිතිකරු විසින්;

(අ) යම් පැය විසිහතරක කාලසීමාවක් තුළ පැය දහයකට නොඅඩු; සහ

(ආ) යම් දින හතක කාලසීමාවක් තුළ පැය හැත්තෑ හතකට නොඅඩු;

විය යුතු අවම විවේක පැය ගණනක් සම්මත කරනු ලැබිය යුතු ය.

(4) අවම පැය දහයක විවේක කාලය කාල පරිච්ඡේද දෙකකට වඩා නොබෙදිය යුතු අතර එයින් එක් කාල පරිච්ඡේදයක් යටත් පිරිසෙයින් පැය හයක් වත් දීර්ඝ විය යුතු අතර අනුක්‍රමික විවේක කාල අතර කාල අන්තරය පැය දාහතරක් නොඉක්මවිය යුතු ය.

(5)නැවේ නෞකාස්ථ පෙරෙට්ටු, ගිනි නිවාරණය කිරීමේ සහ ජීවිතාරක්ෂක බෝට්ටු, සහ ශ්‍රී ලංකාවේ ජාතික නියෝග සහ ජාත්‍යන්තර සම්මුති මගින් නියම කරන ලද සරඹ පුහුණු-

(අ) යම් විවේක කාල පරිච්ඡේදයකට බාධා පැමිණවීම අවම වන ආකාරයකට; සහ

(ආ) නැවේ නෞකාස්ථ කිසිදු මුහුදු යාත්‍රාකරුවකු වෙහෙසට පත් නොවන ආකාරයකට;

පවත්වනු ලැබිය යුතු ය.

(6) මුහුදු යාත්‍රාකරුවකු රාජකාරිය සඳහා සූදානමින් සිටින අවස්ථාවක, එනම් යාන්ත්‍රාගාරයක කටයුතු සඳහා කිසිවෙකු නොමැති අවස්ථාවක, රාජකාරිය සඳහා කෙරෙන කැඳවීම් හේතුවෙන් සාමාන්‍ය කාලයකට බාධා වන්නේ නම්, ඔහුට ප්‍රමාණවත් හානිපූරක විවේක කාලයක් තිබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සම්මුතියේ A2.3 ප්‍රමිතීන් සහ STCW සම්මුතියේ A-VIII/1 වන වගන්තියට අනුකූලව, ශ්‍රී ලාංකික නැවකට (3) වන සහ (4) වන අනුනියෝග යටතේ වන විවේක පැය ගණන පිළිබඳ නියමයන්ට ව්‍යාතිරේකයක් සඳහා අවසර ලබා දිය හැකි ය. එම ව්‍යාතිරේක හැකිතාක් දුරට, සම්මුතියේ A2-3 ප්‍රමිතිවල විධිවිධාන අනුගමනය කළ යුතු නමුත් නිතරම ගනු ලබන හෝ දීර්ඝ විවේක කාලයන් පිළිබඳ හෝ මුර සේවයේ යෙදෙන මුහුදු යාත්‍රාකරුවන් හෝ කෙටි මුහුදු ගමන්වල යෙදෙන නැව්වල නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවන් සඳහා හානිපූරක විවේක කාලයක් ලබාදීම පිළිබඳ සැලකිල්ලට ගනු ලැබිය හැකි ය.

(8) (අ) නැවේ හෝ නෞකාස්ථ තැනැත්තන්ගේ හෝ නැව් භාණ්ඩවල හෝ හදිසි ආරක්ෂාව සඳහා, හෝ මුහුදේ දී විපතට පත් වෙනත් නැව්වලට හෝ තැනැත්තන්ට සහය දීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් පැය ගණනක කාර්යයක් ඉටු කිරීම සඳහා මුහුදු යාත්‍රාකරුවකුට නියම කිරීමට නෞකාධිපතිවරයාට ඇති අයිතියට මේ නියෝගයේ සඳහන් කිසිවක් මගින් හානියක් සිදුවන බවට සලකනු නොලැබිය යුතු ය.

(ආ) එවැනි අවස්ථාවල දී, නෞකාධිපතිවරයා විසින් කාලසටහන් ගත කළ වැඩ කිරීමේ පැය ගණන අත්හිටුවා එය නැවත ප්‍රකෘති තත්ත්වයට පත්වන තෙක් අවශ්‍ය වන යම් පැය ගණනක් කාර්යය ඉටු කිරීමට මුහුදු යාත්‍රාකරුට නියම කරනු ලැබිය යුතු ය. නැවත ප්‍රකෘති තත්ත්වයට පත්වීමෙන් පසු ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින්, කාලසටහන්ගත විවේක කාලය තුළ කාර්ය ඉටු කරන ලද යම් මුහුදු යාත්‍රාකරුවකුට ප්‍රමාණවත් විවේක කාලයක් ලබා දෙනු ලබන බවට නෞකාධිපතිවරයා සහතික විය යුතු ය.

(9) (අ) නැවේ නෞකාධිපතිවරයා විසින්-

(i) (ආ) ඡේදයට අනුකූලව කටයුතු කරන නෞකාස්ථ වැඩපිළිවෙළ සමඟ සටහනක් සකස් කළ යුතු ය; සහ

(ii) නැවේ සිටින මුහුදු යාත්‍රාකරුවන්ට ප්‍රවේශවිය හැකි නැවේ පැහැදිලිව පෙනෙන තැනක එම සටහන ප්‍රදර්ශනය කළ යුතු ය.

(ආ) සටහන-

(i) නැවේ නෞකාස්ථ එක් එක් මුහුදු යාත්‍රාකරුවාට අදාළව -

(අ) මුහුදේ දී සිදු කරන සේවය සහ වරායේ දී සිදු කරන සේවය පිළිබඳ කාර්ය සටහනක්; සහ

(ආ) අවම විවේක පැය ගණන;

එහි අන්තර්ගත විය යුතු ය; සහ

(ii) (අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමිතිගත ආකෘතියකින්;

(ආ) නැවේ සේවක මණ්ඩලය රාජකාරි ඉටු කරන භාෂාවෙන්; සහ

(ඇ) රාජකාරි ඉටු කරන භාෂාව ඉංග්‍රීසි භාෂාව නොවේ නම්, ඉංග්‍රීසි භාෂාවෙන් ද,

ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ඇ) නෞකාධිපතිවරයා විසින්:-

(i) (අ) නෞකාධිපතිවරයා හෝ නෞකාධිපතිවරයා විසින් බලය ලබා දෙන යම් තැනැත්තකු විසින්; සහ

(ආ) මුහුදු යාත්‍රාකරු විසින්;

පිටසන් කරනු ලබන නැවේ සෑම නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවකුගේ ම දිනපතා විවේක පැය ගණන් පිළිබඳ වාර්තාවක් පවත්වාගෙන යා යුතු ය; සහ

(ii) එක් එක් මුහුදු යාත්‍රාකරුවාට, මුහුදු යාත්‍රාකරුවාට අදාළ වාර්තාවේ පිටපතක් ලබා දිය යුතු ය.

(ඈ) (ඇ) ඡේදයේ සඳහන් කරන ලද වාර්තාව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි සම්මත ආකෘතියකින් තිබිය යුතු ය.

(10) (අ) නැවක නෞකාස්ථව සේවය කිරීමට යොදවනු ලබන වයස අවුරුදු 18ට අඩු මුහුදු යාත්‍රාකරුවකු සම්බන්ධයෙන් පහත දැක්වෙන නියමයන්ට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය-

(i) මුහුදු යාත්‍රාකරුවාගේ වැඩ කරන පැය ගණන-

(අ) පැය 24 ක කාලයක් ඇතුළත පැය 8 ක්; සහ

(ආ) දින 7ක කාලයක් ඇතුළත පැය 40 ක්;

නොඉක්මවිය යුතු ය;

(ii) (අ) ආහාර වේල් සඳහා ප්‍රමාණවත් කාලයක්; සහ

(ආ) ප්‍රධාන ආහාර වේල සඳහා දිනකට අවම වශයෙන් පැය 1 ක විවේකයක්;

තිබිය යුතු ය; සහ

(iii) අඛණ්ඩව සේවය කරන සෑම පැය 2 ක කාලයකටම පසුව ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් විනාඩි 15ක විවේක කාලයක් තිබිය යුතු ය.

(ආ) (i) මුහුදු යාත්‍රාකරුවාට මුරකාවල් සේවයේ කාර්ය හෝ නැව් තට්ටු අංශයේ, එන්ජින් කාමර අංශයේ හෝ ආහාර සැපයුම් අංශයේ සේවා මුර ක්‍රමයට වැඩ මුර අනුව වැඩ කිරීම පැවරී තිබේ නම් සහ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම ප්‍රායෝගික නොවන්නේ නම්;

(ii) (අ) නැවේ හෝ නෞකාස්ථ තැනැත්තකුගේ හෝ නැව් භාණ්ඩවල හදිසි ආරක්ෂාව සහතික කිරීම සඳහා; හෝ

(ආ) මුහුදේ දී විපතට පත් වෙනත් යම් නැවකට හෝ තැනැත්තකුට සහාය ලබාදීම සඳහා;

වැඩිපුර පැය ගණනක් සේවය කිරීමට මුහුදු යාත්‍රාකරුවාට අවශ්‍ය වන්නේ නම්; හෝ

(iii) අනුමත පුහුණු කිරීමේ වැඩසටහනකට අනුකූලව මුහුදු යාත්‍රාකරුවා සඳහා වන පුහුණු කිරීමට හානියක් විය හැකි නම්,

(අ) ඡේදය අදාළ නොවන්නේ ය.

(ඇ) (10)(ආ) උපනියෝගය හේතුවෙන් මුහුදු යාත්‍රාකරුවකු සම්බන්ධයෙන් (10)(අ) උපනියෝගයේ නිශ්චිතව දක්වා ඇති මුහුදු යාත්‍රාකරුවකු විසින් සේවයේ යෙදීමට නියමිත පැය ගණන ඉක්මවයි නම් අදාළ නැවේ නෞකාධිපතිවරයා විසින් පහත දැක්වෙන තොරතුරු ඇතුළත් වාර්තාවක් සකස් කොට අත්සන් කරනු ලැබිය යුතු ය-

(i) වැඩිපුර සේවය කරන කාලසීමාව; සහ

(ii) මුහුදු යාත්‍රාකරුවාගේ සේවය කිරීමේ පැය ගණන දීර්ඝ කරන ලද්දේ කවර අවස්ථානුගත කරුණු යටතේ ද යන්න.

(11) මෙම නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර ඊට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

11. (1) නැවේ අයිතිකරු, නෞකාධිපතිවරයා සහ මුහුදු යාත්‍රාකරුවකුගේ සේවා යෝජකයා විසින් -

(අ) (4) වන අනුනියෝගය යටතේ මුහුදු යාත්‍රාකරුට හිමිකම් ඇති නිවාඩුවලට අමතරව, නැව් අයිතිකරු සමඟ අඛණ්ඩව සේවය කරන එක් මසකට අවම වශයෙන් ලිත් දින 2.5 ක වැටුප් සහිත වාර්ෂික නිවාඩුවක් මුහුදු යාත්‍රාකරු විසින් ගනු ලබන බවට, සහ

(ආ) මුහුදු යාත්‍රාකරුගේ තනතුර සම්බන්ධ වන මෙහෙයුම් අවශ්‍යතා ඇතුළත, තම සෞඛ්‍යය සහ යහපැවැත්ම පිණිස නැවෙන් බැහැරව ගොඩබිමට යාමට ලැබෙන අවසරය මුහුදු යාත්‍රාකරුට දෙනු ලබන බවට,

සහතික විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවල දී හැර, (1) වන අනුනියෝගයේ දක්වා ඇති වැටුප් සහිත අවම වාර්ෂික නිවාඩු ප්‍රමාණය අත්හරින යම් ගිවිසුමක් තහනම් කරනු ලැබේ. පුහුණු කිරීමේ ගිවිසුම්වලට අනුකූලව ඔවුන්ගේ මුහුදේ හෝ නෞකාස්ථ පුහුණුව සම්පූර්ණ කිරීම පිණිස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පුහුණු වන්නන් සඳහා (1) වන අනුනියෝගයේ දක්වා ඇති අවම වාර්ෂික නිවාඩු ප්‍රමාණය අත්හරිනු ලැබිය හැකි ය.

(3) යම් වර්ෂයකට මාස 12 කට අඩු අඛණ්ඩ සේවා කාලසීමාවක් සඳහා යම් නැව් අයිතිකරුවකු වෙත සේවය සපයා ඇති හෝ විෂමාචාරයක් වෙනුවෙන් හැර අන්‍යාකාරයකින් සේවා නියුක්තිය අවසන් කරනු ලබන අවස්ථාවක, මුහුදු යාත්‍රාකරුවකු, එම වර්ෂයේ සේවය සම්පූර්ණ කර ඇති මාස ගණනට අනුපාතිකව වාර්ෂික නිවාඩු සඳහා හිමිකම් ලැබිය යුතු ය.

(4) පහත කාර්යයන් සඳහා ලබා දී ඇති නොපැමිණීමේ නිවාඩු මුහුදු යාත්‍රාකරුවකුගේ වාර්ෂික නිවාඩුවල කොටසක් ලෙස ගණනය කරනු නොලැබිය යුතු ය;

(අ) වැටුප් සහිත වාර්ෂික නිවාඩු අතරට යෙදුණ ද නොයෙදුණ ද, ප්‍රසිද්ධ සහ සම්මත නිවාඩු දින;

(ආ) රෝගාතුර වීම හෝ අනතුරක් හේතුවෙන් හෝ ගර්භණීවීම හේතුවෙන් වැඩ කිරීමට යෝග්‍ය නොවන කාලසීමාවන්;

(ඇ) මුහුදු යාත්‍රාකරුවාගේ සේවා නියුක්ති ගිවිසුම යටතේ නැවේ අයිතිකරු සහ මුහුදු යාත්‍රාකරු අතර එළඹෙන ගිවිසුමකින් නැවෙන් බැහැරව ගොඩබිමට යාමට තාවකාලිකව ලැබෙන අවසරය;

(ඈ) මුහුදු යාත්‍රාකරුවකු නැවකට හෝ නැවකින් සංක්‍රමණය වන හෝ වහාම කාර්යයෙහි යෙදවීම සඳහා ක්‍රියාකාරීව සූදානම්ව සිටින කාලසීමාව; සහ

(ඉ) සිය රටට පැමිණීමට බලා සිටින කාලය සහ සිය රට බලා යාමට ගතවන කාලය.

(5) මුහුදු යාත්‍රාකරුවකු විසින් (1) වන අනුනියෝගය යටතේ ගනු ලැබිය යුතු සියලු වැටුප් සහිත නිවාඩු ගෙන නොමැති අවස්ථාවක සේවා නියුක්ති සම්බන්ධතාවය අවසන් වන්නේ නම්, නැවේ අයිතිකරු හෝ සේවා යෝජකයා විසින්, (1) වන නියෝගය මගින් නියම කරනු ලබන මුහුදු ගමන්කරුවාගේ වැටුප් සහිත අවම වාර්ෂික නිවාඩු දීමනාව හිලව් ගෙවීමක් මගින් ප්‍රතියෝජනය කරනු ලැබිය යුතු ය.

(6) මුහුදු යාත්‍රාකරුවකු, ඔහුට සැලකිය යුතු සම්බන්ධතාවක් පවතින හෝ ඔහු පිටත්ව යාමට හිමිකම් ලබන ස්ථානයක දී වාර්ෂික නිවාඩු ලබා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(7) (අ) මුහුදු යාත්‍රාකරු විසින් තම කැමැත්ත ලබා දෙන්නේ නම්;

(ආ) මුහුදු යාත්‍රාකරු සේවයේ යෙදී සිටි ස්ථානය හෝ බඳවා ගනු ලැබූ ස්ථානය යන දෙකෙන් ඔහුගේ නිවසට ආසන්නතම ස්ථානය වෙත ඔහුව ගෙන යාමේ පිරිවැය නැවේ අයිතිකරු විසින් දරනු ලබන්නේ නම්; සහ

(ඇ) නැවේ අයිතිකරු විසින්, යැපීම් සහ සෘජුවම අදාළ වන වෙනත් සියලු පිරිවැය දරනු ලබන්නේ නම්,

මිස, කිසිදු තැනැත්තකු විසින් මුහුදු යාත්‍රාකරුගේ සේවා නියුක්ති ගිවිසුමේ සපයා ඇති ස්ථානයක් නොවන වෙනත් ස්ථානයක දී වාර්ෂික නිවාඩු ලබා ගැනීමට මුහුදු යාත්‍රාකරුවකුට නියම කරනු නොලැබිය යුතු ය.

(8) කලින් කලට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අතිශයින් හදිසි අවස්ථාවල දී සහ මුහුදු යාත්‍රාකරුවාගේ කැමැත්ත ලැබී තිබෙන අවස්ථාවල දී හැර කිසිදු තැනැත්තකු විසින් වැටුප් සහිත වාර්ෂික නිවාඩු ලබා සිටින මුහුදු යාත්‍රාකරුවකු නැවත කැඳවනු නොලැබිය යුතු ය.

(9) (3) වන අනුනියෝගය යටතේ අනුපාතික වාර්ෂික නිවාඩු ගණනය කිරීමේ දී, දින භාගයකට අඩු යම් දින කොටසක් නොසලකා හරිනු ලැබිය යුතු අතර දින කොටස දින භාගයක් හෝ ඊට වැඩි වන අවස්ථාවල දී එය එක් දිනයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) එම අවස්ථාවේ දී තම නේවාසික රටට නැවත පැමිණ නොමැති, සහ පසුව එළඹෙන මාස තුනක මුහුදු ගමන තුළ නැවත නොපැමිණෙන, විදේශයකට ගමන් කරන නැවක, නිවාඩු නොලබා, සාමූහික ගිවිසුමක් හෝ මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමක් යටතේ මාස හයක් හෝ වෙනත් යම් ඊට අඩු කාලසීමාවක් සේවය කර ඇති වයස අවුරුදු දහඅටට අඩු මුහුදු යාත්‍රාකරුවන්, මුහුදු ගමන් තුළ දී ඔවුන් විසින් උපයාගත් යම් නිවාඩු ලබා ගැනීමේ කාර්ය සඳහා, ඔවුන්ට කිසිදු වියදමකින් තොරව, ඔවුන්ගේ නේවාසික රටේ මුලින්ම සේවයට බැඳුණු ස්ථානය වෙත යවනු ලැබිය යුතු ය.

12. (1) මුහුදු යාත්‍රාකරුවා මාස 12 ක් නොඉක්මවන කාලසීමාවක් සඳහා නෞකාස්ථව සිට ඇත්තේ නම් සහ-

(අ) මුහුදු යාත්‍රාකරු විදේශගතව සිටින අතරතුර මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුම කල් ඉකුත් වන්නේ නම්,

(ආ) නැවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුම අවසන් කරනු ලබන්නේ නම්;

(ඇ) ගිවිසුමේ නියමයන්ට අනුකූලව මුහුදු යාත්‍රාකරු විසින් මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුම අවසන් කරනු ලබන්නේ නම්;

(ඈ) පහත දැක්වෙන අවස්ථා ද ඇතුළුව, යම් නිශ්චිත අවස්ථාවන්හි දී මුහුදු යාත්‍රාකරුට මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුම යටතේ මුහුදු යාත්‍රාකරුවන්ගේ රාජකාරි ඉටු කිරීමට තවදුරටත් නොහැකි වන්නේ නම් හෝ එම රාජකාරි ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය නොහැකි වන්නේ නම්;

(i) සංචාරය කිරීම සඳහා වෛද්‍යමය වශයෙන් යෝග්‍ය යැයි හඳුනාගන්නා විට ඔවුන් සිය රට බලා යැවීමට නියම කරනු ලබන යම් රෝගයක්, තුවාලයක් හෝ වෛද්‍යමය තත්ත්වයක් මුහුදු යාත්‍රාකරුට තිබීම;

(ii) නැව විනාශයට පත්වීම;

(iii) නැව බංකොලොත් භාවයට පත්වීමෙන්, නැව විකිණීමෙන් හෝ නැවේ ලියාපදිංචිය වෙනස් කිරීමකින් පසුව මුහුදු යාත්‍රාකරු වෙත එහි නෛතික හෝ ගිවිසුම්කාර බැඳීම් ඉටු කිරීමට නැවේ අයිතිකරු අපොහොසත් වීම; හෝ

(iv) නැව, මුහුදු යාත්‍රාකරු යාමට කැමැත්ත පළ නොකරන යුද කලාපයකට ගමන් කිරීමට යොමු වීම; සහ

(ඉ) මුහුදු කොල්ලකෑමේ ක්‍රියාවක හෝ නැවට එරෙහි සන්නද්ධ මංකොල්ලයක ප්‍රතිඵලයක් වශයෙන් නැවේ හෝ නැවෙන් පිටත සිරකර තබා ගැනීමකින් පසුව මුහුදු යාත්‍රාකරු සිරකර ගැනීමෙන් නිදහස් කරනු ලබන අවස්ථාවක දී,

මුහුදු යාත්‍රාකරුට කිසිදු පිරිවැයකින් තොරව සිය රට බලා යවනු ලබන බවට නැවේ අයිතිකරු සහ ශ්‍රී ලාංකික නැවක නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුගේ සේවා යෝජකයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(2) (අ)(1) වන අනුනියෝගය යටතේ මුහුදු යාත්‍රාකරුවකු සිය රට බලා යැවීම සඳහා විධිවිධාන සැලස්වීමේ කාර්යයන් නැව් අයිතිකරුවකු මත පවතින අවස්ථාවක දී, ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් ගුවන් ප්‍රවාහනය මගින් මුහුදු යාත්‍රාකරුගේ සේවා නියුක්ති ගිවිසුමේ විධිවිධාන සලස්වා ඇති ගමනාන්තය වෙත හෝ පසුව නැව් අයිතිකරු සමග එකඟ වන ලද වෙනත් යම් ස්ථානයක් වෙත යවනු ලැබීමට මුහුදු යාත්‍රාකරු හිමිකම් ලබන්නේ ය.

(ආ) මුහුදු යාත්‍රාකරුගේ සේවා නියුක්ති ගිවිසුමෙහි ගමනාන්තයක් හඳුන්වා නොමැත්තේ නම් සහ ගමනාන්තය සම්බන්ධයෙන් මුහුදු යාත්‍රාකරු සහ නැවේ අයිතිකරු අතර ගිවිසුමකට එළඹ නොමැත්තේ නම්, මුහුදු යාත්‍රාකරුගේ තේරීම අනුව පහත දැක්වෙන ගමනාන්තයන් වෙත යවනු ලැබීමට මුහුදු යාත්‍රාකරු හිමිකම් ලබන්නේ ය-

(i) මුහුදු යාත්‍රාකරු, මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමට එළඹෙන අවස්ථාවේ සිටි ස්ථානය; හෝ

(ii) මුහුදු යාත්‍රාකරුගේ නේවාසික රට.

(3) (1) වන අනුනියෝගය යටතේ මුහුදු යාත්‍රාකරුවකු සිය රට බලා යැවීම සඳහා විධිවිධාන සැලැස්වීමේ කාර්යයන් නැවේ අයිතිකරු මත පවතින අවස්ථාවක දී, මුහුදු කොල්ලකෑමේ ක්‍රියාවක් හෝ එවැනි නැවකට එරෙහි සන්නද්ධ මංකොල්ලයක ප්‍රතිඵලයක් වශයෙන් එම මුහුදු යාත්‍රාකරු නැව තුළ හෝ නැවෙන් පිටත සිර කර තබා ගනු ලබන අවස්ථාවක හැර, -

(අ) (2) වන අනුනියෝගයට අනුකූලව මුහුදු යාත්‍රාකරු සිය රට බලා යවනු ලබන අවස්ථාවක;

(ආ) මුහුදු යාත්‍රාකරුගේ විෂමාචාරයක් හේතුවෙන් අසාර්ථක වන, සිය රට බලා යැවීම සඳහා සාධාරණ වැඩපිළිවෙළ නැවේ අයිතිකරු විසින් සකස් කරනු ලබන අවස්ථාවක;

(ඇ) නැවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරු සම්බන්ධ කර ගැනීමට මාස තුනක හෝ ඊට වැඩි කාලසීමාවක් තුළ සාධාරණ උත්සාහයන් දරා ඇති, එහෙත් එවැනි සම්බන්ධ කිරීමක් කර ගැනීමට අපොහොසත් වී ඇති අවස්ථාවක,

(ඈ) මුහුදු යාත්‍රාකරු විසින් ලිඛිතව සිය රට බලා යාම අවශ්‍ය නොවන බව නැවේ අයිතිකරු වෙත තහවුරු කරනු ලබන අවස්ථාවක; හෝ

(ඉ) මුහුදු යාත්‍රාකරු මිය යාමක දී,

එම කාර්යය අවසන් වේ.

(4) මේ නියෝගය යටතේ සිය රට බලා යැවීම සඳහා නැවේ අයිතිකරු විසින් දරනු ලැබිය යුතු පිරිවැයවලට යටත් පිරිසෙයින් පහත දැක්වෙන දෑ ඇතුළත් විය යුතු යः-

(අ) මේ නියෝගයේ (2) වන අනුනියෝගයට අනුව සිය රට බලා යැවීම සඳහා තෝරාගත් ගමනාන්තය දක්වා ප්‍රවේශ මාර්ගය;

(ආ) මුහුදු යාත්‍රාකරුවන් නැවෙන් පිටත් වන අවස්ථාවේ සිට ඔවුන් යවනු ලබන ගමනාන්තයට ළඟාවන තෙක් නවාතැන් ලබාදෙන ස්ථානය සහ ආහාර;

(ඇ) මුහුදු යාත්‍රාකරුවන් නැවෙන් පිටත් වන අවස්ථාවේ සිට ඔවුන් යවනු ලබන ගමනාන්තයට ළඟාවන තෙක් වන වැටුප් සහ දීමනා;

(ඈ) කිලෝග්‍රෑම් 30 ක මුහුදු යාත්‍රාකරුවන්ගේ පුද්ගලික ගමන් මලු යවනු ලබන ගමනාන්තය වෙත ප්‍රවාහනය කිරීම; සහ

(ඉ) යවනු ලබන ගමනාන්තය වෙත ගමන් කිරීමට මුහුදු යාත්‍රාකරු වෛද්‍යමය වශයෙන් යෝග්‍ය වන තෙක් අවශ්‍ය අවස්ථාවල දී වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම.

(5) (අ) තම පළමු විදේශීය මුහුදු ගමන් තුළ අවම වශයෙන් මාස 4 ක් නැවක සේවය කිරීමෙන් පසුව මුහුදු ආශ්‍රිතව ජීවත්වීමට නුසුදුසු යැයි හඳුනාගනු ලබන වයස අවුරුදු දහඅටට අඩු මුහුදු යාත්‍රාකරුවකුට, ඔහුට කිසිදු වියදමකින් තොරව සහ මේ වගන්තියට අනුකූලව, ශ්‍රී ලංකාවේ හෝ ඔහුගේ ජාතිකත්වය සහිත හෝ නේවාසික රාජ්‍යයේ තානාපති සේවා පවතින්නා වූ සුදුසු පළමු වරායකින් සිය රට බලා යැවීමට අවස්ථාව දෙනු ලැබිය යුතු ය.

(ආ) නැවේ අයිතිකරු විසින්, (5අ) වන අනුනියෝගයේ සඳහන් කරන ලද එකී සිය රටබලා යැවීම සහ ඒ සඳහා වන හේතු පිළිබඳ (5අ) වන අනුනියෝගයේ සඳහන් කරන ලද අදාළ මුහුදු යාත්‍රාකරුවා මුහුදු ගමනේ යෙදෙන රැකියාවක් කිරීමට හැකියාව ලබා දෙමින් ලේඛන නිකුත් කරන ලද රාජ්‍යයේ අධිකාරය වෙත, දැනුම් දිය යුතු ය.

(6) (අ) 6(ආ) වන අනුනියෝගයට යටත්ව, නැව් අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරුවකු සමඟ, එම ගිවිසුම යටතේ මේ නියෝගයේ 4 වන අනුනියෝගයට අදාළව මුහුදු යාත්‍රාකරු විසින් ගෙවීමක් සිදු කළ යුතු වන යම් ගිවිසුමකට එළඹීම සිදු නොකළ යුතු ය.

(ආ) මුහුදු යාත්‍රාකරුවාගේ බරපතල විෂමාචාරයක් හේතුවෙන් එම ගිවිසුම අවසන් කරනු ලබන අවස්ථාවක මුහුදු යාත්‍රාකරු විසින් සිය රට බලා යැවීමේ පිරිවැය ආපසු ගෙවිය යුතු වන බවට මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමකින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(ඇ) 6(ආ) වන අනුනියෝගයේ විස්තර කර ඇති විධිවිධානය මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමක අන්තර්ගත වන්නේ නම් සහ එම බැඳීම උද්ගත වන්නේ නම්, එම ගිවිසුම යටතේ මුහුදු යාත්‍රාකරු වෙත ගෙවිය යුතු වේතනවලින් එම පිරිවැයවලට සමාන අඩු කිරීමක් සිදු කරනු ලැබිය හැකි ය.

(ඈ) 6(ආ) වන අනුනියෝගයේ විස්තර කර ඇති එම විධිවිධානය මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමක අන්තර්ගත නොවන්නේ නම්, මුහුදු යාත්‍රාකරුවාගේ බරපතල විෂමාචාරයක් හේතුවෙන් ගිවිසුම අවසන් කරනු ලබන අවස්ථාවක දී පමණක් නැව් අයිතිකරු විසින් (4) වන අනුනියෝගයේ විස්තර කරන ලද පිරිවැය (හෝ එම පිරිවැයවලට අදාළ හානි) නැවත අයකර ගනු ලැබිය හැකි ය.

(7) (අ) ශ්‍රී ලාංකික නැවක් සම්බන්ධයෙන් වන විට දී, 12(1) වන සහ 12(4) වන නියෝගවල කාර්යයන්ගෙන් උද්ගත වන යම් වගකීම් සපුරාලීමට නැවේ අයිතිකරුට හැකි බවට තහවුරු කිරීමට ප්‍රමාණවත් රක්ෂණ ගිවිසුමක් හෝ වෙනත් මූල්‍ය සුරැකුමක් බලාත්මකව පවතින්නේ නම්; හෝ

(ආ) විදේශීය නැවක් සම්බන්ධයෙන් වන විට දී, සම්මුතියේ 12(1) වන නියෝගයේ (සිය රට බලා යැවීම) 2 වන ඡේදයට අනුකූලව මූල්‍ය සුරැකුමක් සඳහා විධිවිධාන සලස්වා ඇත්තේ නම්,

මිස, නැවක් මෙහෙයවනු නොලැබිය යුතු ය.

(8) (අ) ශ්‍රී ලාංකික නැවක අයිතිකරුවකු 12(1) වන නියෝගය හෝ 12(4) වන නියෝගය යටතේ නියම කරන ලද විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දරන ලද පිරිවැය නැවේ අයිතිකරුගෙන් අයකර ගනු ලැබිය යුතු ය.

(ආ) විදේශීය නැවක අයිතිකරුවකු, එම නැවේ ධජය දරන රාජ්‍යය විසින් ක්‍රියාත්මක කරන ලද සම්මුතියේ නියමයන්ට හෝ සම්මුතියේ අවම නියමයන්ට අනුකූල වෙමින් මුහුදු යාත්‍රාකරු සිය රට බලා යැවීමේ පිරිවැය සඳහා සහ එම වියදම් පියවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීමට අපොහොසත් වන්නේ නම්, දරන ලද පිරිවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, නැවේ අයිතිකරුගෙන් නැවත අයකර ගනු ලැබිය යුතු අතර පිරිවැය සම්පූර්ණයෙන්ම ආපසු ගෙවනු ලබන තෙක් රඳවා ගනු ලැබිය හැකි ය.

(ඇ) නැවේ අයිතිකරු සහ ශ්‍රී ලාංකික ජාතිකයකු වන මුහුදු යාත්‍රාකරුගේ සේවා යෝජකයා සහ මුහුදු යාත්‍රාකරු සේවයේ නියුක්ත කොට ඇති හෝ කාර්යයෙහි යොදවා ඇති නැවේ ධජය දරන රාජ්‍යයේ නිසි බලධරයා, එම නැවේ ධජය අයත් රාජ්‍යය විසින් ක්‍රියාත්මක කරන ලද සම්මුතියේ නියමයන්ට හෝ සම්මුතියේ අවම නියමයන්ට අනුකූල වෙමින් මුහුදු යාත්‍රාකරු සිය රට බලා යැවීමේ පිරිවැය සඳහා සහ එම වියදම් පියවීම සඳහා වැඩපිළිවෙල සකස් කිරීමට අපොහොසත් වන්නේ නම්, දරන ලද පිරිවැය, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නැවේ අයිතිකරුගෙන් නැවත අයකර ගනු ලැබිය යුතු අතර පිරිවැය සම්පූර්ණයෙන්ම ආපසු ගෙවනු ලබන තෙක් නැව රඳවා තබා ගැනීමට ධජය අයත් රාජ්‍යයෙන් හෝ වරාය පිහිටි රාජ්‍යයෙන් ඉල්ලා සිටිය හැකි ය.

(ඈ) 6(ඈ) වන අනුනියෝගයේ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, කිසිදු අවස්ථාවක දී සිය රට බලා යැවීමේ වියදම් මුහුදු යාත්‍රාකරුගෙන් අයකර ගනු නොලැබිය යුතු ය.

(9) මේ නියෝගයේ ඉංග්‍රීසි භාෂාවෙන් යුතු ලිඛිත පිටපතක් නැවක නෞකාස්ථව රැගෙන යනු ලැබිය යුතු බව සහ මුහුදු යාත්‍රාකරුවන්ට ලබාගත හැකි බව ශ්‍රී ලාංකික නැවක අයිතිකරු විසින් සහතික කරගත යුතු ය. විදේශීය නැවක් සම්බන්ධයෙන් වන විට දී, අදාළ වන නියෝග නැවේ කටයුතු කරන භාෂාවෙන් ලබාගත හැකි පරිදි නෞකාස්ථව තිබිය යුතු ය.

(10) ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින්, එහි වරායන්වලට පැමිණෙන හෝ එහි දේශීය හෝ අභ්‍යන්තර ජල තීරයන් පසු කරගෙන යන නැව්වල සේවය කරන මුහුදු යාත්‍රාකරුවන් සිය රට බලා යැවීම සහ නැවට ඔවුන් වෙනුවට යමකු පත් කිරීම සඳහා පහසුකම් සැලැස්විය යුතු ය.

(11) විශේෂයෙන්ම, යම් මුහුදු යාත්‍රාකරුවන්ට සිය රට බලා යාමට ඇති අයිතිය, නැවේ අයිතිකරුගේ මූල්‍යමය අවස්ථානුගත කරුණු හේතුවෙන් හෝ මුහුදු යාත්‍රාකරුවකු ඒ වෙනුවට පත් කිරීමට නැවේ අයිතිකරු අපොහොසත් වීම හෝ අකමැති වීම හේතුවෙන් ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

13. (1) නැවේ අයිතිකරු විසින්-

(අ) 12 වන නියෝගය යටතේ නියම කරන ලද විධිවිධානය සැලැස්වීමට අපොහොසත් වන්නේ නම්; හෝ

(ආ) මුහුදු යාත්‍රාකරුගේ පුද්ගලික අවස්ථානුගත කරුණු සහ අවශ්‍යතා සලකා බලා-

(i) ප්‍රමාණවත් ආහාර;

(ii) පානීය ජල සැපයුම්;

(iii) නවාතැන් පහසුකම්;

(iv) නැවේ දී ජීවිතාරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඉන්ධන; හෝ

(v) අවශ්‍ය වෛද්‍ය පහසුකම;

නොමැතිව මුහුදු යාත්‍රාකරුවාට වගකීම පැවරීම ඇතුළු, අවශ්‍ය නඩත්තුව සහ ආධාර නොමැතිව මුහුදු යාත්‍රාකරුවාට වගකීම පවරන්නේ නම්; හෝ

(ඇ) මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුම යටතේ මුහුදු යාත්‍රාකරු වෙත ගෙවිය යුතු වේතනයට අදාළව අවම වශයෙන් මාස දෙකක කාල සීමාවක් සඳහා ගෙවිය යුතු යම් මුදල් ප්‍රමාණයක් ගෙවීමට අපොහොසත් වීම ඇතුළු, මුහුදු යාත්‍රාකරු සමග ඇති බැඳීම් ඒක පාර්ශවිකව අවසන් කරන්නේ නම්,

නැවක් සම්බන්ධයෙන් මුහුදු යාත්‍රාකරුවා "අත්හැර දමනු ලබා ඇත්තේ ය."

(2) අදාළ කාලසීමාව අවසන් වීමෙන් පසුව, මුහුදු යාත්‍රාකරු විසින් නැවේ අඛණ්ඩව සේවය කරන්නේ නම්, නැවත සේවය කිරීම අරඹන්නේ නම් හෝ නෞකාස්ථව නව රැකියාවක් භාර ගන්නේ නම් හෝ නැවේ නෞකාස්ථ සේවයේ යෙදෙන්නේ නම්, අත්හැර දමන ලද මුහුදු යාත්‍රාකරුවකු නැවක් සම්බන්ධයෙන් අත්හැර දමනු ලැබීම අවසන් වන්නේ ය.

(3) "අදාළ කාලසීමාව" මුහුදු යාත්‍රාකරු අත්හැර දමනු ලබන දිනයෙන් ආරම්භ වන අතර පහත දැක්වෙන අවස්ථාවන්ගෙන් පළමුව එළඹෙන දිනයෙන් අවසන් වේ-

(අ) (i) මුහුදු යාත්‍රාකරුවාගේ නේවාසික රටට;

(ii) මුහුදු යාත්‍රාකරුවා සිය රට බලා යවනු ලබන අවස්ථාවේ දී මුහුදු යාත්‍රාකරු ආපසු යැවිය යුතු ස්ථානය වශයෙන් මුහුදු යාත්‍රාකරුවාගේ මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමේ විධිවිධාන සලස්වා ඇති ගමනාන්තය වෙත; හෝ

(iii) මුහුදු යාත්‍රාකරු විසින් -

(i) අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා; හෝ

(ii) මුහුදු යාත්‍රාකරුගේ සිය රට බලා යැවීම සඳහා විධිවිධාන සකස් කර ඇති යම් තැනැත්තකු;

සමග කල්තියා එකඟ වී ඇති යම් ස්ථානයක් වෙත;

මුහුදු යාත්‍රාකරුගේ පැමිණීම;

(ආ) සිය රට බලා යවනු ලැබීම හෝ මුහුදු යාත්‍රාකරුවාගේ සිය රට බලා යැවීම සඳහා සකස් කරන වැඩපිළිවෙලට සහාය දැක්වීම, මුහුදු යාත්‍රාකරු විසින් අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කිරීම;

(ඇ) අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා විසින් මුහුදු යාත්‍රාකරු සම්බන්ධ කර ගැනීමට සාධාරණ උත්සාහයන් ගෙන තිබෙන එහෙත් එසේ සම්බන්ධ කර ගැනීමට නොහැකිව තිබෙන මාස 3 ක කාලසීමාවක් ඉකුත්වීම;

(ඈ) මූල්‍ය සහාය තවදුරටත් අවශ්‍ය නොවන බවට මුහුදු යාත්‍රාකරුගෙන් ලිඛිත තහවුරු කිරීමක් අත්හැර දැමීමේ දී සුරැකුම් සපයන්නාට ලැබීම;

(ඉ) මුහුදු යාත්‍රාකරු මිය යාම.

14. (1) (අ) ශ්‍රී ලාංකික නැවක් සම්බන්ධයෙන් වන විට දී, නැව සම්බන්ධයෙන්, අත්හැර දැමීමේ සුරැකුමක් බලාත්මකව පවතින්නේ නම්; හෝ

(ආ) විදේශීය නැවක් සම්බන්ධයෙන් වන විට දී, සම්මුතියේ A2.5.2 වන ප්‍රමිතියේ 3 වන ඡේදයට අනුකූලව නැව සඳහා මූල්‍ය සුරැකුමක් (අත්හැර දමන ලද මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන මූල්‍ය සුරැකුම)පවතින්නේ නම් ,

මිස, නැවක් මෙහෙයවනු නොලැබිය යුතු ය.

(2) (1) වන අනුවගන්තිය උල්ලංඝනය කරන යම් නැව් අයිතිකරුවකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, ඊට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

15. (1) "අත්හැර දැමීමේ සුරැකුම" යන්නෙන්, -

(අ) නැව සම්බන්ධයෙන් අත්හැර දමනු ලබා ඇති යම් මුහුදු යාත්‍රාකරුවකු වෙනුවෙන් (2)(අ) සිට (ඇ) දක්වා වන අනුනියෝගවල අයිතමයන් ආවරණය කිරීමට ප්‍රමාණවත් යැයි නැවේ අයිතිකරු විසින් සාධාරණව සලකනු ලබන මුදල් ප්‍රමාණයක මූල්‍ය රක්ෂණයක් ලබා දෙන; සහ

(ආ) නැව සම්බන්ධයෙන් අත්හැර දමනු ලබා ඇති යම් මුහුදු යාත්‍රාකරුවකු-

(i) අත්හැර දැමීමේ හිමිකම්පෑමක් සිදු කිරීමට; සහ

(ii) (2)(අ) සිට (ඇ) දක්වා වන අනුනියෝගවල අයිතමයන්ට අදාළව මූල්‍ය සහාය ලබා ගැනීමට;

හිමිකම් ලබන බවට විධිවිධාන සලස්වන;

නැවකට අදාළව රක්ෂණ ගිවිසුමක් හෝ වෙනත් ආකාරයක සුරැකුමක් අදහස් වේ.

(2) (1) (අ) වන සහ (ආ) (ii) වන අනුනියෝගවල සඳහන් කරන ලද අයිතමයන් නම්-

(අ) අදාළ කාලසීමාව අවසන් වීමට පෙර මුහුදු යාත්‍රාකරු විසින් කරන ලද කාර්යයට අදාළව මාස හතරක් දක්වා නොගෙවූ වේතන;

(ආ) අදාළ කාලසීමාව ඇතුළත-

(i) ප්‍රමාණවත් ආහාර;
(ii) පානීය ජල සැපයුම්;
(iii) අවශ්‍ය විට දී, ඇඳුම් පැළඳුම්;
(iv) නවාතැන් පහසුකම්;
(v) නැවේ දී ජීවිතාරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය ඉන්ධන;
(vi) අවශ්‍ය වෛද්‍ය පහසුකම්;

සඳහා පිරිවැය;

(ඇ) (i) උචිත සංක්‍රමණ වැඩපිළිවෙල සඳහා වන පිරිවැය සහ ගමනට සම්බන්ධ යම් ආශ්‍රිත පිරිවැය, නමුත් මෙය මුහුදු යාත්‍රාකරු විසින් අත්හැර දමනු ලැබීම අවසන් කිරීමට පෙර සම්පූර්ණ කරන ලද සංක්‍රමණයකට හෝ ගමනකට සීමා විය හැකි ය; සහ

(ii) මුහුදු යාත්‍රාකරුවාගේ පුද්ගලික දේපළ ප්‍රවාහනය කිරීමේ පිරිවැය;

ඇතුළුව, සිය රට බලා යැවීමේ පිරිවැය; සහ

(ඇ) අත්හැර දමනු ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස අදාළ කාලසීමාව අවසන් වීමට පෙර මුහුදු යාත්‍රාකරු විසින් සාධාරණ ලෙස දරන ලද වෙනත් සියලු වියදම්.

(3) මේ නියෝගයේ-

"අත්හැර දැමීමේ හිමිකම් පෑම" යනු -

(අ) (i) අත්හැර දමනු ලැබූ මුහුදු යාත්‍රාකරුවකු විසින්; හෝ

(ii) මුහුදු යාත්‍රාකරු වෙනුවට කටයුතු කිරීමට මුහුදු යාත්‍රාකරු විසින් බලය ලබා දී ඇති තැනැත්තකු විසින්,

අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා වෙත සෘජුවම ඉදිරිපත් කරන ලද; සහ

(ආ) මුහුදු යාත්‍රාකරු අත්හැර දමනු ලබා ඇති බව පෙන්වන සාක්ෂි මගින් තහවුරු කරන ලද,

මූල්‍ය ආධාර සඳහා හිමිකම් පෑමක් වේ.

16. (1) මේ නියෝගය, අත්හැර දැමීමේ හිමිකම්පෑමක් කරනු ලබන අවස්ථාවක දී අදාළ වේ.

(2) අත්හැර දැමීමේ හිමිකම්පෑම ඉදිරිපත් කරනු ලබන්නේ කවර අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා වෙත ද, එම අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා විසින් හිමිකම් පෑම ලැබීමෙන් දින 7 ක් ඇතුළත, මුහුදු යාත්‍රාකරු මූල්‍ය ආධාරයක් ලැබීමට හිමිකම් ලබන්නේ ද යන්න තීරණය කළ යුතු ය.

(3) යම් අත්හැර දැමීමේ හිමිකම් පෑමකට පූර්ණ වශයෙන් හෝ යම් අර්ධ වශයෙන් අදාළව මූල්‍ය ආධාර ලැබීමට මුහුදු යාත්‍රාකරු හිමිකම් ලබන බව තීරණය කරන අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නකු විසින්, හිමිකම්පෑම ලැබීමෙන් දින 14 ක් ඇතුළත, තීරණය කරනු ලැබීමට තවදුරටත් හිමිකම්පෑමේ කොටස් තිබුණ ද නොතිබුණද, එම ආධාරය ලබා දිය යුතු ය.

(4) (2) වන අනුනියෝගය උල්ලංඝනය කරමින්, පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් යම් අත්හැර දැමීමේ හිමිකම් පෑමකට අදාළව මූල්‍ය ආධාර ලැබීමට මුහුදු යාත්‍රාකරුවා හිමිකම් ලබන්නේ ද යන්න තීරණය කිරීමට අපොහොසත් වන අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නකු විසින්, හිමිකම්පෑම ලැබීමෙන් දින 14 ක් ඇතුළත මුහුදු යාත්‍රාකරු විසින් හිමිකම්පාන ලද මුදලකින් මූල්‍ය ආධාර වශයෙන් ලබා දිය යුතු ය.

(5) (3) වන හෝ (4) වන අනුනියෝගය උල්ලංඝනය කරමින් මූල්‍ය ආධාර ලබා නොදෙන ලද අවස්ථාවක දී, අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා විසින්, හිමිකම්පෑම ලැබුණු දින සිට වර්ෂයකට 20%ක අනුප්‍රමාණයකින් නොගෙවූ මුදල මත පොළියක් ගෙවිය යුතු ය.

(6) (අ) (3) වන අනුනියෝගය යටතේ මුහුදු යාත්‍රාකරුවකුට මූල්‍ය ආධාර ලබා දී ඇති; සහ

(ආ) මුහුදු යාත්‍රාකරුවා මූල්‍ය ආධාර ලැබීමට හිමිකම් නොලබන බව පසුව තීරණය කරන,

යම් අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නකු විසින්, (5) වන අනුනියෝගය යටතේ ගෙවිය යුතු යම් පොළිය නොමැතිව මූල්‍ය ආධාර මුදල සිවිල් ණයක් වශයෙන් නැවත අයකර ගනු ලැබිය හැකි ය.

(7) මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් සිදු කරනු ලබන අතර ඊට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වසරකට නොවැඩි කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(8) මේ නියෝගයේ, "අත්හැර දැමීමේ හිමිකම්පෑම" යන්නට 15 වන නියෝගයේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

17. අත්හැර දමනු ලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන්, නැවේ අයිතිකරුට එරෙහිව, මූල්‍ය ආධාර සම්බන්ධයෙන්, මුහුදු යාත්‍රාකරු-වකුට ඇති (හෝ නමුත් එම මුදල ගෙවීම සඳහා තිබිය හැකි) යම් අයිතීන්, අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා වෙත මාරු කිරීම සහ පැවරීම සිදු කරනු ලැබේ.

18. (1) (අ) ශ්‍රී ලාංකික නැවක අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින්, නැවට අදාළව බල පවත්නා අත්හැර දැමීමේ සුරැකුම සඳහා. අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා විසින් නිකුත් කරන ලද සම්මුතියේ A-2-1 වන උපග්‍රන්ථයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු අන්තර්ගත වන අත්හැර දැමීමේ සුරැකුම් ලේඛනය නැවේ රැගෙන යනු ලබන බවට සහතික විය යුතු ය.

(ආ) විදේශීය නැවක අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින්, නැවට අදාළව මූල්‍ය සුරැකුම් සපයන්නා විසින් නිකුත් කරන ලද, සම්මුතියේ A-2-1 වන උපග්‍රන්ථයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු අන්තර්ගත වන බලපවත්නා සහතිකය හෝ වෙනත් ලේඛනගත සාක්ෂි නැවේ රැගෙන යනු ලබන බවට සහතික විය යුතු ය;

(ඇ) නැවේ අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින්, ඉහත (1අ) වන සහ (1ආ) වන අනුනියෝගවල සඳහන් කරන ලද ඉංග්‍රීසි භාෂාවෙන් නොපවතින ලේඛනවල ඒවායෙහි ඉංග්‍රීසි භාෂා පරිවර්තනයක් සහිත බවට සහතික විය යුතු ය; සහ

(ඈ) නැවේ අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින්, ඉහත (අ) වන ඡේදයේ සඳහන් කරන ලද ලේඛන ඒවායෙහි යම් ඉංග්‍රීසි භාෂා පරිවර්තන සමඟ නැවේ පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලබන බවට සහතික විය යුතු ය.

(2) (1) වන අනුනියෝගය උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර ඊට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

19. (1) අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නා විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අවම වශයෙන් දින තිහක පූර්ව දැන්වීමක් ලබා දෙන්නේ නම් පමණක්, යම් අත්හැර දැමීමේ සුරැකුමක වලංගු කාලසීමාව අවසන් වීමට පෙර අත්හැර දැමීමේ සුරැකුම් සපයන්නකු විසින් එය අවසන් කිරීම බලාත්මක වන්නේ ය.

(2) (1) වන නියෝගය යටතේ වන දැන්වීමක්-

(අ) ලිඛිතව තිබිය යුතු ය; සහ

(ආ) අත්හැර දැමීමේ සුරැකුම් ලේඛනයේ පිටපතක් ඇතුළත්ව තිබිය යුතු ය.

20. (1) නැවකට අදාළ වන යම් අත්හැර දැමීමේ සුරැකුමක් එහි වලංගු කාල සීමාව අවසන් වීමට පෙර අවසන් කරනු ලැබීමට නියමිත බව හෝ අවසන් කරනු ලැබ ඇති බව නැවේ අයිතිකරු විසින් දැනගනු ලබන අවස්ථාවක, නැවේ අයිතිකරු විසින්, තත්කාර්ය සඳහා වන දැන්වීම, දැනුම්දීමේ කාලසීමාව අතරතුර නැවේ සේවය කරන සියලු මුහුදු යාත්‍රාකරුවන්ට ලබා දිය යුතු ය.

(2) (1) වන අනුනියෝගය යටතේ වන දැන්වීමක්-

(අ) ලිඛිතව තිබිය යුතු ය;

(ආ) අත්හැර දැමීමේ සුරැකුම අවසන් කරනු ලැබීමට නියමිත හෝ අවසන් කරන ලද දිනය දැක්විය යුතු ය; සහ

(ඇ) අත්හැර දැමීමේ සුරැකුම අවසන් කරනු ලැබීමට නියමිත බව හෝ අවසන් කරන ලද බව නැවේ අයිතිකරු විසින් දැනගනු ලැබීමෙන් පසුව ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් දෙනු ලැබිය යුතු ය.

(3) මේ නියෝගයේ, "දැනුම්දීමේ කාලසීමාව" යන්නෙන්-

(අ) අත්හැර දැමීමේ සුරැකුම එහි වලංගු කාලසීමාව අවසන් වීමට පෙර අවසන් කරනු ලැබීමට නියමිත බව හෝ අවසන් කරනු ලැබ ඇති බව නැවේ අයිතිකරු විසින් දැන ගනු ලබන දිනයෙන් ආරම්භ වන; සහ

(ආ) අත්හැර දැමීමේ සුරැකුම ප්‍රතියෝජනය කරනු ලැබ ඇති බව හෝ කලින් තිබූ තත්ත්වයට ආපසු පත් කරනු ලැබ ඇති බව නැවේ අයිතිකරු දැන ගනු ලබන දිනයෙන් අවසන් වන; සහ

කාලසීමාව අදහස් වේ.

21. (1) මේ නියෝගය, ගිලෙන හෝ නැති වූ නැවක නෞකාස්ථව සේවය කරන මුහුදු යාත්‍රාකරුවකු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(2) නැව ගිලීම හෝ නැතිවීම හේතුවෙන් මුහුදු යාත්‍රාකරු රැකියා විරහිත බවට පත්වුවහොත්, නැවේ අයිතිකරු විසින්, නැව නැතිවීම හෝ ගිලීම සිදු වූ දිනට පසුව එළඹෙන දිනෙන් ආරම්භ වන මාස දෙකක කාලසීමාව තුළ මුහුදු යාත්‍රාකරුවා රැකියා විරහිත වූ සෑම දිනයක් සඳහාම මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුම යටතේ අන්‍යාකාරයකින් ගෙවනු ලබා තිබිය යුතුවූ වේතනයට සමාන මුදලක් මුහුදු යාත්‍රාකරු වෙත ගෙවනු ලැබිය යුතු ය.

(3) නැව ගිලීම හෝ නැතිවීම හේතුවෙන් මුහුදු යාත්‍රාකරුට ((2) වන අනුනියෝගයේ සඳහන් කරන ලද වේතන අහිමිවීම හැර) තුවාලයක් හෝ හානියක් සිදුවුවහොත්, නැවේ අයිතිකරු විසින්, මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති පරිදි මුහුදු යාත්‍රාකරු වෙත වන්දියක් ගෙවනු ලැබිය යුතු ය.

(4) පුද්ගලික හානියක් හෝ මරණයක් නොවන (දේපළ) අහිමිවීමක් සම්බන්ධයෙන්, (3) වන අනුනියෝගයේ කාර්යය, මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුමේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණයට (තිබේ නම්) සීමා වන්නේ ය.

(5) (2) වන හෝ (3) වන අනුනියෝග යටතේ ලැබිය යුතු යම් මුදලක් සිවිල් ණයක් වශයෙන් මුහුදු යාත්‍රාකරු විසින් නැවේ අයිතිකරුගෙන් අයකර ගනු ලැබිය හැකි ය.

22. (1) 2016 ඔක්තෝබර් මස 4 වැනි දින අංක 1987/19 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2016 වෙළඳ නැව් (අවම ආරක්ෂක පිරිස් යෙදවීමේ) නියෝගවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද අවම ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයට අනුව එක් එක් නැවේ නෞකාස්ථ සේවයේ නියුක්ත කළ යුතු බව සහ එවිට, මුහුදු යාත්‍රාකරුගේ විඩාව සහ මුහුදු ගමනේ විශේෂ ස්වභාවය සහ තත්ත්වයන් පිළිබඳ කාරණා සැලකිල්ලට ගනිමින්, සියලු තත්ත්වයන් යටතේ නැව් ආරක්ෂිතව, කාර්යක්ෂමව සහ සුරක්ෂිතතාවය කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වමින් මෙහෙයවනු ලබන බව නැවේ අයිතිකරු විසින් සහතික කර ගත යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද පරිදි අවම ආරක්ෂක පිරිස් යෙදවීමේ ලේඛනයට අනුකූලව, සියලු මෙහෙයුම් තත්ත්ව යටතේ, නැවේ සහ එහි සේවක පිරිසෙහි ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීමට, සෑම නැවක්ම ප්‍රමාණය සහ සුදුසුකම් ප්‍රකාරව, ප්‍රමාණවත් සේවක පිරිසක් විසින් මෙහෙයවනු ලබන බව නැවේ අයිතිකරු විසින් සහතික කර ගත යුතු ය.

(3) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පිරිස් යෙදවීමේ මට්ටම් තීරණය කිරීමේ දී 24 වන නියෝගයේ සියලු නියමයන් ද සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

## IV වන කොටස

***නවාතැන් පහසුකම්, විනෝදාත්මක පහසුකම්, ආහාර සහ අවශ්‍ය දේ සැපයීම.***

23. (1) නැවක අයිතිකරු විසින්, නැවේ සේවක පිරිසෙහි නවාතැන් පහසුකම් සම්බන්ධයෙන්-

(අ) මුහුදු යාත්‍රාකරුවන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම ඉහළ නැංවීමට ගැලපෙන, නෞකාස්ථව සේවය කරන හෝ ජීවත් වන මුහුදු යාත්‍රාකරුවන් සඳහා උචිත නවාතැන් පහසුකම් සහ විනෝදාත්මක පහසුකම් තිබෙන බව;

(ආ) නැව මේ නියෝග බලාත්මක වීමට පෙර දිනයක ඉදි කරන ලද්දේ නම් එම නැව, 1949 (අංක 92) සේවක පිරිස්වල නවාතැන් පහසුකම් පිළිබඳ සම්මුතියේ (ප්‍රතිශෝධිත) සහ 1970 (අංක 133) සේවක පිරිස්වල නවාතැන් පහසුකම් (අතිරේක විධිවිධාන) සම්මුතියේ දක්වා ඇති නැව් ඉදිකිරීමට සහ උපකරණ සම්පාදනය කිරීමට අදාළ යම් නියමයන්ට (තිබේ නම්) අනුකූලව ඉදිකිරීම සහ උපකරණ සම්පාදනය කිරීම කරනු ලබන බව,

සහතික කර ගත යුතු ය.

(2) (1) (අ) අනුනියෝගයේ සඳහන් නවාතැන් සහ විනෝදාත්මක පහසුකම්, ඊට අදාළව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පළ කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්ට අනුකූලව තිබිය යුතු ය.

(3) නැවේ නෞකාධිපතිවරයා හෝ නෞකාධිපතිවරයා විසින් එම කාර්යය සඳහා පත් කරන ලද යම් නිලධරයකු විසින්, දින හතක් නොඉක්මවන කාල අන්තරවල දී සහ අවම වශයෙන් සේවක පිරිසෙන් එක් සාමාජිකයකු කැටුව, සේවක පිරිසෙහි නවාතැන් පිරිසිදුව, ශිෂ්ට සම්පන්න ලෙස වාසයට සුදුසු බව සහ අලුත්වැඩියා කිරීමේ යහපත් තත්ත්වයකින් නඩත්තු කරනු ලබන බව සහතික කර ගැනීම සඳහා ඒවා පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(4) නැවේ නෞකාධිපතිවරයා හෝ නෞකාධිපතිවරයා විසින් එම කාර්යය සඳහා පත් කරන ලද යම් නිලධරයකු විසින්, (2) වන අනුනියෝගයට අදාළව පවත්වන ලද පරීක්ෂා කිරීම්වල ප්‍රතිඵල-

(අ) පරීක්ෂා කිරීම පැවැත්වූ දිනය සහ වේලාව;

(ආ) පරීක්ෂා කිරීම සිදු කරන ලද එක් එක් තැනැත්තාගේ නම සහ නිලය; සහ

(ඇ) පරීක්ෂා කිරීම සිදු කරන යම් තැනැත්තකු විසින්, සේවක පිරිසෙහි නවාතැන් පහසුකම් මේ නියෝගවලට අනුකූල නොවන බව හඳුනාගනු ලබන්නේ යම් සම්බන්ධයකින් ද එහි විස්තර,

නිශ්චිතව දක්වමින් නැවේ නිල ලොග් පොතෙහි වාර්තා කරනු ලැබිය යුතු ය.

24. (1) (අ) (i) නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවන් සංඛ්‍යාව සහ මුහුදු ගමනේ ස්වරූපය, ස්වභාවය සහ කාලසීමාව; සහ

(ii) නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවන්ගේ ආහාර සම්බන්ධයෙන් විවිධ ආගමික අවශ්‍යතාවන් සහ සංස්කෘතික භාවිතයන්;

සැලකිල්ලට ගනිමින්, ප්‍රමාණය සහ ගුණාත්මකභාවය අතින් සහ ආහාර සම්බන්ධයෙන්, පෝෂණීය අගය සහ විවිධත්වය අතින් සුදුසු වන;

(ආ) රෝගී තත්ත්වයකට සෞඛ්‍යයට සිදුවන හානියකට හේතු වීමට ඉඩ ඇති හෝ යම් දෙයක් හෝ ආහාර හෝ පානීය ජලය නීරස කරවන යම් දෙයක් අන්තර්ගත නොවන; සහ

(ඇ) අන්‍යාකාරයකින් පරිභෝජනයට සුදුසු වන,

ආහාර සහ පානීය ජලය නැවේ නෞකාස්ථව සපයනු ලබන බවට නැවේ අයිතිකරු සහ නෞකාධිපති-වරයා විසින් සහතික විය යුතු ය.

(2) (අ) (1) වන අනුනියෝගයට අනුකූලව සපයනු ලබන ආහාර සහ පානීය ජලය සියලු මුහුදු යාත්‍රාකරුවන් නෞකාස්ථව සිටින කාලය තුළ ඔවුන්ට නොමිලේ සපයනු ලබන බවට;

(ආ) නැවේ ආහාර සැපයුම් අංශය, මුහුදු යාත්‍රාකරුවන්ට, සෞඛ්‍යාරක්ෂිත තත්ත්වයන් යටතේ පිළි-යෙල කරනු ලබන සහ පිළිගන්වනු ලබන ප්‍රමාණවත්, විවිධ සහ පෝෂ්‍යදායී ආහාර සැපයීමට ඉඩ සැලැස්වීම සඳහා සංවිධානය වී සහ සන්නද්ධව ඇති බවට;

(ඇ) ආහාර පිළියෙල කිරීම සහ ගබඩා කිරීම, නැවේ නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවන්ට ආහාර පිළිගැන්වීම හෝ නැවේ මුළුතැන් කුටියේ හෝ ආහාර ගබඩා කරනු ලබන හෝ පරිහරණය කරනු ලබන ස්ථානවල වෙනත් කාර්ය තම සාමාන්‍ය රාජකාරීවලට ඇතුළත් වන මුහුදු යාත්‍රාකරුවන් ඔවුන්ගේ තනතුරු සඳහා නිසි පරිදි පුහුණු කරනු ලැබ හෝ උපදෙස් දෙනු ලැබ ඇති බවට;

(ඈ) නැවේ මුළුතැන් කුටියේ ආහාර සකස් කරන යම් තැනැත්තකු, ආහාර සහ පුද්ගලික සනීපාරක්ෂාව සහ නැවේ ආහාර පරිහරණය කිරීම සහ ගබඩා කිරීම ඇතුලු අංශවලින් පුහුණු කරනු ලැබ හෝ උපදෙස් දෙනු ලැබ ඇති බවට;

නැවේ අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින් සහතික විය යුතු ය.

(3) නැවේ කෝකිවරුන් වශයෙන් සේවයේ නිරත වන මුහුදු යාත්‍රාකරුවන්, මේ නියෝගවල දක්වා ඇති නියමයන්ට අනුකූලව පුහුණු වී, සුදුසුකම් ලබා සහ දක්ෂ යැයි තීරණය කරනු ලැබ ඇති බවට සහ ශ්‍රී ලාංකික නැවක් සම්බන්ධයෙන් වන විට, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ද විදේශීය නැවක් සම්බන්ධයෙන් වන විට ධජය දරන රාජ්‍යයේ නියෝග මගින් ද නිකුත් කරනු ලබන නැවක කෝකිවරයකු වශයෙන් නිපුණතා සහතිකයක් දරනු ලබන බවට නැවේ අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින් සහතික විය යුතු ය.

(4) සතියකට එක් වරකට නොඅඩු වාර ගණනක්-

(අ) මේ නියෝගයේ (1) වන සහ (2) වන අනුනියෝග සමඟ අනුකූලතාව පරීක්ෂා කර බැලීම සඳහා නැවේ ආහාර සහ පානීය ජල සැපයුම් පරීක්ෂා කරනු ලබන බවට; සහ

(ආ) (2) වන අනුනියෝගය සමඟ අනුකූලතාවය පරීක්ෂා කර බැලීම සඳහා ආහාර සැපයීමේ අංශය සහ එහි උපකරණ පරීක්ෂා කරනු ලබන බවට;

නැවක නෞකාධිපතිවරයා විසින් සහතික විය යුතු ය.

(5) (4) වන අනුනියෝගය යටතේ යම් පරීක්ෂා කිරීමක්-

(අ) නැවේ නෞකාධිපතිවරයා විසින්; හෝ

(ආ) නෞකාධිපතිවරයා විසින් බලය පවරන ලද තැනැත්තා විසින්;

(ඇ) ආහාර සැපයීමේ කාර්ය මණ්ඩලයේ එක් සාමාජිකයකු සමඟ එක්ව,

පවත්වනු ලැබිය යුතු ය.

(6) (4) වන අනුනියෝගය යටතේ වන යම් පරීක්ෂා කිරීමක ප්‍රතිඵල නැවේ නිල ලොග් පොතෙහි වාර්තා කරනු ලබන බවට නැවේ නෞකාධිපතිවරයා විසින් සහතික විය යුතු ය.

25. (1) දහදෙනෙකුට වැඩි නියමිත පිරිස් යෙදවීමක් සහිතව මෙහෙයවනු ලබන නැවක්, සුදුසුකම්ලත් නැවක කෝකිවරයකු නෞකාස්ථව සිටින්නේ නම් මිස මුහුදට ගමන් නොකළ යුතු ය.

(2) විශේෂ අවශ්‍යතාවක් සහිත අවස්ථානුගත කරුණුවල දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්-

(අ) ඊළඟට ගමන් කරන වරාය තෙක්; හෝ

(ආ) මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා,

එසේ වුවද, නැවේ ආහාර සහ පුද්ගලික සනීපාරක්ෂාව සහ නැවේ ආහාර ආරක්ෂිතව පරිහරණය කිරීම සහ ගබඩා කිරීම ඇතුළු අංශවලින් පුහුණු කරනු ලැබ ඇති හෝ උපදෙස් දෙනු ලැබ ඇති තැනැත්තකු නැවේ නෞකාස්ථව සිටින්නේ නම්, (1) වන අනුනියෝගයේ නියමයන්ගෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) මුහුදු යාත්‍රාකරුවකු නැවක කෝකිවරයකු වශයෙන් සුදුසුකම් ලැබීම සඳහා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නැවක කෝකිවරයකු වශයෙන් නිපුණතා සහතිකය නිකුත් කිරීම සඳහා, මුහුදු යාත්‍රාකරුවා;

(අ) වයස අවුරුදු දහඅටට නොඅඩු විය යුතු ය;

(ආ) 2016 ඔක්තෝබර් මස 4 වන දිනැති අංක 1987/19 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ හා මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝගවලට අනුකූලව නිකුත් කරන ලද වලංගු වෛද්‍ය සහතිකයක් දැරිය යුතු ය;

(ඇ) සම්මුතියේ A3.2 වන ප්‍රමිතියේ දක්වා ඇති නැවක කෝකිවරයකු සඳහා වන නියමයන් සපුරාලන අනුමත පුහුණු කිරීමේ වැඩසහටනක් සම්පූර්ණ කර තිබිය යුතු ය; සහ

(ඈ) 2016 ඔක්තෝබර් 4 වන දිනැති, අංක 1987/19 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ හා මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝගවලට අනුකූලව, පුද්ගලික ගැලවීමේ ශිල්පීය ක්‍රම, ගිනි නිවාරණය සහ ගිනි නිවීම, මූලික ප්‍රථමාධාර, පුද්ගලික ආරක්ෂාව සහ සමාජීය වගකීම් සහ ආරක්ෂාව පිළිබඳ දැනුවත්භාවය පිළිබඳ අනුමත කළ පුහුණුව ලබා තිබිය යුතු ය.

(4) (3) වන අනුනියෝගයේ සඳහන් අනුමත පුහුණු වැඩසටහන අනුගමනය කිරීමට නියමිත මුහුදු යාත්‍රාකරුවකු විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද පරීක්ෂණය සඳහා වූ ආචාර ධර්ම සංග්‍රහයේ නියම කර ඇති යෝග්‍යතා නිර්ණායක සපුරා තිබිය යුතු ය.

(5) මේ නියෝගය යටතේ නිකුත් කරන ලද සියලු නිපුණතා සහතික පිළිබඳ සහ එවැනි යම් සහතිකයක් අත්හිටුවීම, අවලංගු කිරීම හෝ වෙනස් කිරීම සහ එයට බලපාන වෙනත් යම් කාරණා පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තබනු ලැබිය යුතු ය.

(6) මේ නියෝගය යටතේ නිකුත් කරන ලද සියලු නිපුණතා සහතික සත්‍යාපනය කිරීමේ විධි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සපයනු ලැබිය යුතු ය.

(7) (අ) 24(3) නියෝගයේ සඳහන් නිපුණතා සහතිකය එය නිකුත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වලංගු වන්නේ ය.

(ආ) ඉහතින්ම වූ අවුරුදු පහක කාලසීමාව තුළදී නැවෙහි දී ආහාර සහ ආහාර පිසීම් ක්ෂේත්‍රයේ අවම වශයෙන් මාස තුනක මුහුදු සේවා කාලයක් සහිත යම් මුහුදු යාත්‍රාකරුවකු නැවෙහි කෝකිවරයකු වශයෙන් නිපුණතා සහතිකය නැවත වලංගුකරවා ගැනීම සඳහා යෝග්‍ය වන්නේ ය.

(ඇ) (ආ) උපනියෝගයේ විස්තර කර ඇති පරිදි මුහුදු සේවාවක් අත්කරගෙන නොමැති යම් මුහුදු යාත්‍රාකරුවකු විසින් නිපුණතා සහතිකය නැවත වලංගු කරවා ගැනීම සඳහා අදාළ අලුත් කිරීමේ සහ යාවත්කාලීන කිරීමේ පුහුණු පාඨමාලාව හැදෑරීමට යටත් විය යුතු ය.

(ඈ) නැවක කෝකියකු වශයෙන් වූ නිපුණතා සහතිකය නැවත වලංගු කරවා ගැනීම සඳහා යම් මුහුදු

යාත්‍රාකරුවකු විසින් 2016 ඔක්තෝබර් 4 දිනැති අංක 1987/19 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 2016 වෙළඳ නැව් (මුහුදු යාත්‍රාකරුවන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති) නියෝග ප්‍රකාරව නිකුත් කරන ලද වලංගු වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(8) බලාත්මකව පවතින සහ මේ නියෝග බලාත්මක වන දිනයේ අත්හිටවනු නොලැබූ නැවේ අරක්කැමියකු වශයෙන් පවතින අනුකූලතා සහතික, මේ නියෝගය යටතේ නිකුත් කරන ලද නැවේ අරක්කැමියකු වශයෙන් වන නිපුණතා සහතිකයක් ලෙස බලපැවැත් වේ.

26. මේ කොටසේ යම් විධිවිධානයක් උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර එහි වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

## V වන කොටස

### *සෞඛ්‍ය ආරක්ෂණය, වෛද්‍ය උවටැන්, සුබසාධනය සහ සමාජ සුරක්ෂිතතා ආරක්ෂණය*

27. (1) නෞකාවේ අයිතිකරු, නෞකාධිපති සහ නැවක මුහුදු යාත්‍රාකරු විසින්-

(අ) අවශ්‍ය ඖෂධ, රෝග විනිශ්චය සහ ප්‍රතිකාර සඳහා වන වෛද්‍ය උපකරණ සහ පහසුකම් සහ වෛද්‍ය තොරතුරු සහ විශේෂඥතාව වෙත ඉක්මණින් ප්‍රවේශවීම ඇතුළු වෙරළ සේවයේ යෙදී සිටින සේවකයන්ට සාමාන්‍යයෙන් ලබා දෙන සෞඛ්‍ය ආරක්ෂණය සහ වෛද්‍ය සත්කාරයට හැකිතාක් සමාන අත්‍යවශ්‍ය දන්ත උවටැන් ඇතුළු සෞඛ්‍ය ආරක්ෂණය සහ වෛද්‍ය උවටැන් මුහුදු යාත්‍රාකරුවන් වෙත ලබා දී ඇති බවට;

(ආ) ප්‍රායෝගික වේ නම්, නැවතුම් වරායන්හි දී ප්‍රමාදවීමකින් තොරව සුදුසුකම්ලත් වෛද්‍යවරයකු හෝ දන්ත වෛද්‍යවරයකු හමුවීමේ අයිතිය මුහුදු යාත්‍රාකරුවන් වෙත ලබා දී ඇති බවට;

(ඇ) සෞඛ්‍ය ප්‍රවර්ධන හා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් වැනි රෝගවලින් වැළකීසිටීමේ පියවර මුහුදු යාත්‍රාකරුවන් වෙත ලබා දී ඇති බවට;

(ඈ) මුහුදු යාත්‍රාකරුවන්ගේ වෛද්‍ය තොරතුරු රහසිගතව තබා ගන්නා බව සහ අදාළ මුහුදු යාත්‍රාකරුගේ ප්‍රතිකාර සඳහා පහසුකම් සැලසීමට පමණක් භාවිත කරන බවට;

(ඉ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පළ කරන ලද ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් මගින් නියම කරනු ලබන නියමයන්ට අනුකූලව එකී විස්තරයේ ඇති නැව්වලට අදාළව බෙහෙත් පැසක් සහ වෛද්‍ය උපකරණ නැවේ රැගෙන යන බවට,

සහතික විය යුතු ය.

(2) (අ) සියයක් හෝ ඊට අධික පිරිසක් නැවේ රැගෙන යනු ලබන්නේ නම්; සහ

(ආ) පැය හැත්තෑ දෙකකට වඩා වැඩි කාලයක් ගතවන ජාත්‍යන්තර මුහුදු ගමනක නැව නිරත වන්නේ නම්,

සුදුසුකම්ලත් වෛද්‍යවරයකු නැවේ රැගෙන යනු ලබන්නේ නම් මිස, නැව ක්‍රියානොකරනු ලැබිය යුතු ය.

(3) (2) වන අනු-නියෝගය යටතේ සුදුසුකම්ලත් වෛද්‍යවරයකු නැවේ රැගෙනයාමට අවශ්‍ය නොවන නැව්වලට සහ සාමාන්‍යයෙන් පැය අටක කාලයක් තුළ සුදුසුකම්ලත් වෛද්‍ය උවටැන් සහ වෛද්‍ය පහසුකම් වෙත ළඟාවීමේ හැකියාව ඇති නැව්වලට,

STCW සම්මුතියේ නියමයන් සපුරාලන වෛද්‍ය ප්‍රථමාධාර පිළිබඳ පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති යටත් පිරිසෙයින් එක් මුහුදු යාත්‍රාකරුවකු හෝ තබා ගැනීමට නියම කරනු ලැබේ.

(4) (2) වන අනු-නියෝගය යටතේ සුදුසුකම්ලත් වෛද්‍යවරයකු නැවේ රැගෙනයාමට අවශ්‍ය නොවන නැව්වලට සහ සාමාන්‍යයෙන් පැය අටක කාලයක් තුළ සුදුසුකම්ලත් වෛද්‍ය උවටැන් සහ වෛද්‍ය පහසුකම් වෙත ළඟාවීමේ හැකියාව ඇති නැව්වලට, STCW සම්මුතියේ නියමයන් සපුරාලන වෛද්‍ය උවටැන් පිළිබඳ පුහුණුව සතුටුදායක ලෙස සම්පූර්ණ කර ඇති යටත් පිරිසෙයින් එක් මුහුදු යාත්‍රාකරුවකු හෝ තබාගැනීමට නියම කරනු ලැබේ.

(5) (3) වන සහ (4) වන අනු-නියෝගවල සඳහන් මුහුදු යාත්‍රාකරුවන් විසින්, අවුරුදු පහක් නොඉක්මවන කාලාන්තරය-න්හි දී, ඔවුන්ගේ දැනුම හා නිපුණතා පවත්වාගෙන යාමට හා වැඩිකර ගැනීමට සහ නව සංවර්ධනයන් හා යාවත්කාලීන සංස්කරණ පාඨමාලා හදාරනු ලැබිය යුතු ය.

(6) මේ නියෝගයට අනුකූලව නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවකුට ලබා දෙන වෛද්‍ය සහ දන්ත උවටැන්, ඔවුන් නෞකාස්ථව ගමන් කරන අතරතුර හෝ විදේශීය වරායකට ළඟාවන අතරතුර හෝ විදේශීය වරායකට ළඟාවන අතරතුර සියලුම මුහුදු යාත්‍රාකරුවන් වෙත නොමිලයේ ලබාදෙන බවට නෞකාවේ අයිතිකරු සහ නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුගේ සේවා යෝජකයා විසින් සහතික විය යුතු ය.

(7) ශ්‍රී ලංකාවේ නැව්වල නෞකාධිපතිවරු සහ අදාළ වෙරළබඩ හා නෞකාස්ථ වෛද්‍ය සේවය පිරිස විසින් වෛද්‍ය පරීක්ෂණයට අදාළව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ප්‍රමිතිගත වෛද්‍ය වාර්තා ආකෘති පත්‍රය භාවිත කරනු ලැබිය යුතු ය. සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය සහ එහි ඇතුළත් දේ රහසිගත ලෙස තබාගත යුතු අතර ඒවා මුහුදු යාත්‍රාකරුවන්ගේ ප්‍රතිකාර සඳහා පහසුකම් සැලසීමට පමණක් භාවිත කළ යුතු ය.

(8) සියලු බෙහෙත් ලේබල් කිරීම, ඒවායෙහි කල් ඉකුත්වීමේ දින සහ ඒවා ගබඩා කිරීමේ තත්ත්වයන් සහ ඒවා භාවිතකිරීම සඳහා වන උපදෙස් පරීක්ෂා කර ඇති බව සහ සියලුම උපකරණ නියමිත පරිදි ක්‍රියාකරන බවට සහතික විය යුතු අධ්‍යක්ෂ-ජනරාල්-වරයා නම් කරනු ලබන තැනැත්තන් විසින්, බෙහෙත් පැස සහ එහි ඇතුළත් දේ මෙන්ම නෞකාවේ රැගෙන යනු ලබන වෛද්‍ය උපකරණ සහ වෛද්‍ය මාර්ගෝපදේශය, මාස 12 ක් නොඉක්මවන විධිමත් කාලාන්තරයන් හි දී නිසි ලෙස පවත්වාගෙන යා යුතු අතර පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(9) (8) වන අනු-නියෝගය ප්‍රකාරව, අනුමත වෛද්‍ය වෘත්තිකයන් හෝ ලියාපදිංචි ඖෂධවේදීන්, නම් කරන ලද තැනැත්තන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) (අ) ශ්‍රී ලංකාවේ නෞකාධිපතිවරයකු විසින්; සහ

(ආ) 1972 අංක 10 දරන නෞකා නියෝජිතයන්ට බලපත්‍ර ලබාදීමේ පනත යටතේ බලපත්‍රලත් සහ විදේශීය නෞකා-වක් ශ්‍රී ලංකාවේ වරායක සිටින විට නාවික පිරිස සම්බන්ධ කටයුතුවල යෙදෙන නෞකා නියෝජිතයා විසින්,

යම් නෞකාවක සේවයේ යොදවනු ලැබූ මුහුදු යාත්‍රාකරුවන්ට-

(i) අසනීපයක් සහ තුවාලයක් සඳහා බාහිර රෝගී ප්‍රතිකාර වෙත;

(ii) අවශ්‍ය අවස්ථාවල දී රෝහල් ගතවීම සඳහා; සහ

(iii) දන්ත ප්‍රතිකාර සඳහා වන පහසුකම් සඳහා,

ප්‍රවේශ විය හැකි බවට සහතික වීම සඳහා අවශ්‍ය හා ප්‍රායෝගික පියවර ගනු ලැබිය යුතු ය.

(11) (අ) විශේෂඥ උපදෙස් ඇතුළු මුහුදේ ඇති නෞකාවලට රේඩියෝ හෝ චන්ද්‍රිකා සන්නිවේදනය ඔස්සේ වෛද්‍ය උපදෙස් දවසේ පැය විසිහතර පුරාවටම ලබාගත හැකි බවට නෞකාවේ අයිතිකරු විසින් පෙර සකස් කරන ලද පද්ධතියක් මගින් සහතික විය යුතු ය.

(12) නැවක් සහ වෙරළෙහි සිට උපදෙස් දෙන තැනැත්තන් අතර රේඩියෝ හෝ චන්ද්‍රිකා සන්නිවේදනය ඔස්සේ වෛද්‍ය පණිවිඩ ඉදිරියට සම්ප්‍රේෂණය කිරීම ඇතුළු එකී වෛද්‍ය උපදෙස්, නැව් මගින් ප්‍රදර්ශනය කරනු ලබන ධජය නොතකා සියලුම නැව්-වලට නොමිලයේ ලබගත හැකි විය යුතු ය.

(13) නෞකාවේ අයිතිකරු සහ නැවක නෞකාධිපතිවරයා විසින්, කලින් කලට සංශෝධිත පහත දැක්වෙන පළකිරීම් නැවේ රැගෙන යන බවට සහතික විය යුතු ය;

(අ) ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පළ කරන ලද "නෞකා සඳහා වන ජාත්‍යන්තර වෛද්‍ය මාර්ගෝපදේශය";

(ආ) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් පළ කරන ලද "අන්තරාදායක භාණ්ඩ සම්බන්ධයෙන් වන අනතුරුවල දී භාවිත කිරීම සඳහා වන වෛද්‍ය ප්‍රථමාධාර මාර්ගෝපදේශය (MFAG);

(ඇ) ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් පළ කරන ලද "සංඥා පිළිබඳ ජාත්‍යන්තර සංග්‍රහය";

(ඈ) වෛද්‍ය උපදෙස් ලබාගත හැකි රේඩියෝ ස්ථාන පිළිබඳ සම්පූර්ණ සහ යාවත්කාලීන ලැයිස්තුවක්; සහ

(ඉ) චන්ද්‍රිකා සන්නිවේදන පද්ධතියක් සවිකර ඇත්තේ නම්, වෛද්‍ය උපදෙස් ලබාගත හැකි වෙරළබඩ භූ ස්ථාන පිළිබඳ යාවත්කාලීන සහ සම්පූර්ණ ලැයිස්තුවක්.

(14) මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර එහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

28. (1) වෘත්තිය නිසා සිදුවන තුවාලයක්, අසනීපයක් හෝ උපද්‍රවයක් හේතුවෙන් මුහුදු යාත්‍රාකරුවකු මරණයට පත්වන අවස්ථාවක දී හෝ එවැන්නකින් හටගන්නා දිගුකාලීන ආබාධිතවීමක දී වන්දි ලබාදීම සඳහා නෞකාවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරුවන්ගේ රැකියා ගිවිසුම් යටතේ වන වගකීම් ඇතුළු නෞකාවේ අයිතිකරුට තිබිය හැකි යම් වගකීම් සපුරාලිය හැකි බවට සහතික කිරීම සඳහා නෞකාවේ අයිතිකරු විසින් ප්‍රමාණවත් යැයි සාධාරණ ලෙස සලකනු ලබන යම් මුදලක මූල්‍ය රැකවරණය සපයන රක්ෂණ කොන්ත්‍රාත්තුවක් (හෝ වෙනත් ආකාරයක ආරක්ෂණයක්) නැවට අදාළව ක්‍රියාත්මක වන්නේ නම් මිස, නැව ක්‍රියා-නොකරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනු-නියෝගය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදුකරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් මිලියනකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

29. (1) (11) වන අනු-නියෝගයට යටත්ව,

(අ) (i) මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම ආරම්භ වන දිනෙන් පටන් ගෙන 12 වන නියෝගය යටතේ නෞකාවේ අයිතිකරුගේ කාර්යය වන එම මුහුදු යාත්‍රාකරු සිය රට යැවීම සඳහා විධිවිධාන සකස් කරනු ලබන දිනෙන් අවසන් වන; හෝ

(ii) (1) (අ) (i) වන අනු-නියෝගයේ සඳහන් කාලසීමාව අතරතුර සිදුවන අවස්ථා හෝ සිද්ධි නිසා එම කාලසීමාවෙන් පසු පටන් ගන්නා,

කාලසීමාව අතරතුර පළමුවරට සිදුවන;

(ආ) ගොඩබිමෙහි ගතකරන නිවාඩු හැර නිවාඩු කාලසීමාව අතරතුර පළමුවරට සිදුනොවන; සහ

(ඇ) රාජකාරි කිරීම සඳහා මුහුදු යාත්‍රාකරුගේ අශක්නුතාව නිසා සිදුවන,

අසනීපයකින් හෝ තුවාලයකින් පෙළෙන මුහුදු යාත්‍රාකරුවකු සම්බන්ධයෙන් මේ නියෝගය අදාළ වන්නේ ය.

(2) (1) (අ) (i) වන අනු-නියෝගය යටතට ගැනෙන මුහුදු යාත්‍රාකරුවකු විසින්, (3) වන අනු-නියෝගයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාවට අදාළව මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම යටතේ ගෙවිය යුතු වේතන නොලබන්නේ නම්, නෞකාවේ අයිතිකරු විසින්-

(අ) එම ගිවිසුම යටතේ එම කාලසීමාව සඳහා වන වේතනයට අදාළව මුහුදු යාත්‍රාකරු විසින් ලද යම් මුදලක; සහ

(ආ) මුහුදු යාත්‍රාකරු එම කාලසීමාව මුළුල්ලෙහි ම රාජකාරි කිරීමට යෝග්‍ය තත්ත්වයක සිට ඇත්නම්, සහ (ගිවිසුම එම කාලසීමාව තුළ අන්‍යාකාරයකින් අවසන් කර ඇති විට) ගිවිසුම එම කාලසීමාව මුළුල්ලෙහි ම එකී නියමයන්ට අනුව පවත්වාගෙන ගොස් ඇත්නම් එම ගිවිසුම යටතේ මුහුදු යාත්‍රාකරුට ගෙවිය යුතුව තිබූ වේතන,

අතර වන වෙනසට සමාන මුදලක් මුහුදු යාත්‍රාකරුට ගෙවිය යුතු ය.

(3) (2) වන අනු-නියෝගයේ සඳහන් කාලසීමාව යනු-

(අ) තුවාලය සිදු වූ දිනයෙන් හෝ අසනීප වූ පළමු දිනයෙන් ආරම්භ වී;

(ආ) 12 වන නියෝගය යටතේ මුහුදු යාත්‍රාකරුට සිය රට යැවීමේ කාර්යය සිදුකරන දිනයෙන් හෝ එවැනි රාජකාරියක් කිරීමට සිදු නොවන්නේ නම්, මුහුදු යාත්‍රාකරු නැවෙන් පිටත්ව යන දිනයෙන් අවසන් වන,

කාලසීමාව වේ.

(4) 12 වන නියෝගය යටතේ මුහුදු යාත්‍රාකරුව සිය රට යැවීමේ කාර්යය කරනු ලබන දිනයට පසු (හෝ එවැනි රාජකාරියක් කිරීමට සිදු නොවන්නේ නම්, (5) වන අනු-නියෝගයේ සිට (7) වන අනු-නියෝගය දක්වා වන අනු-නියෝගවලට යටත්ව, (1) වන අනු-නියෝගය යටතට ගැනෙන මුහුදු යාත්‍රාකරුවකුට රාජකාරි කිරීමට යම් අශක්නුතාවක් තිබේ නම්, සහ එම දිනයෙන් ආරම්භ වී මුහුදු යාත්‍රාකරු නැවත රාජකාරි කිරීමට යෝග්‍ය තත්ත්වයට පත්වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම යටතේ ඔහුට ගෙවිය යුතු මූලික වේතන මුහුදු යාත්‍රාකරුට නොලැබේ නම්, නෞකාවේ අයිතිකරු විසින්-

(අ) එම ගිවිසුම යටතේ එකී කාලසීමාව සඳහා වන මූලික වේතනවලට අදාළ මුහුදු යාත්‍රාකරු විසින් ලද යම් මුදලක; සහ

(ආ) මුහුදු යාත්‍රාකරු එම කාලසීමාව මුළුල්ලෙහි ම රාජකාරි කිරීමට යෝග්‍ය තත්ත්වයක සිට ඇත්නම්, සහ (ගිවිසුම එම කාලසීමාව තුළ අන්‍යාකාරයකින් අවසන් කර ඇති විට) ගිවිසුම එම කාලසීමාව මුළුල්ලෙහි ම එකී නියමයන්ට අනුව පවත්වාගෙන ගොස් ඇත්නම් එම ගිවිසුම යටතේ මුහුදු යාත්‍රාකරුට ගෙවිය යුතුව තිබූ මූලික වේතන,

අතර වන වෙනසට සමාන මුදලක් මුහුදු යාත්‍රාකරුට ගෙවිය යුතු ය.

(5) (4) වන අනු-නියෝගයේ වන කාර්යය, (1) වන අනු-නියෝගයේ සඳහන් තුවාලය සිදු වූ දිනට පසු දිනයෙන් හෝ අසනීප වූ පළමු දිනයෙන් ආරම්භ වී සති 16 ක කාලයක් ඉකුත්වීමෙන් අවසන් වේ.

(6) මේ නියෝගය යටතේ හෝ මුහුදු යාත්‍රාකරු සිය රට බලා යනු ලබන රටේ නීති හෝ වැඩපිළිවෙළවල් යටතේ,

(අ) රාජකාරි කිරීම සඳහා මුහුදු යාත්‍රාකරුගේ අශක්නුතාව; සහ

(ආ) රාජකාරි කිරීමේ අශක්නුතාව ඇති වූ අසනීපය හෝ තුවාලය;

ප්‍රතිඵලයක් වශයෙන් ගෙවිය යුතු අදාළ සියලුම සමාජ සුරක්ෂිතතා ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කරන මුහුදු යාත්‍රාකරු මත, (4) වන අනු-නියෝගයේ වන කාර්යය, කොන්දේසි සහගත වේ.

(7) මුහුදු යාත්‍රාකරු විසින් (5) වන අනු-නියෝගයේ සඳහන් කාලසීමාව හෝ එම කාලසීමාවෙන් යම් කොටසක් හෝ සම්බන්ධයෙන් (6) වන අනු-නියෝගයේ විස්තර කරන ලද යම් ආකාරයක සමාජ සුරක්ෂිතතා ප්‍රතිලාභ ලබන්නේ නම්-

(අ) (4) වන අනු-නියෝගය යටතේ නෞකාවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරුට ගෙවිය යුතු මුදල, එම මුදල් ප්‍රමාණයෙන් අඩු කළ යුතු ය; සහ

(ආ) නෞකාවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරු වෙත දැනටමත් කර ඇති යම් ගෙවීම්, එම අඩු කරන ලද මුදල් ප්‍රමාණ ඉක්මවා යන ප්‍රමාණයට ඔහුගෙන් එය සිවිල් ණයක් වශයෙන් අය කරනු ලැබිය හැකි ය.

(8) මුහුදු යාත්‍රාකරු විසින්, (5) වන අනු-නියෝගයේ සඳහන් කාලසීමාව අතරතුර සමාජ සුරක්ෂිතතා ප්‍රතිලාභවලින් මුහුදු යාත්‍රාකරු විසින් ලද මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් නෞකාවේ අයිතිකරුගේ ඉල්ලීමක් මත ඔහුට එම තොරතුරු ලබා දිය යුතු ය.

(9) (2) වන සහ (4) වන අනු-නියෝග යටතේ මුහුදු යාත්‍රාකරුට ගෙවිය යුතු මුදල්, මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම යටතේ ගෙවිය යුතු (හෝ අවස්ථාවෝචිත පරිදි, ගෙවීමට තිබූ) වේතන ගෙවනු ලබන ආකාරයට සහ ගෙවිය යුතු වාර ගණනට අනුව ගෙවිය යුතු ය.

(10) මුහුදු යාත්‍රාකරු විසින්, (2) වන හෝ (4) වන අනු-නියෝග යටතේ නෞකාවේ අයිතිකරු විසින් ලැබිය යුතු යම් මුදලක්, සිවිල් ණයක් වශයෙන් අයකරනු ලැබිය හැකි ය.

(11) (අ) මුහුදු යාත්‍රාකරු රාජකාරි නොකරන අතරතුර (1) වන අනු-නියෝගයේ සඳහන් තුවාලය සිදු වී ඇති අවස්ථාවක;

(ආ) මුහුදු යාත්‍රාකරු විසින් හිතාමතා සිදුකරන ක්‍රියාකලාපයක් හේතුවෙන් (1) වන අනු-නියෝගයේ සඳහන් තුවාලය හෝ අසනීපය සිදුවී ඇති හෝ හටගත් අවස්ථාවක; හෝ

(ඇ) මුහුදු යාත්‍රාකරු විසින් සිය රැකියා ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී අසනීප හෝ රාජකාරි කිරීමේ අශක්නුතාව පැවති අවස්ථාවක සහ සිතාමතාම සිය අසනීපය හෝ රාජකාරි කිරීමේ අශක්නුතාව පිළිබඳ සැඟ වූ අවස්ථාවක,

මෙම නියෝගය, මුහුදු යාත්‍රාකරුවකුට අදාළ නොවේ.

30. අසනීප වූ තුවාල ලැබූ හෝ මිය ගිය මුහුදු යාත්‍රාකරුවකු විසින් නැවේ තබන ලද දේපළ නෞකාවේ අයිතිකරු විසින් ආරක්ෂා කොට ඒවා මුහුදු යාත්‍රාකරුට හෝ ඔහුගේ ළඟම ඥාතියා වෙත භාරදිය යුතු ය.

31. (1) (2) වන අනු-නියෝගයට යටත්ව, මුහුදු යාත්‍රාකරුවකු-

(අ) මුහුදු යාත්‍රාකරු රාජකාරි කරන නැවේ සිටින අතරතුර; හෝ

(ආ) මුහුදු යාත්‍රාකරුගේ නේවාසික රට හැර වෙනත් රටක ගොඩබිමෙහි ගතකරන නිවාඩු කාලය අතරතුර,මරණයට පත් වේ නම්, නෞකාවේ අයිතිකරු විසින්, මුහුදු යාත්‍රාකරුගේ භූමදානය හෝ ආදාහනය සම්බන්ධයෙන් සාධාරණ ලෙස දරන ලද යම් වියදම් සපයා දිය යුතු ය.

(2) (1) වන අනු-නියෝගයේ වන කාර්යය, රාජ්‍ය අධිකාරියක් විසින් සපයනු ලබන වියදම්වලට අදාළ නොවේ.

(3) (1) වන අනු-නියෝගය යටතේ නෞකාවේ අයිතිකරු විසින් සපයනු ලැබිය යුතු වියදම් සැපයීමේ දී මුහුදු යාත්‍රාක-රුගේ පෞද්ගලික නියෝජිතයන් විසින්, සෘජුවම පිරිවැය දැරීමෙන් හෝ එම පිරිවැය දරන ලද වෙනත් තැනැත්තකු වෙත ප්‍රතිපූරණය කිරීමෙන් හෝ එම පිරිවැය දරනු ලබන අවස්ථාවක, එම නියෝජිතයන් විසින් එම පිරිවැය නෞකාවේ අයිතිකරුගෙන් සිවිල් ණයක් වශයෙන් අයකරනු ලැබිය හැකි ය.

32. (1) (අ) ශ්‍රී ලංකාවේ නැවක් සම්බන්ධයෙන් වන විට, නෞකාවේ අයිතිකරුගේ සුරැකුම නැවට අදාළව ක්‍රියාත්මක වන්නේ නම් මිස; හෝ

(ආ) විදේශ නැවක් සම්බන්ධයෙන් වන විට, වෘත්තිය නිසා සිදුවන අසනීපයක්, තුවාලයක් හෝ උපද්‍රවයක් හේතුවෙන් මුහුදු යාත්‍රාකරුවකු මරණයට පත්වන අවස්ථාවක දී හෝ එවැන්නකින් හට ගන්නා දිගුකාලීන දුබලතාවක දී වන්දි ගෙවීම සහතික කිරීම සඳහා වන මූල්‍ය ආරක්ෂණය, සම්මුතියේ A 4.2.1 වන ප්‍රමිතියේ 1 වන ඡේදයට අනුකූලව නැවට අදාළව ලබා දෙන්නේ නම් මිස,

නැවක් ක්‍රියානොකරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනු-නියෝගය උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර එහි වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

(3) "නෞකාවේ අයිතිකරුගේ සුරැකුම" -

(අ) වෘත්තිය නිසා සිදුවන තුවාලයක්, අසනීපයක් හෝ උපද්‍රවයක් හේතුවෙන් මුහුදු යාත්‍රාකරුවකු මරණයට පත්වන අවස්ථාවක දී හෝ එවැන්නකින් හටගන්නා දිගුකාලීන ආබාධිතවීමක දී වන්දි ලබාදීම සඳහා නෞකාවේ අයිතිකරු විසින් මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුම් හෝ සාමූහික ගිවිසුම් යටතේ වන වගකීම් ඇතුළු නෞකාවේ අයිතිකරුට තිබිය හැකි යම් වගකීම් සපුරාලිය හැකි බවට සහතික කිරීම සඳහා නෞකාවේ අයිතිකරු විසින් ප්‍රමාණවත් යැයි සාධාරණ ලෙස සලකනු ලබන යම් මුදලක මූල්‍ය රැකවරණය සපයන;

(ආ) සම්මුතියේ A 4.2.1 වන ප්‍රමිතියේ 8(අ), (ආ), (ඇ) සහ (ඈ) යන ඡේදවල සහ 13 වන ඡේදයේ දක්වා ඇති නියමයන්ට අනුකූල විය යුතු; සහ

(ඇ) සුරැකුම් සපයන්නා විසින් යටත් පිරිසෙයින් දින 30 ක් හෝ ඊට පෙරාතුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ලිඛිත දැන්වීමක් ලබා දී ඇත්නම් මිස සුරැකුමෙහි වන කාලය ඉකුත්වීමට පෙර කරනු නොලැබිය යුතු,

නැවකට අදාළ රක්ෂණ ඔප්පුවේ ආකාරයට හෝ සුරැකුම පිළිබඳ වෙනත් ආකාරයකට හෝ තිබිය යුතු ය.

(4) (i) නෞකාවේ අයිතිකරුගේ සුරැකුම් සපයන්නා; සහ

(ii) මුහුදු යාත්‍රාකරු හෝ මුහුදු යාත්‍රාකරුගේ පෞද්ගලික නියෝජිතයා,

අතර ඇතිවන ගිවිසුමක් මගින් හෝ නෞකාවේ අයිතිකරු විසින් ගිවිසුම් ප්‍රකාර වන්දියකට යටත් වන බව තහවුරු කරනු ලබන දිනත් සමග දින හතක් ඇතුළත නෞකාවේ අයිතිකරුගේ සුරැකුම් සපයන්නා විසින් මුහුදු යාත්‍රාකරුට හෝ මුහුදු යාත්‍රාකරුගේ පෞද්ගලික නියෝජිතයාට ගිවිසුම් ප්‍රකාර වන්දිය ගෙවිය යුතු ය.

(5) නෞකාවේ අයිතිකරුගේ සුරැකුම් සපයන්නා විසින් නෞකාවේ අයිතිකරුගේ වගකීම පිළිබඳ සෑහීමකට පත් වූ දිනයෙන් ආරම්භ වන වසරක් පාසා වසරකට 20%ක අනුප්‍රමාණයකින් නොගෙවූ මුදල සඳහා වන පොළිය, (4) වන අනු-නියෝග යට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන නෞකාවේ අයිතිකරුගේ සුරැකුම් සපයන්නා විසින් මුහුදු යාත්‍රාකරුට හෝ මුහුදු යාත්‍රාකරුගේ පුද්ගලික නියෝජිතයා වෙත ගෙවිය යුතු ය.

(6) මේ නියෝගයේ, "ගිවිසුම්ගත වන්දි සඳහා හිමිකම් පෑම" යන්නෙන්, හිමිකම් පෑම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුහුදු යාත්‍රාකරුගේ රැකියා ගිවිසුමේ දක්වා ඇති අවස්ථාවක සහ "ගිවිසුම්ගත වන්දි" යන්න ඒ අනුව තේරුම් ගත යුතු අවස්ථාවක, වෘත්තිය නිසා සිදුවන තුවාලයක්, අසනීපයක් හෝ උපද්‍රවයක් හේතුවෙන් මුහුදු යාත්‍රාකරුවකු මරණයට පත්වන අවස්ථාවක දී හෝ එවැන්නකින් හටගන්නා දිගුකාලීන දුබලතාවක දී වන්දි ලබාගැනීම සඳහා වන හිමිකම්පෑමක් අදහස් වේ.

(7) නෞකාවට අදාළ වන යම් නෞකා අයිතිකරුවකුගේ සුරැකුම, එහි වලංගු කාලසීමාව අවසන් වීමට පෙර අවසන් වීමට නියමිත බව හෝ අවසන් වී ඇති බව නෞකාවේ අයිතිකරු විසින් දැනගනු ලබන අවස්ථාවක, නෞකාවේ අයිතිකරු විසින්, දින තිහක් ඇතුළත, දැනුම් දීමේ කාලසීමාව අතරතුර නෞකාවේ රාජකාරි කරන සියලුම මුහුදු යාත්‍රාකරුවන් වෙත ඒ සම්බන්ධයෙන් ලිඛිත දැන්වීමක් දිය යුතු ය.

(8) (7) වන අනු-නියෝගය යටතේ වන යම් දැන්වීමක්-

(අ) ලිඛිතව තිබිය යුතු ය; සහ

(ආ) එහි නෞකාවේ අයිතිකරුගේ සුරැකුම් ලේඛනයෙහි පිටපතක් ඇතුළත් විය යුතු ය.

(9) නෞකා අයිතිකරුවකුගේ සුරැකුම් සපයන්නා විසින් සුරැකුමෙහි වලංගු කාලසීමාව අවසන් වීමට පෙර නෞකා අයිතිකරුගේ සුරැකුම අවසන් කරනු ලැබුවහොත් නෞකා අයිතිකරුගේ සුරැකුම් සපයන්නා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඒ සම්බන්ධයෙන් ලිඛිත දැන්වීමක් දිය යුතු ය.

(10) (9) වන අනු-නියෝගය යටතේ වන යම් දැන්වීමක්-

(අ) ලිඛිතව තිබිය යුතු ය; සහ

(ආ) එහි නෞකාවේ අයිතිකරුගේ සුරැකුම් ලේඛනයෙහි පිටපතක් ඇතුළත් විය යුතු ය.

(11) නෞකාවට අදාළ වන යම් නෞකා අයිතිකරුවකුගේ සුරැකුම, එහි වලංගු කාලසීමාව අවසන් වීමට පෙර අවසන් වීමට නියමිත බව හෝ අවසන් වී ඇති බව නෞකාවේ අයිතිකරු විසින් දැනගනු ලබන අවස්ථාවක, නෞකාවේ අයිතිකරු විසින්, දැනුම් දීමේ කාලසීමාව අතරතුර නෞකාවේ රාජකාරි කරන සියලුම මුහුදු යාත්‍රාකරුවන් වෙත ඒ සම්බන්ධයෙන් දැන්වීමක් දිය යුතු ය.

(12) (11) වන අනු-නියෝගය යටතේ වන යම් දැන්වීමක්-

(අ) ලිඛිතව තිබිය යුතු ය;

(ආ) එහි නෞකාවේ අයිතිකරුගේ සුරැකුම අවසන් වීමට නියමිත හෝ අවසන් වී ඇති දිනය එහි සඳහන් කළ යුතු ය; සහ

(ඇ) නෞකා අයිතිකරුගේ සුරැකුම අවසන් වීමට නියමිත හෝ අවසන් වී ඇති බව නෞකාවේ අයිතිකරු දැනගත් පසු සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මණින් ලබා දිය යුතු ය.

(13) (අ) (i) (1) වන අනු-නියෝගයේ සඳහන් නෞකා අයිතිකරුගේ සුරැකුමට අදාළව, එක් එක් සුරැකුම් සපයන්නා විසින් නිකුත් කරන ලද සහතිකයක් හෝ වෙනත් ලේඛනගත සාක්ෂි නෞකාවේ රැගෙන යා යුතු ය; සහ

(ii) නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවන්ට ප්‍රවේශ විය හැකි නෞකාවේ පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරන ලද සහතිකයේ හෝ වෙනත් ලේඛනගත සාක්ෂිවල පිටපතක් නෞකාවේ තිබිය යුතු ය.

(ආ) (i) සහතිකයේ හෝ වෙනත් ලේඛනගත සාක්ෂිවල සම්මුතියේ A 4-1 ඇමුණුමෙහි දක්වා ඇති විස්තර සහ තොරතුරු ඇතුළත් විය යුතු ය; සහ

(ii) සහතිකය හෝ වෙනත් ලේඛනගත සාක්ෂි ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය; නැතහොත් ඉංග්‍රීසි පරිවර්තනයක් සමග ඉදිරිපත් කළ යුතු ය.

33. (1) (2) වන අනු-නියෝගයේ නිශ්චිතව දක්වා ඇති වෘත්තීය නිසා සිදුවන අනතුරු, තුවාල සහ ලෙඩරෝග වළක්වා ගැනීම සඳහා නෞකාස්ථ වෘත්තීමය සෞඛ්‍යය සහ ආරක්ෂණ පියවර සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවර්ධනය කිරීම නෞකාවේ අයිතිකරුගේ කාර්යය විය යුතු ය.

(2) (1) වන අනු-නියෝගයේ සඳහන් වෘත්තිමය සෞඛ්‍යය සහ ආරක්ෂණ පියවර-

(අ) ජාත්‍යන්තර ආරක්ෂණ කළමනාකරණ සංග්‍රහය යටතේ වන අනුමත නෞකා ආරක්ෂණ කළමනාකරණ පද්ධතියක් නියමයන් සපුරා තිබිය යුතු ය; නැතහොත්

(ආ) පහත දැක්වෙන සියල්ලම එහි ඇතුළත් විය යුතු යː

(i) සාධාරණ ලෙස හැකිතාක් ප්‍රායෝගිකව ආරක්ෂිත සහ සෞඛ්‍ය අවදානමක් නොමැති ආකාරයට කර්මාන්තශාලාව, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ කාර්ය පද්ධති සැපයීම සහ නඩත්තු කිරීම;

(ii) අන්තරාදායක ස්වභාවයෙන් යුත් භාණ්ඩ හා ද්‍රව්‍ය භාවිත කිරීම, එහා මෙහා කිරීම, ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් සාධාරණ ලෙස හැකිතාක් ප්‍රායෝගිකව ආරක්ෂාව සහ අවදානම නොමැති වීම සහතික කර ගැනීම සඳහා වන වැඩපිළිවෙලවල්;

(iii) මුහුදු යාත්‍රාකරුවන් සඳහා අවශ්‍ය පුද්ගලික ආරක්ෂක උපාංග සැපයීම;

(iv) අනාරක්ෂිත තත්ත්වයන් පරීක්ෂා කිරීම, වාර්තා කිරීම සහ නිවැරදි කිරීම සඳහා සහ නෞකාස්ථ වෘත්තිමය අනතුරු විමර්ශනය කිරීම හා වාර්තා කිරීම සඳහා වන නියම;

(v) නැවේ වෘත්තිමය ආරක්ෂාව සහ සෞඛ්‍ය ප්‍රතිපත්ති සහ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ ඒවාට අනුකූලව කටයුතු කිරීම සඳහා වන නිශ්චිත වගකීම ගෙන කටයුතු කිරීමට නෞකාධිපතිවරයා හෝ නෞකාධිපතිවරයා විසින් නම් කළ තැනැත්තකු සතු කාර්ය; සහ

(vi) මුහුදු යාත්‍රාකරුවන් පස් දෙනෙකුගේ හා ඊට වැඩි පිරිසකගෙන් සමන්විත වන නෞකාස්ථව පිහිටුවනු ලැබිය යුතු නැවේ ආරක්ෂක කමිටුවේ රැස්වීම්වලට සහභාගී වීම සඳහා ආරක්ෂක නියෝජිතවරයන් ලෙස පත් කරන ලද හෝ තෝරා පත්කරන ලද නැවේ මුහුදු යාත්‍රාකරුවන්ගේ අධිකාරය.

(3) නෞකාවේ අයිතිකරු විසින්, වෘත්තිය නිසා සිදුවන අනතුරු, තුවාල සහ ලෙඩරෝග වළක්වා ගැනීම සඳහා සහ වෘත්තිමය ආරක්ෂාව සහ සෞඛ්‍යාරක්ෂාව නොකඩවා වැඩි දියුණු කිරීම සඳහා නෞකාස්ථ වැඩසටහන් සපයනු ලැබිය යුතු ය. 1996 මුහුදේ දී සහ වරායේ දී නෞකාස්ථ අනතුරු වැළැක්වීම සඳහා හිමිකම් ලැබූ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) ආචාර ධර්ම සංග්‍රහය සහ වෘත්තියමය ආරක්ෂාව සහ සෞඛ්‍යාරක්ෂාවට අදාළ පසුකාලීන අනුවාදය සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ වෙනත් ජාත්‍යන්තර ප්‍රමිති සහ මාර්ගෝපදේශ සහ ආචාර ධර්ම සංග්‍රහයන් මගින් හඳුනාගනු ලැබිය හැකි යම් නිරාවරණ මට්ටම් ද ඇතුළු එකී සියල්ලක් ම ඉහත වැඩසටහන් සඳහා සැලකිල්ලට ගත යුතු ය.

තවද, ජාත්‍යන්තර නාවික මණ්ඩලය සහ ජාත්‍යන්තර ප්‍රවාහන සේවක සම්මේලනය යන ආයතන දෙකම එකතු වී පළ කරන ලද නෞකාව තුළ සිදුවන හිරිහැර සහ කුරිරු ලෙස සැලකීම් ඉවත් කිරීම සඳහා වන මාර්ගෝපදේශයෙහි නවතම අනුවාදය ද සැලකිල්ලට ගත යුතු ය.

(4) (3) වන අනු-නියෝගයේ සඳහන් නෞකාස්ථ වැඩසටහන්-

(අ) යෝග්‍ය විට කලානුරූපීව නැවත නැවත කළ යුතු;

(ආ) අදාළ මුහුදු යාත්‍රාකරුගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට එල්ල විය හැකි යම් අලුත් අවදානම් හෝ වෙනස් වූ අවදානම් පිළිබඳ සැලකිල්ලට ගනු ලැබිය යුතු; සහ

(ඇ) අදාළ මුහුදු යාත්‍රාකරු වැඩ කරන පැය ගණන අතරතුර සිදු විය යුතු,

පුහුණුවක සහ උපදෙස් ආකාරයෙන් තිබිය යුතු ය.

(5) නෞකා අයිතිකරුවන් විසින් වයස අවුරුදු 18ට වඩා අඩු මුහුදු යාත්‍රාකරුවන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍යය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

(6) යම් නෞකා අයිතිකරුවකු විසින් නෞකාස්ථ වෘත්තිමය සෞඛ්‍යය සහ ආරක්ෂාව කළමනාකරණය කිරීමට අදාළව අවදානම් තක්සේරුකරණයක් පැවැත්විය යුතු ය.

(7) (6) වන අනු-නියෝගයේ සඳහන් අවදානම් තක්සේරුකරණය මගින්-

(අ) වෙනත් දේවල අතර ආරම්භයේ දී අවදානම් සහගත සටන් කිරීම ඇතුළත් වන අවදානම් මග හරවා ගැනීම සහ අන්තරාදායක නොවන හෝ අනතරාය අවම ක්‍රියා, ද්‍රව්‍ය හෝ උපකරණ මගින් අන්තරාදායක ක්‍රියා, ද්‍රව්‍ය හෝ ක්‍රම ප්‍රතිස්ථාපනය කිරීම;

(ආ) නොවැළැක්විය හැකි අවදානම් තක්සේරු කිරීම සහ ඒවා අවම කිරීමට පියවර ගැනීම; සහ

(ඇ) නෞකා අයිතිකරුගේ නෞකාවලින් ලබාගත් සුදුසු සංඛ්‍යාත්මක තොරතුරු සහ අධ්‍යක්ෂ-ජනරාල්-වරයා විසින් කලින් කලට සපයනු ලැබිය හැකි සාමාන්‍ය සංඛ්‍යාලේඛන සමාලෝචනය කිරීම,

යන කරුණු ආවරණය කළ යුතු ය.

(8) (6) වන අනු-නියෝගයේ සඳහන් අවදානම් තක්සේරුකරණය මගින්-

(අ) සුදුසු කාල අන්තරවල දී; හෝ

(ආ) නෞකාවේ වැඩ තත්ත්වයන් හි යම් කැපී පෙනෙන වෙනසක් ඇති සෑම විටම,

සමාලෝචනය කරනු ලබන බවට නෞකාවේ අයිතිකරු විසින් වගබලා ගත යුතු ය.

(9) (අ) නෞකාවේ සිදුකරන සේවයක් නිසා සිදුවන වෘත්තියමය අනතුරක්, තුවාලයක් හෝ ලෙඩ රෝග යක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත වාර්තා කිරීම නෞකා අයිතිකරුවකුගේ සහ නෞකාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(ආ) වාර්තාව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට ඉදිරිපත් කළ යුතු ය.

(10) (අ) වාර්තා වූ අනතුරු සහ ලෙඩ රෝග පිළිබඳ සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන තබා ගැනීම, විග්‍රහ කිරීම සහ පළ කිරීම කරනු ලබන බවට සහ යෝග්‍ය විට, සාමාන්‍ය ප්‍රවණතා සහ හඳුනාගත් උපද්‍රව පිළිබඳ පර්යේෂණ කිරීම මගින් පසු විපරම් කරනු ලබන බවට; සහ

(ආ) වෘත්තිය නිසා සිදුවන අනතුරු පිළිබඳ විමර්ශනය කරනු ලබන බවට,

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් වගබලා ගත යුතු ය.

(11) මේ කොටසේ යම් විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර එහි වරදකරු කරනු ලැබූ විට රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු ය.

34. (1) මේ නියෝගය-

(අ) ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ලැබූ නැව්වල සේවයේ යොදවන ලද ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරුවන්ට;

(ආ) විදේශ රටක ධජය දරන නැව්වල සේවයේ යොදවන ලද ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරුවන්ට;

(ඇ) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බලපත්‍රලාභී මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත්කිරීමේ සේවා සපයන්නන්ට; සහ

(ඈ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි නැව්වල අයිතිකරුවන්ට,

අදාළ වේ.

(2) ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ලැබූ සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ නේවාසික වන්නා වූ ද, නැව්වල සේවයේ යොදවා ඇති වූ ද මුහුදු යාත්‍රාකරුවන් විසින්, සංශෝධිත පරිදි 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ සහ සංශෝධිත පරිදි 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධානවල දක්වා ඇති සමාජ සුරක්ෂිතතා ආරක්ෂණය භුක්ති විඳිය යුතු ය.

(3) විදේශ රටක ධජය දරන නැව්වල සේවයේ යොදවා ඇති සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ නේවාසික මුහුදු යාත්‍රාකරුවන් විසින්, 1996 අංක 17 දරන සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබූ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයෙහි දක්වා ඇති ආරක්ෂණය භුක්ති විඳිය යුතු ය.

(4) (3) වන අනු-නියෝගයේ සඳහන් මුහුදු යාත්‍රාකරුවන්ගේ යැපෙන්නන් ද, අදාළ මුහුදු යාත්‍රාකරුවන් විසින් භුක්ති විඳින සමාජ සුරක්ෂිතතා ආරක්ෂණය මගින් ආවරණය විය යුතු ය.

(5) සමාජ ආරක්ෂණය ළඟාකර ගැනීම සඳහා සමාජ සුරක්ෂිතතා ආරක්ෂණයන් හි නම් වශයෙන් පහත දැක්වෙන අංග යොදා ගනු ලැබිය හැකි ය-

(අ) වෛද්‍ය උවටැන්;
(ආ) අසනීප ප්‍රතිලාභ;
(ඇ) විරැකියා ප්‍රතිලාභ;
(ඈ) වැඩිහිටි ප්‍රතිලාභ;
(ඉ) රැකියාව නිසා සිදුවන තුවාල සම්බන්ධ ප්‍රතිලාභ;
(ඊ) පවුල සඳහා වන ප්‍රතිලාභ;
(උ) මාතෘ ප්‍රතිලාභ;
(ඌ) අවලංගු ප්‍රතිලාභ; සහ
(එ) දිවි ගලවාගත් තැනැත්තන් සඳහා වන ප්‍රතිලාභ.

(6) (2) වන සහ (3) වන අනු-නියෝගවල සඳහන් සමාජ සුරක්ෂිතතා ආරක්ෂණය ආරක්ෂණයට අමතරව, මේ නියෝගවල වෙනත් නියෝග යටතේ ලබා දිය යුතු ය.

(7) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ජාතික තත්ත්වයන්ට අනුව ශ්‍රී ලංකාවේ නැව්වල හෝ වෙනත් ධජයක් දරන රාජ්‍යයක නැව්වල සේවය කරන සෑම මුහුදු යාත්‍රාකරුවකු සඳහා ම සමාජ සුරක්ෂිතතා ආරක්ෂණය අනුක්‍රමිකව තහවුරු කරනු ලැබිය යුතු ය.

(8) විදේශ රටක ධජය දරන නැවක සේවයේ යොදවා ඇති ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරුවකුගේ නෞකා අයිතිකරු හෝ සේවායෝජකයා විසින්, පහත දැක්වෙන ආකාරයට (3) වන උප-නියෝගයේ සඳහන් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය සඳහා දායකත්වය ලබා දිය යුතු ය;

(අ) ශ්‍රී ලංකාවේ නිලධරයන් සඳහා එ.ජ.ඩො. 50; සහ

(ආ) නිලධරයන් හැර ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරුවන් සඳහා එ.ජ.ඩො. 40.

(9) විදේශ රටක ධජය දරන නැව් වෙත ශ්‍රී ලංකාවේ මුහුදු යාත්‍රාකරුවකු ලබාදෙන බලපත්‍රලාභී මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත්කිරීමේ සේවා සපයන්නා විසින්, (8) වන අනු-නියෝගයේ සඳහන් දායක මුදල් එකතු කර සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට බැර කරන බවට වගබලා ගත යුතු අතර ඔහු විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා නිශ්චය කරනු ලැබූ ආකාරයට අධ්‍යක්ෂ-ජනරාල්-වරයා වෙත මාසික වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(10) මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නන් විසින් ලද අදාළ දායක මුදල්, (3) වන අනු-නියෝගයේ සඳහන් සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට තැන්පත් කරන බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයා වගබලාගත යුතු ය.

(11) මුහුදු යාත්‍රාකරුවකුගේ රැකියා ගිවිසුම හෝ සාමූහික කේවල් කිරීමේ ගිවිසුම මගින්, මේ නියෝගය යටතේ නියම කරන ලද සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල පිළිබඳ විස්තර සැපයිය යුතු ය.

(12) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, (3) වන අනු-නියෝගයේ සඳහන් සමාජ සුරක්ෂිතතා ආරක්ෂණය සම්බන්ධයෙන් වන ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිය පළ කරනු ලැබිය යුතු ය.

(13) මේ නියෝග පනවන ලද අවස්ථාවේ දී බලාත්මකව පැවති සාමූහික කේවල් කිරීමේ ගිවිසුමට සහ රැකියා ගිවිසුමට අදාළ විධිවිධාන, එම රැකියා ගිවිසුමෙහි කාලසීමාව සඳහා පමණක් වලංගු වන අතර, ගිවිසුමෙහි කාලය ඉකුත් වූ පසු වහාම මේ නියෝග අදාළ විය යුතු ය.

(14) මේ නියෝගවල 7 වන නියෝගය යටතේ ලියාපදිංචි කර සහතික කරන ලද යම් මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හා පත් කිරීමේ සේවා සපයන්නකු මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන අවස්ථාවක, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, මේ නියෝගවල 7 වන නියෝගය යටතේ නිකුත් කරන ලද බලය ලබාදීමේ සහතිකය අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට පියවර ගනු ලැබිය හැකි ය.

(15) මේ නියෝගයේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් සිදු කරන අතර එහි වරදකරු කරනු ලැබූ විට රුපියල් මිලියනයකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

## VI වන කොටස

### *අනුකූලතාව සහ ක්‍රියාත්මක කිරීම*

35. (1)ශ්‍රී ලංකා ධජය ප්‍රදර්ශනය කරන නැව්වල සිටි මුහුදු යාත්‍රාකරුවන්ගේ වැඩ කිරීමේ තත්ත්වයන් සහ ජීවත්වීමේ තත්ත්-වයන් මගින්, සම්මුතියේ ප්‍රමිති සපුරාලන බවට සහ සපුරාලීම දිගටම සිදුවන බවට වගබලා ගනිමින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, සම්මුතියට අනුකූලව, සමුද්‍රීය කම්කරුවන්ගේ තත්ත්වයන් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම සඳහා ඵලදායී ක්‍රමයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) (අ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් (1) වන අනු-නියෝගයේ සඳහන් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම සඳහා වන බලය ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) විසින් සම්මත කරනු ලැබූ පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ විධිවිධානවලට අනුව පිළිගෙන ඇති පිළිගත් සංවිධාන වෙත ලබා දිය හැකි ය.

(ආ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, බලය ලබාදීමේ කාර්ය සඳහා පිළිගනු ලබන යම් සංවිධානයක් සමග වන ලිඛිත ගිවිසුම අවසන් කළ යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයට අනුව සකස් කරන ලද ගිවිසුම භාරගත යුතු ය.

(ඇ) පරීක්ෂණවලට අදාළව ප්‍රදානය කරන ලද යම් බලය ලබාදීම් මගින් අවම වශයෙන් මුහුදු යාත්‍රාකරුවන්ගේ වැඩ කිරීමේ සහ ජීවත්වීමේ තත්ත්වයන් හි හඳුනාගනු ලබන අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නියම කිරීමට සහ වරාය තත්ත්ව පාලනයක ඉල්ලීම මත මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට පිළිගත් සංවිධානයට බලය ලබා දිය යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ජාත්‍යන්තර කම්කරු කාර්යාලය වෙනුවෙන් කටයුතු කිරීමට බලයලත් යම් පිළිගත් සංවිධානවල වර්තමාන ලැයිස්තුවක් එම ජාත්‍යන්තර කම්කරු කාර්යාලය වෙත ලබාදිය යුතු අතර එම ලැයිස්තුව යාවත්කාලීන කළ යුතු ය. ලැයිස්තුව මගින් එම පිළිගත් සංවිධාන විසින් සිදුකිරීමට බලය ලැබූ කර්තව්‍ය පිළිබඳ නිශ්චිතව දැක්විය යුතු ය.

(ඉ) පිළිගත් සංවිධාන විසින් සිදුකරන ලද සේවා මගින් ආවරණය වූ අයිතමයන් හි නියමිත ප්‍රමිතීන් ළඟාකරගත් බව පෙන්නුම් කිරීමට හැකිවන පරිදි ඔවුන් විසින් සිදුකරන ලද සේවා පිළිබඳ වාර්තා, එකී පිළිගත් සංවිධාන විසින් පවත්වාගෙන යා යුතු ය. එකී පරීක්ෂණ ඇතුළත් වාර්තාව සෑම මාස හයක දී ම අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත භාර දිය යුතු ය.

(3) සමුද්‍රීය කම්කරු අනුකූලතාව පිළිබඳ ප්‍රකාශයක් මගින් අනුපූරක සමුද්‍රීය කම්කරු සහතිකයෙහි, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නැව නිසි පරිදි පරීක්ෂා කරන ලද බවට සහ මුහුදු යාත්‍රාකරුවන්ගේ වැඩ කිරීමේ සහ ජීවත්වීමේ තත්ත්වයන්ට අදාළව සම්මුතියේ නියම එසේ සහතික කරන ලද ප්‍රමාණයට සපුරා ඇති බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇතුළත් විය යුතු ය.

(4) ශ්‍රී ලංකාවේ නැව්වල පවත්වන ලද පරීක්ෂණ පිළිබඳ වාර්ෂික වාර්තාවක් අදාළ වර්ෂය අවසාන වීමෙන් පසු මාස හයක් නොඉක්මවන යම් සාධාරණ කාලයක් තුල අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පළ කළ යුතු ය.

(5) සම්මුතියේ පිටපතක් ශ්‍රී ලංකා ධජය දරන යම් නෞකාවක රැගෙන යා යුතු ය.

36. (1) මේ නියෝග;

(අ) ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ලැබූ සහ ජාත්‍යන්තර මුහුදු ගමන්වල යෙදෙන දළ ටොන් පන්සියයක හෝ ඊට වැඩි නෞකා සඳහා;

(ආ) ශ්‍රී ලංකා ධජය දැරීමට හිමිකම් ලැබූ සහ වෙනත් රටක වරායකින් හෝ වරායවල් අතර මුහුදු සේවයේ යෙදෙන දළ ටොන් පන්සියයක හෝ ඊට වැඩි නෞකා සඳහා; සහ

(ඇ) ශ්‍රී ලංකා මුහුදු තීරයේ සිටින වෙනත් යම් විදේශ නෞකා සඳහා,

අදාළ වන්නේ ය.

(2) මේ නියෝග අදාළ වන්නේ යම් නැවකට ද එකී නැවට අදාළව,

(අ) සමුද්‍රීය කම්කරු සහතිකයක්; හෝ

(ආ) අතුරු සමුද්‍රීය කම්කරු සහතිකයක්,

බලාත්මකව පවතින්නේ නම් මිස, එම නැව් යාත්‍රාකිරීම නොකළ යුතු ය.

(3) (2) වන අනු-නියෝගයේ සඳහන් සමුද්‍රීය කම්කරු සහතිකය නෞකාවේ රැගෙන යා යුතු අතර එම සහතිකයෙහි පිටපතක් නැවේ සිටින නෞකා සාමාජිකයන්ට ප්‍රවේශ විය හැකි නෞකාවේ පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

(4) (අ) (2) වන අනු-නියෝගයේ සඳහන් සමුද්‍රීය කම්කරු සහතිකයෙ හි (මෙහි මින්මතු "DMLC" යනුවෙන් සඳහන් කරනු ලබන) සමුද්‍රීය කම්කරු අනුකූලතා ප්‍රකාශය අමුණා තිබිය යුතු ය.

(ආ) DMLC කොටස් දෙකකින් සමන්විත විය යුතු යඃ

(i) 1 වන කොටසඃ

(අ) සම්මුතියේ A5.1.3 වන ප්‍රමිතියේ 1 වන ඡේදයට අනුකූලව පරීක්ෂා කළ යුතු කාරණා ලැයිස්තුව පිළිබඳ හඳුනාගනු ලබන;

(ආ) අදාළ ජාතික නීතිමය විධිවිධාන සඳහා සඳහනක් ලබාදෙමින් සම්මුතියේ අදාළ විධිවිධාන නිරූපණය වන ජාතික අවශ්‍යතා මෙන්ම අවශ්‍ය ප්‍රමාණයට ජාතික අවශ්‍යතාවන්හි ප්‍රධාන අන්තර්ගතය පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු හඳුනා ගනු ලබන;

(ඇ) ජාතික නීති පද්ධතිය යටතේ වන නෞකා-වර්ග පිළිබඳ නිශ්චිත නියම පිළිබඳ සඳහන් කරනු ලබන;

(ඇ) සම්මුතියේ VI වන ව්‍යවස්ථාවේ 3 වන ඡේදයට අනුකූලව සම්මත කරන ලද සාරානුකූල වශයෙන් යම් සමාන විධිවිධාන වාර්තා කරනු ලබන;සහ

(ඉ) සම්මුතියේ 3 වන අභිධානයෙහි විධිවිධාන සලසා ඇති පරිදි අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ප්‍රදානය කරන ලද යම් නිදහස් කිරීමක් පැහැදිලිව පෙන්නුම් කරන,

I වන කොටස අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළියෙළ කළ යුතු ය.

(ii) II වන කොටසඃ පරීක්ෂණ සහ අඛණ්ඩ වර්ධනයක් ඇති බව සහතික කිරීම සඳහා යෝජිත පියවර යන දෙක අතර ඇති ජාතික අවශ්‍යතාවන්ට අනුකූලව පවතින බව සහතික කිරීම සඳහා යොදා ගන්නා ලද පියවර හඳුනාගනු ලබන II වන කොටස නෞකාවේ අයිතිකරු විසින් පිළියෙළ කළයුතු ය.

(5) මේ නියෝගය අදාළ වන යම් නැවක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානයක් විසින් පවත්වනු ලබන පහත දැක්වෙන පරීක්ෂණවලට යටත් වන්නේ ය.

(අ) නැවට අදාළ සමුද්‍රීය කම්කරු සහතිකය ප්‍රථම වරට නිකුත් කිරීමට පෙර සිදුකරන ආරම්භක පරීක්ෂණය;

(ආ) සමුද්‍රීය කම්කරු සහතිකයක් ප්‍රථමවරට නිකුත් කර අවුරුදු පහක් ඇතුළත සහ ඉන්පසු අවුරුදු පහකට නොවැඩි කාල අන්තරවල දී සිදුකරන අලුත් කිරීමේ පරීක්ෂණය; සහ

(අ) නිකුත් කරන ලද සමුද්‍රීය කම්කරු සහතිකයක දෙවන සහ තුන්වන සංවත්සර දින අතරතුර දී සිදුකරන අතරමැදි පරීක්ෂණය.

(6) මේ නියෝගයේ -

(අ) "ආරම්භක පරීක්ෂණය" යන්නෙන්, නෞකාව විසින් සම්මුතියේ ප්‍රමිති සපුරාලන්නේ ද යන වග අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානය විසින් නිර්ණය කරනු ලබන පරීක්ෂණය අදහස් වේ.

(ආ) "අලුත් කිරීමේ පරීක්ෂණය" යන්නෙන්, නෞකාව විසින් සම්මුතියේ ප්‍රමිති අඛණ්ඩව සපුරාලන්නේ ද යන වග අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානය විසින් නිර්ණය කරනු ලබන පරීක්ෂ-ණය අදහස් වේ.

(ඇ) "අතරමැදි පරීක්ෂණය" යන්නෙන්, නෞකාව විසින් සම්මුතියේ ප්‍රමිති අඛණ්ඩව සපුරාලන්නේ ද යන වග අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානය විසින් නිර්ණය කරනු ලබන පරීක්ෂණය අදහස් වේ.

(7) (අ) සමුද්‍රීය කම්කරු අනුකූලතා ප්‍රකාශ සමාලෝචනය සහ අනුමතය, නැව පරීක්ෂා කරනු ලබන අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් සංවිධානය විසින් සම්පූර්ණ කර තිබීමට යටත්ව; සහ

(ආ) අඩුපාඩු නිවැරදි කර තිබීමට හෝ නිවැරදි කිරීමේ සැලැස්මක් භාරගෙන තිබීමට යටත්ව,

ආරම්භක හෝ අලුත් කිරීමේ පරීක්ෂණයක් අවසන් වීමෙන් පසු අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ පිළිගත් සංවිධානය සෑහීමකට පත් වේ නම්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් සංවිධානය විසින් නෞකාව වෙත සමුද්‍රීය කම්කරු සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(8) (අ) (7) වන අනු-නියෝගය යටතේ නිකුත් කරන ලද සමුද්‍රීය කම්කරු සහතිකය එය නිකුත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(ආ) (i) සම්මුතිය හා අඛණ්ඩව අනුකූල වන බව;

(ii) DMLC හි I වන කොටස සහ II වන කොටස සඳහා කරන ලද සංශෝධන (ඇත්නම්) ඵලදායී ලෙස ක්‍රියාත්මක කර ඇත්තේ ද යන වග; සහ

(iii) කලින් සිදු වූ අඩුපාඩු සඳහා නිවැරදි කිරීම් කර අවසන් වී ඇත්තේ ද යන වග.

සත්‍යාපනය කිරීම සඳහා සමුද්‍රීය කම්කරු සහතිකයේ වලංගුභාවය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ මේ කාර්යය සඳහා නිසි පරිදි බලයලත් සංවිධානය විසින් සිදුකරනු ලබන අතරමැදි පරීක්ෂණයකට යටත් විය යුතු ය.

(ඇ) අතරමැදි පරීක්ෂණයේ විෂය පථය, ආරම්භක පරීක්ෂණයේ විෂය පථයට සමාන විය යුතු අතර. අතරමැදි පරීක්ෂණය සහතිකයේ දෙවන සහ තුන්වන සංවත්සර දින අතරතුර කාලයේ දී සිදු කළ යුතු ය.

(ඈ) සංවත්සර දිනය යන්නෙන්, සමුද්‍රීය කම්කරු සහතිකයේ කාලය ඉකුත්වන දිනයට අනුරූප වන එක් එක් වර්ෂයක දිනය සහ මාසය අදහස් වේ.

(9) පවත්නා සමුද්‍රීය කම්කරු සහතිකයේ කාලය ඉකුත් වීමට පෙර මාස තුනක කාලයක් ඇතුළත අලුත් කිරීමේ පරීක්ෂණය අවසන් කර ඇති විට, අලුත් සමුද්‍රීය කම්කරු සහතිකය, අලුත් කිරීමේ පරීක්ෂණය අවසන් වූ දින සිට, පවත්නා සහතිකයේ කාලය ඉකුත් වූ දින සිට අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා වලංගු විය යුතු ය.

(10) පවත්නා සමුද්‍රීය කම්කරු සහතිකයේ කාලය ඉකුත් වීමට පෙර පවත්නා සමුද්‍රීය කම්කරු සහතිකයේ කාලය ඉකුත්වන දිනයට මාස තුනකට වැඩි කාලයකට පෙර අලුත් කිරීමේ පරීක්ෂණය අවසන් කර ඇති විට, අලුත් සමුද්‍රීය කම්කරු සහතිකය, අලුත් කිරීමේ පරීක්ෂණය අවසන් වූ දින සිට අවුරුදු පහකට නොවැඩි කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(11) අලුත් කිරීමේ පරීක්ෂණයක්, සමුද්‍රීය කම්කරු සහතිකයක කාලය ඉකුත්වීමට පෙරාතුව අවසන් වූ පසු, නෞකාව විසින් මේ නියෝගවල විධිවිධාන සහ සම්මුතියේ නියම සපුරාලීම අඛණ්ඩව සිදුකරන බව සොයා ගනු ලබන අවස්ථාවක සහ අලුත් කිරීමේ පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ දී අලුත් සහතිකයක් සැණෙකින් නිකුත් කර එම නෞකාවේ තැබීමට සැලැස්විය නොහැකි අවස්ථාවක, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ පිළිගත් සංවිධානයක් විසින්, සමුද්‍රීය කම්කරු සහතිකයේ වලංගුභාවය, පවත්නා සමුද්‍රීය කම්කරු සහතිකයේ කාලය ඉකුත් වූ දින සිට මාස පහකට නොවැඩි වැඩිදුර කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි අතර ඒ අනුව සමුද්‍රීය කම්කරු සහතිකය පිටසන් කළ යුතු ය. අලුත් සමුද්‍රීය කම්කරු සහතිකය, (9) වන සහ (10) වන අනු-නියෝගවල නියම කරන ලද අදාළ දිනවල ආරම්භ වී අවුරුදු පහකට නොවැඩි කාල සීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(12) පවත්නා සමුද්‍රීය කම්කරු සහතිකයේ කාලය ඉකුත් විමෙන් පසු අලුත්කිරීමේ පරීක්ෂණය අවසන් වී ඇති විට, අලුත් සමුද්‍රීය කම්කරු සහතිකය, අලුත් කිරීමේ පරීක්ෂණය අවසන් වූ දින සිට පවත්නා සහතිකයේ කාලය ඉකුත් වූ දින සිට අවුරුදු පහකට නොවැඩි කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(13) (අ) නෞකාව ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කිරීම අවසන් වන අවස්ථාවක;

(ආ) නෞකාවේ අයිතිකරු වශයෙන් සහතිකයේ හඳුනාගනු ලබන තැනැත්තා විසින් නෞකාව මෙහෙයවීම සඳහා වන වගකීම භාර ගැනීම අවසන් කරනු ලබන අවස්ථාවක;

(ඇ) මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන නවාතැන්වල ව්‍යුහය හෝ උපකරණ, මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන විනෝදාත්මක සහ සන්නිවේදන පහසුකම්, හෝ නෞකාවේ ආහාර සහ ආහාර පාන සැපයීම සඳහා සාරානුකූල වෙනසක් සිදුකර ඇති අවස්ථාවක; හෝ

(ඈ) අතරමැදි පරීක්ෂණය සඳහා සහතිකයෙහි පිටසන් කිරීමක් නොදරන අවස්ථාවක,

නැවක සමුද්‍රීය කම්කරු සහතිකය වලංගුවීම අවසන් වේ.

(14) (අ) (i) බඩු භාරදීම සඳහා යන අලුත් නැවකට;

(ii) නෞකාවක් එහි ධජය වෙනස් කරන අවස්ථාවක; හෝ

(iii) නෞකාවක අයිතිකරුවකු විසින් අලුත් නැවක් මෙහෙයවීමේ වගකීම භාරගනු ලබන අවස්ථාවක,

අතුරු සමුද්‍රීය කම්කරු සම්මුති සහතිකය නිකුත් කරනු ලැබිය හැකි ය.

(ආ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ මේ කාර්යය සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි පරිදි බලයලත් පිළිගත් සංවිධානයක් විසින් අතුරු සමුද්‍රීය කම්කරු සහතිකයක් මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා නිකුත් කරනු ලැබිය යුතු ය. කිසිදු තදනන්තර අතුරු සමුද්‍රීය කම්කරු සම්මුති සහතිකයක් නිකුත් නොකළ යුතු අතර පවත්නා අතුරු සමුද්‍රීය කම්කරු සම්මුති සහතිකය දීර්ඝ නොකළ යුතු ය.

(ඇ) (i) 14 (ඇ)අනු-නියෝගයේ (ii) වන, (iii) වන සහ (iv) වන ඡේද යටතේ වන අයිතම සත්‍යාපනය කිරීම සැලකිල්ලට ගනිමින් සම්මුතියේ A5-I ඇමුණුමෙ හි ලැයිස්තු ගත කරුණු සම්බන්ධයෙන් සාධාරණ සහ ප්‍රායෝගික වන තාක් දුරට නැව පරීක්ෂා කරනු ලැබ ඇති බව;

(ii) සම්මුතිය හා අනුකූල වීම සඳහා නැව සතුව ප්‍රමාණවත් කාර්ය පටිපාටි තිබෙන බව නෞකාවේ අයිතිකරු විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිසි පරිදි බලය ලබාදුන් පිළිගත් සංවිධානයකට පෙන්වා දී ඇති බව;

(iii) නෞකාධිපතිවරයා සම්මුතියේ නියම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන වගකීම් හොඳින් දන්නා බව; සහ

(iv) සමුද්‍රීය කම්කරු අනුකූලතා ප්‍රකාශය ඉදිරිපත් කිරීම සඳහා අදාළ තොරතුරු අධ්‍යක්ෂ-ජනරාල්-වරයා වෙත ඉදිරිපත් කර ඇති බව,

සත්‍යාපනය කිරීමෙන් පසුව පමණක් අතුරු සමුද්‍රීය කම්කරු සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(ඈ) අතුරු සහතිකයේ කාලය ඉකුත්වීමට පෙරාතුව, පූර්ණ කාලීන කම්කරු සහතිකයක් නිකුත් කිරීමට හැකියාව ලබාදීම සඳහා මේ නියෝගයේ (7) වන අනු-නියෝගයට අනුකූලව යම් පරීක්ෂණයක් සිදු කළ යුතු ය.

(15) (අ) නෞකාවක අයිතිකරු විසින්, නැවට අදාළ DMLC හි I වන කොටස නිකුත් කරන ලෙස අධ්‍යක්ෂ-ජනරාල්-වරයා වෙත ලිඛිත ඉල්ලීමක් මගින් ඉල්ලීමක් කළ යුතු ය.

(ආ) නෞකාවේ අයිතිකරු විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වන ලද ලේඛන සහ තොරතුරු අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ලබාදිය යුතු ය.

(16) (අ) නැවක්, සම්මුතියට අනුකූල වන බව පළමුවරට පරීක්ෂා කිරීමට පෙර, DMLC හි II වන කොටස පිළිබඳ සමාලෝචනයක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ නැව පරීක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලයලත් පිළිගත් සංවිධානයක් විසින් අවසන් කරනු ලැබිය යුතු යි.

(ආ) නෞකාවේ අයිතිකරු විසින් සපයන ලද DMLC හි II වන කොටස මගින් මූලික සහ අඛණ්ඩ අනුකූලතාව සඳහා වන පියවර ඇතුළු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද DMLC හි I වන කොටසෙහි නියම සපුරාලන බව සත්‍යාපනය කිරීම, සමාලෝචනයෙහි විෂය පථය වේ.

(ඇ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ නෞකාව පරීක්ෂා කිරීමට අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් බලය ලබාදුන් පිළිගත් සංවිධානයක් විසින් DMLC හි II වන කොටස පිළිබඳ සමාලෝචනය අවසන් කර ඇති බව පිළිබිඹු කිරීම සඳහා ලේඛනගත සාක්ෂි නිකුත් කරනු ලැබිය යුතු ය.

(17) (අ) අදාළ නැව සම්බන්ධයෙන් සිදු කරන ලද සියලු තදනන්තර පරීක්ෂණ හෝ වෙනත් සත්‍යාපනයන් හි ප්‍රතිඵල සහ එවැනි යම් සත්‍යාපනයක් අතරතුර හඳුනාගනු ලැබූ යම් කැපීපෙනෙන අඩුපාඩු, එකී අඩුපාඩු නිවැරදි කර ඇති බව දැනගත් දිනය ද සමග වාර්තා කළ යුතු බවට නෞකාවේ අයිතිකරු විසින් හෝ නෞකාධිපතිවරයා විසින් වගබලා ගත යුතු ය.

(ආ) (17) වන අනු-නියෝගයේ (අ) ඡේදයේ සඳහන් වාර්තාව, එය ඉංග්‍රීසි භාෂාවෙන් නොවන්නේ නම් එහි ඉංග්‍රීසි පරිවර්තනය ද සමග සමුද්‍රීය කම්කරු අනුකූලතා ප්‍රකාශයට ඇතුළත් කර තිබීම හෝ ඊට අමුණා තිබීම හෝ කළ යුතු ය, නැත්නම් වෙනත් ක්‍රමයකින් මුහුදු යාත්‍රාකරුවන්, නැවේ ධජය අයත් රාජ්‍යයේ පරීක්ෂකවරු, වරාය අයිති රාජ්‍යයේ බලයලත් නිලධරයන් සහ නෞකා අයිතිකරුවන්ගේ සහ මුහුදු යාත්‍රාකරුවන්ගේ නියෝජිතවරයන් වෙත ලබාදීමට සැලැස්විය යුතු ය.

(18) සමුද්‍රීය කම්කරු සහතිකය, අතුරු සමුද්‍රීය කම්කරු සහතිකය සහ සමුද්‍රීය කම්කරු අනුකූලතා ප්‍රකාශය, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකෘතිවලින් පිළියෙළ කළ යුතු ය.

37. (1) අදාළ වේ නම්, සමුද්‍රීය කම්කරු අනුකූලතා ප්‍රකාශයෙහි දක්වා ඇති වැඩකිරීමේ සහ ජීවත්වීමේ තත්ත්වයන්ට අදාළ පියවර අනුගමනය කරනු ලබන බවට සහ මේ නියෝගවල නියම සපුරාලන බවට වන සත්‍යාපනය ඇතුළත් විය යුතු ශ්‍රී ලංකාවේ ධජය ප්‍රදර්ශනය කරන නැව්වල සිටින මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන කොන්දේසි පිළිබඳ පරීක්ෂණ පද්ධතියක් (මේ නියෝගවල "ධජය අයත් රාජ්‍යයේ පරීක්ෂණය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ ධජය දැරීමට හිමිකම් ලැබූ නැව්වල දළ ටොන් 500 ට වඩා වැඩි නැව්වල ධජය අයත් රාජ්‍යයේ පරීක්ෂණය, සෑම අවුරුදු තුනකට වතාවක් ම බලයලත් නිලධරයන් විසින් පවත්වනු ලැබිය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ ධජය ප්‍රදර්ශනය කිරීමට හිමිකම් ලැබූ නැව්වල දළ ටොන් 500 ට වඩා වැඩි නැව්වල ධජය අයත් රාජ්‍යයේ පරීක්ෂණය, මේ නියෝගවල අදාළ නියම සපුරා ඇති බව සත්‍යාපනය කිරීම සඳහා සෑම අවුරුද්දකටම එක් වතාවක් බලයලත් නිලධරයන් විසින් පවත්වනු ලැබිය යුතු ය.

(4) (2) වන අනු-නියෝගයේ සඳහන් බලයලත් නිලධරයන් සතුව අවම වශයෙන් පහත දැක්වෙන සුදුසුකම් සහ පුහුණුව තිබිය යුතු යः

(අ) නෞකාධිපතිවරයා (සීමාරහිත) වශයෙන් හෝ ප්‍රධාන ඉංජිනේරුවරයා (සීමා රහිත) වශයෙන් වන ප්‍රවීණතා සහතිකය සහ නෞකා පිළිබඳ ඔවුන්ගේ තාක්ෂණික දැනුම සහ ප්‍රවීණතා සහතිකය ලබාගත් දින සිට නැව්වල ක්‍රියාකාරිත්වය පවත්වාගෙන යාම;

(ආ) දළ ටොන් 500 ක නැව්වල නෞකාධිපතිවරයා හෝ ප්‍රධාන ඉංජිනේරුවරයා වශයෙන් අවුරුදු තුනකට නොඅඩු කාලයක් සඳහා මුහුදු සේවයේ යෙදී සිටීම හෝ වැඩි වශයෙන් ජාත්‍යන්තර මුහුදු ගමන්වල නිරත වීම;

(ඇ) ලේඛනගත පුහුණු වැඩසටහන් මගින් ලබාගත් නැව් පිළිබඳ, ඒවායෙහි ක්‍රියාකාරිත්වය පිළිබඳ සහ ධජය අයත් රාජ්‍යයේ මිනින්දෝරුවරු වශයෙන් තම කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය මේ නියෝගවල විධිවිධාන පිළිබඳ සුදුසු ප්‍රායෝගික සහ සෛද්ධාන්තික දැනුම තිබීම; සහ

(ඈ) එවැනි කාර්ය ඉටු කිරීමේ දී සහාය වන වෙනත් සේවක පිරිස සතුව, ඔවුන් විසින් ඉටු කිරීමට බලයලත් කාර්යයන්ට අනුරූප වන අධ්‍යාපනය, පුහුණුව සහ අධීක්ෂණය තිබිය යුතු වීම.

(5) ශ්‍රී ලංකාවේ ධජය ප්‍රදර්ශනය කරන නෞකාවක් සම්මුතියේ නියමයන්ට අනුකූල නොවන බවට හෝ සමුද්‍රීය කම්කරු අනුකූලතාව පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇති පියවර ක්‍රියාත්මක කිරීමේ දී බරපතල අඩුපාඩුකම් තිබෙන බවට පැමිණිල්ලක් ලැබීමෙන් හෝ සාක්ෂි ලබා ගැනීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ගැටලුව පරීක්ෂා කර, සොයා ගනු ලබන යම් අඩුපාඩුකම්වලට පිළියම් යෙදීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලබන බවට සහතික වීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය.

(6) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, පැමිණිල්ලේ හෝ සාක්ෂිවල මූලාශ්‍රය රහසිගතව තබාගත යුතු ය.

(7) මේ නියෝගයේ (1) වන සහ (5) වන අනුනියෝගවල කාර්යයන් සඳහා, (මෙහි මින්මතු "බලයලත් නිලධරයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පනත යටතේ පත් කරනු ලබන බලයලත් නිලධරයකු හෝ පරීක්ෂකවරයකු විසින්, පූර්ව දැනුම්දීමකින් තොරව රිසි ලෙස යම් නැවකට ගොඩ වී එම නැව පරීක්ෂා කර බැලිය යුතු අතර;

(අ) නැවේ යම් කොටසක් හෝ නැවේ ඇති යම් උපකරණයක් හෝ දෙයක් සම්බන්ධයෙන් විභාගයක් හෝ පරීක්ෂණයක් පැවැත්විය යුතු ය;

(ආ) බලයලත් නිලධරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන ලේඛන ඉදිරිපත් කරන ලෙසට සහ තොරතුරු සපයන ලෙසට නැවේ අයිතිකරුට හෝ නෞකාධිපතිවරයාට හෝ නැවේ නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවකුට නියම කළ යුතු ය;

(ඇ) (ආ) ඡේදයේ සඳහන් කරන ලද යම් ලේඛන පරීක්ෂා කර පිටපත් කරගත යුතු ය;

(ඈ) බලයලත් නිලධරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි මිනුම් සහ ඡායාරූප ගෙන වාර්තා සකස් කළ යුතු ය;

(ඉ) විශ්ලේෂණ කාර්යය සඳහා, නෞකාස්ථව ඇති නිෂ්පාදන, නැව් භාණ්ඩ, කෑම බීම, පානීය ජලය, උපකරණ සහ ද්‍රව්‍ය ගත යුතු හෝ ඉවත් කළ යුතු ය;

(ඊ) පරීක්ෂා කිරීමකින් පසුව, නැවේ ගමන් කරන තැනැත්තන්ගේ සෞඛ්‍යයට සහ සුරක්ෂිතභාවයට බලපෑමක් ඇති කළ හැකි අඩුපාඩුකම් සම්බන්ධයෙන්, වහාම, නැවේ අයිතිකරුගේ, නැවේ ක්‍රියාකරුගේ හෝ නෞකාධිපතිවරයාගේ අවධානය යොමු කරවිය යුතු ය;

(උ) අදාළ වන්නේ නම්, යම් අඩුපාඩුකම් සම්බන්ධයෙන් පිළිගත් සංවිධානය දැනුවත් කළ යුතු ය.

(8) බලයලත් නිලධරයා විසින් නැවක යම් පරීක්ෂා කිරීමක් මගින්-

(අ) මේ නියෝගවල අදාළ විය යුතු විධිවිධානවලට අනුකූලවීමේ යම් අඩුපාඩුකමක්; හෝ

(ආ) අනුකූලතා පියවර ක්‍රියාත්මක කිරීමේ යම් අඩුපාඩුකමක්;

හඳුනාගන්නේ නම්, බලයලත් නිලධරයා විසින්, ලිඛිත දැන්වීමක් මගින්, දැන්වීමෙහි නිශ්චිතව දක්වනු ලබන කාලසීමාව ඇතුළත එම අඩුපාඩුකම නිවැරදි කරනු ලබන ලෙසට නැවේ අයිතිකරු වෙත සහ නෞකාධිපතිවරයා වෙත නියම කළ යුතු ය.

(9) (අ) (8) වන අනුනියෝගයේ සඳහන් කරන ලද යම් අඩුපාඩුකම් මගින් මේ නියෝගවල යම් විධිවිධාන බරපතල ලෙස හෝ නැවත නැවතත් කඩ කිරීමක් සිදු වන්නේ නම්; හෝ නැවේ ගමන්කරන මුහුදු යාත්‍රාකරුවන්ගේ සුරක්ෂිතභාවයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට ඇතිවිය හැකි සැලකිය යුතු අනතුරක් පිළිබඳ නිරූපණය වන්නේ නම්, බලයලත් නිලධරයා විසින්;

(i) ලිඛිත දැන්වීමක් මගින්, අඩුපාඩුකම් නිවැරදි කරන තෙක් නැව මුහුදට ගමන් නොකළ යුතු බවට නැවේ අයිතිකරු වෙත සහ නෞකාධිපතිවරයා වෙත විධාන කළ යුතු ය; සහ

(ii) විධානයට පටහැනිව නැව මුහුදට ගමන් කිරීම තහනම් කිරීම සඳහා පියවර ගත යුතු ය.

(ආ) නැවක් අසාධාරණ ලෙස රඳවා තබා ගනු ලැබීම හෝ ප්‍රමාද කරනු ලැබීම වැළැක්වීම සඳහා බලයලත් නිලධරයා විසින් සියලු සාධාරණ උත්සාහයන් ගනු ලැබිය යුතු ය.

(10) (අ) (9) වන අනුනියෝගය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයකින් නැවක අයිතිකරු අතෘප්තියට පත්වන්නේ නම්, නැවේ අයිතිකරු විසින්, තීරණය පිළිබඳ දැන්වීම ලැබීමෙන් පසු වැඩ කරන දින 30 ක් ඇතුළත, තීරණයට එරෙහිව (මෙහි මින්මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පනත ක්‍රියාත්මක කිරීම පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(ආ) ලේකම්වරයා විසින්, අන්‍යාකාරයකින් ලිඛිතව විධාන කරනු ලබන්නේ නම් මිස අභියාචනය, තීරණය ක්‍රියාත්මක වීම කෙරෙහි බලපෑමක් සිදු නොකරයි.

(11) (අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, (9) වන අනුනියෝගය යටතේ නැවක් සම්බන්ධව ලිඛිත දැන්වීමක් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක දී; සහ

(ආ) දැන්වීමට අනුව දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති අඩුපාඩුකම නිවැරදි කර නොමැති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, නැවේ අයිතිකරු සහ නෞකාධිපතිවරයා වෙත ලිඛිත දැන්වීමක් කිරීම මගින්, නැවට අදාළව නිකුත් කර ඇති සමුද්‍රීය කම්කරු සහතිකය, තාවකාලික සමුද්‍රීය කම්කරු සහතිකය හෝ අනුකූලතා වාර්තාව අවලංගු කරනු ලැබිය යුතු ය. දළ ටොන් 500ට අඩු නැවක් සම්බන්ධයෙන් වන විට දී, නිකුත් කරන ලද අදාළ ව්‍යවස්ථාපිත සහතිකය අවලංගු කරනු ලැබිය යුතු ය.

(12) (අ) (1)වන අනුනියෝගය යටතේ දැන්වීමක් ලැබීමෙන් පසුව, නැවේ අයිතිකරු සහ නෞකාධිපතිවරයා විසින්, සහතිකය සහ වාර්තා වහාම අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත බාර දෙනු ලැබිය යුතු ය.

(ආ)නැවේ අයිතිකරු හෝ නෞකාධිපතිවරයා විසින්, අඩුපාඩුකමක් නිවැරදි කරනු ලැබීමෙන් පසුව, සහතිකය හෝ වාර්තාව නැවත ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය හැකි අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් යටත් නැව පරීක්ෂා කිරීමකින් පසුව ඒවා නැවත ලබා දිය යුතු ය.

(13) (අ) බලයලත් නිලධරයා විසින්, (2) වන සහ (3) වන අනුනියෝග යටතේ පවත්වනු ලබන පරීක්ෂා කිරීමක් පිළිබඳ වාර්තාවක් සකස් කර අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ආ) වාර්තාවේ :-

(i) පරීක්ෂා කිරීම ආරම්භ කිරීමේ සහ අවසන් කිරීමේ දිනය; සහ

(ii) හඳුනාගත් යම් අඩුපාඩුකමක් පිළිබඳ තොරතුරු සහ එම අඩුපාඩුව නිවැරදි කරන ලද දිනය,

දැක්විය යුතු ය.

(ඇ) වාර්තාවේ එක් පිටපතක් නැවේ නෞකාධිපතිවරයා වෙත සැපයනු ලැබිය යුතු අතර තවත් පිටපතක් යාත්‍රාකරුවන්ගේ, දැනුවත්වීම පිණිස නැවේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර, ඉල්ලීම මත, ඔවුන්ගේ නියෝජිතයන්ට යවනු ලැබිය යුතු ය.

(ඈ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, පරීක්ෂා කිරීම පිළිබඳ වාර්තා පවත්වාගෙන යනු ලැබිය යුතු අතර අවුරුද්ද අවසන් වීමෙන් පසුව, මාස හයක් නොඉක්මවන සාධාරණ කාලසීමාවක් ඇතුළත පරීක්ෂා කිරීමේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාවක් පළ කරනු ලැබිය යුතු ය.

(14) අදාළ මුහුදු යාත්‍රාකරුවන්ගේ සුරක්ෂිත භාවයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට අවදානමක් ඇති කළ හැකි, මේ නියෝගවල නියමයන් පැහැදිලි ලෙස උල්ලංඝනය කිරීමක් නොමැති අවස්ථාවක දී සහ ඒ හා සමාන උල්ලංඝනය කිරීම් පිළිබඳ පූර්ව ඉතිහාසයක් නොමැති අවස්ථාවක දී, නඩු කටයුතු පැවරීම හෝ නිර්දේශ කිරීම වෙනුවට අවවාද ලබා දීමට බලයලත් නිලධරයාට අභිමතය තිබිය යුතු ය.

(15) මුහුදු යාත්‍රාකරුවන්ගේ කාර්ය සහ ජීවන තත්ත්වයන්ට අදාළව යම් අවදානමක් හෝ අඩුපාඩුකමක් පිළිබඳ හෝ නීති සහ නියෝග උල්ලංඝනය කිරීමක් පිළිබඳ චෝදනා කරමින් වන යම් දුක් ගැන්විල්ලක හෝ පැමිණිල්ලක මූලාශ්‍රය සම්බන්ධයෙන් බලයලත් නිලධරයා රහසිගතව කටයුතු කළ යුතු අතර පරීක්ෂා කිරීමක් සිදු කරන ලද්දේ එම දුක් ගැනවිල්ලේ හෝ පැමිණිල්ලේ ප්‍රතිඵලයක් ලෙස බවට වන කිසිදු දැන්වීමක්, නැවේ අයිතිකරුට, නැවේ අයිතිකරුගේ නියෝජිතයකුට හෝ නැව් ක්‍රියාකරුට ලබා නොදිය යුතු ය.

(16) බලයලත් නිලධරයා වෙත, අදාළ කාර්ය සංඛ්‍යාව හෝ ස්වභාවය හේතුවෙන්, කවර හෝ ආකාරයකින් ඔවුන්ගේ අධිකාරය හෝ නැව් අයිතිකරුවන්, මුහුදු යාත්‍රාකරුවන් හෝ වෙනත් උනන්දුවක් දක්වන පාර්ශවයන් සමඟ ඔවුන්ගේ ඇති සම්බන්ධතාවල අපක්ෂපාතීත්වය පිළිබඳ කාර්යක්ෂම ලෙස පරීක්ෂා කිරීමට හෝ අගතියට බාධා විය හැකි කාර්ය පවරනු නොලැබිය යුතු ය.

විශේෂයෙන් ම, බලයලත් නිලධරයා විසින්-

(අ) පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ව කැඳවනු ලබන යම් මෙහෙයුමක් සමඟ කිසිදු සෘජු හෝ සෘජු නොවන සම්බන්ධතාවක් පවත්වා ගැනීම තහනම් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) උචිත දඬුවම් හෝ විනය ක්‍රියාමාර්ගවලට යටත්ව, සේවය හැර යාමෙන් පසුව වුවද, ඔවුන් විසින් ඔවුන්ගේ කාර්යයන් කරගෙන යාමේ දී දැනගනු ලබන යම් වාණිජමය රහස් හෝ රහසිගත වැඩ කිරීමේ ක්‍රියාවලීන් හෝ තොරතුරු අනාවරණය නොකළ යුතු ය.

(17) බලයලත් නිලධරයාට, පරීක්ෂණය ස්වාධීන ලෙස සහ කිසිදු බාහිර බලපෑම්වලින් තොරව පවත්වනු ලබන බව සහතික කිරීම සඳහා සේවා තත්ත්වයන් සහ කොන්දේසි තිබිය යුතු ය.

(18) බලයලත් නිලධරයාගේ බලතල වැරදි ලෙස ක්‍රියාවට නැංවීමෙන් සිදුවන යම් පාඩු හෝ හානි සඳහා වන්දියක් ගෙවීමට රජය යටත් විය යුතු ය.

38. (1) එහි සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී හෝ මෙහෙයුම් හේතු සඳහා, ශ්‍රී ලංකාවේ වරායන් වෙත පැමිණෙන සෑම විදේශීය නැවක් ම, නැවේ යාත්‍රාකරුවන්ගේ කාර්ය සහ ජීවන තත්ත්වයන්වලට අදාළ (මුහුදු යාත්‍රාකරුවන්ගේ අයිතීන් ඇතුළුව) සම්මුතියේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම සමාලෝචනය කිරීම සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලයලත් නිලධරයන් විසින් සිදු කරනු ලබන පරීක්ෂා කිරීමකට යටත් විය හැකි ය.

(2) (මුහුදු යාත්‍රාකරුවන්ගේ අයිතීන් ඇතුළුව) සම්මුතියේ නියමයන්ට අනුකූලව කටයුතු කරන බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂිය වශයෙන් වලංගු සමුද්‍රීය කම්කරු සහතිකයක් සහ සමුද්‍රීය කම්කරු අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය පිළිගනු ලැබිය යුතු ය. ඒ අනුව, වරායයන්හි දී සිදු කෙරෙන පරීක්ෂා කිරීම්, (4) වන අනු-නියෝගයේ පහත නිශ්චිතව දක්වා ඇති අවස්ථානුගත කරුණුවල දී හැර, සහතිකයේ සහ ප්‍රකාශයේ සමාලෝචනයට සීමා විය යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ වරායකට ඇතුල් වන විදේශ නැව්වල සිටින මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන කාර්ය සහ ජීවන තත්ත්වයන් (මුහුදු යාත්‍රාකරුවන්ගේ අයිතීන් ඇතුළුව) සම්මුතියේ නියමයන්ට අනුකූල වන බව සහතික කර ගැනීමට උපකාරී වීම සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, එලදායී වරාය පිහිටි රාජ්‍යය පරීක්ෂා කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ පද්ධතියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ යම් බලයලත් නිලධරයකු පරීක්ෂාවක් සිදු කිරීම සඳහා නැවට ගොඩ වී, අදාළ වන අවස්ථාවක දී, සමුද්‍රීය කම්කරු සහතිකය සහ සමුද්‍රීය කම්කරු අනුකූලතාව පිළිබඳ ප්‍රකාශය ඉල්ලා සිටිනු ලබන විට,

(අ) නියමිත ලේඛන ඉදිරිපත් නොකරනු ලබන බව හෝ පවත්වාගෙන යනු නොලබන බව හෝ එම ලේඛන ව්‍යාජ ලෙස පවත්වාගෙන යන බව හෝ ඉදිරිපත් කරන ලද ලේඛනවල සම්මුතිය විසින් නියම කරන ලද තොරතුරු අන්තර්ගත නොවන බව හෝ අන්‍යාකාරයකින් වලංගු නොවන බව; හෝ

(ආ) නැවේ කාර්ය සහ ජීවන තත්ත්වයන් සම්මුතියේ නියමයන්ට අනුකූල නොවන බව විශ්වාස කිරීමට පැහැදිලි හේතූන් ඇති බව; හෝ

(ඇ) සම්මුතියට අනුකූලව කටයුතු කිරීම මඟ හැරීමේ කාර්ය සඳහා නැව විසින් ධජය වෙනස් කර ඇති බව විශ්වාස කිරීමට සාධාරණ හේතූන් ඇති බව; හෝ

(ඈ) නැවේ විශේෂිත කාර්ය සහ ජීවන තත්ත්වයන් සම්මුතියේ නියමයන්ට අනුකූල නොවන බවට චෝදනා කරමින් පැමිණිල්ලක් ඇති බව;

ඔවුන් විසින් සොයා ගනු ලබන අවස්ථාවක දී, නැවේ කාර්ය සහ ජීවන තත්ත්වයන් නිශ්චය කිරීම සඳහා වඩාත් සවිස්තරාත්මක පරීක්ෂා කිරීමක් සිදුකරනු ලැබිය හැකි ය. දෝෂ සහගත යැයි විශ්වාස කරනු ලබන හෝ කියනු ලබන කාර්ය සහ ජීවන තත්ත්වයන් මගින් මුහුදු යාත්‍රාකරුවන්ගේ ආරක්ෂාවට, සෞඛ්‍යයට හෝ සුරක්ෂිතභාවයට පැහැදිලි ලෙස ම උපද්‍රවයක් ඇති කළ හැකි අවස්ථාවක හෝ යම් අඩුපාඩුකම් මගින් (මුහුදු යාත්‍රාකරුවන්ගේ අයිතීන් ඇතුළුව) සම්මුතියේ නියමයන් බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් සිදු කළ හැකි බව විශ්වාස කිරීමට හේතු බලයලත් නිලධරයාට ඇති අවස්ථාවක එවැනි පරීක්ෂා කිරීමක් සිදු කරනු ලැබිය යුතු ය.

(5) 4(අ), 4(ආ) හෝ 4(ඇ) වන අනුනියෝගවල දක්වා ඇති අවස්ථානුගත කරුණුවල දී විදේශීය නැවක් සම්බන්ධයෙන් වඩාත් සවිස්තරාත්මක පරීක්ෂා කිරීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී, සමුද්‍රීය කම්කරු අනුකූලතාව පිළිබඳ ප්‍රකාශයේ ඇති, සම්මුතියේ A5-III පරිශිෂ්ඨයේ ලැයිස්තුගත කර ඇති කාරණා ප්‍රධාන කවරයේ තිබිය යුතු ය.

(6) 4(ඈ) ඡේදය යටතේ වන පැමිණිල්ලක් සම්බන්ධයෙන් වන විට දී, පැමිණිල්ලක් හෝ එහි පරීක්ෂා කිරීම විසින් 4(ආ) වන අනුනියෝගයට අනුකූලව සවිස්තරාත්මක පරීක්ෂා කිරීමක් සඳහා පැහැදිලි හේතු සපයනු ලැබූවද, පරීක්ෂා කිරීම සාමාන්‍යයෙන් පැමිණිල්ලේ විෂය පථය තුළ කාරණාවලට සීමා විය යුතු ය. 4(ඈ) වන අනුනියෝගයේ කාර්යය සඳහා, පැමිණිල්ල යන්නෙන්, මුහුදු යාත්‍රාකරුවකු, වෘත්තියමය ආයතනයක්, සංගමයක්, වෙළඳ සමිතියක් හෝ සාමාන්‍යයෙන්, නෞකාස්ථ යාත්‍රාකරුවන්ට ඇතිවිය හැකි ආරක්ෂක හෝ සෞඛ්‍ය උපද්‍රව ඇතුළුව නැවේ ආරක්ෂාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු අදහස් වේ.

(7) වඩාත් සවිස්තරාත්මක පරීක්ෂා කිරීමකට පසුව, නැවේ කාර්ය සහ ජීවන තත්ත්වයන් සම්මුතියේ නියමයන්ට අනුකූල නොවන බව සොයා ගනු ලබන අවස්ථාවක දී, බලයලත් නිලධරයා විසින් වහාම එම අඩුපාඩුකම නිවැරදි කිරීම සඳහා අවසන් කළ යුතු කාලසීමාවන් නියම කරමින් නෞකාධිපතිවරයාගේ අවධානය ඒ වෙත යොමු කරවිය යුතු ය. බලයලත් නිලධරයා විසින් එම අඩුපාඩුකම් වැදගත් යැයි සලකනු ලබන අවස්ථාවක දී හෝ ඒවා 4(ඈ) වන අනුනියෝගයට අනුව කරන ලද පැමිණිල්ලකට අදාළ වන්නේ නම්, බලයලත් නිලධරයා විසින්:

(අ) එම අඩුපාඩුකම් ධජය අයත් රාජ්‍යයේ අවධානයට යොමු කරවිය යුතු ය; සහ

(ආ) අදාළ තොරතුරු ඊළඟට ගමන් ගන්නා වරායේ නිසි බලධරයන් වෙත සපයනු ලැබිය යුතු ය.

(8) නියමිත කාලසීමාව ඇතුළත ධජය අයත් රාජ්‍යයේ නිසි බලධරයන්ගෙන් ලැබෙන යම් පිළිතුරක් සමග තිබිය යුතු ය. නිලධරයන්ගේ වාර්තාවේ පිටපතක්, එම තොරතුරු පිළිබඳ වාර්තාවක් තබා ගනු ලබන බව සහ අදාළ උපයෝජන කාර්ය පටිපාටීන් පිළිබඳ තමන් විසින් දැනුවත් වීම පිළිබඳ උනන්දුවක් දැක්විය හැකි පාර්ශවයන්ගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවන ලද බව සහතික කිරීම සඳහා උචිත සහ යෝග්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ග පිළිබඳ අදහසක් සහිතව, ජාත්‍යන්තර කම්කරු කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යවනු ලැබිය හැකි ය.

(9) බලයලත් නිලධරයකු විසින් සිදුකරනු ලබන බඩාත් සවිස්තරාත්මක පරීක්ෂා කිරීමකට පසුව, නැව, සම්මුතියේ නියමයන්ට අනුකූලව කටයුතු නොකරන බව සහ:

(අ) නෞකාස්ථ තත්ත්වයන් පැහැදිලිවම මුහුදු යාත්‍රාකරුවන්ගේ ආරක්ෂාවට, සෞඛ්‍යයට හෝ සුරක්ෂිතභාවයට අන්තරායකර වන බව; හෝ

(ආ) අනුකූලව කටයුතු නොකිරීම මගින් (මුහුදු යාත්‍රාකරුවන්ගේ අයිතීන් ඇතුළුව) සම්මුතියේ නියමයන් බරපතල ලෙස හෝ පුනරාවර්ත ලෙස උල්ලංඝනය කිරීමක් සිදු කරන බව;

සොයා ගනු ලබන අවස්ථාවක දී, මෙම අනු-නියෝගයේ (අ) හෝ (ආ) අනුඡේදවල විෂය පථය තුළට අයත් වන යම් අනනුකූලතා නිවැරදි කරනු ලබන තෙක් හෝ එම අනනුකූලතා නිවැරදි කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්මක් බලයලත් නිලධරයා විසින් අනුමත කරනු ලැබ එම සැලැස්ම කඩිනමින් ක්‍රියාත්මක කරනු ලබන බවට ඔහු සෑහීමකට පත්වන තෙක් නැව මුහුදට ගමන් නොකරන බව සහතික කිරීම සඳහා බලයලත් නිලධරයා විසින් පියවර ගනු ලැබිය යුතු ය. නැව යාත්‍රා කිරීමෙන් වළක්වනු ලබන්නේ නම්, බලයලත් නිලධරයා විසින් වහාම ඒ පිළිබඳව ධජය අයත් රාජ්‍යය වෙත දැනුම් දෙනු ලැබිය යුතු අතර නියමිත කාලසීමාව ඇතුළත පිළිතුරු දෙන ලෙස ධජය අයත් රාජ්‍යයෙන් ඉල්ලා සිටිමින්, හැකි නම්, ධජය අයත් රාජ්‍යයේ නියෝජිතයකුට පැමිණෙන ලෙසට ආරාධනා කළ යුතු ය.

(10) නැවක් අනිසි ලෙස රඳවා තබා ගැනීම හෝ ප්‍රමාද වීම වැළැක්වීම සඳහා ගත හැකි සියලු උත්සාහයන් ගනු ලැබිය යුතු ය. නැවක් අනිසි ලෙස රඳවා තබාගනු ලබන බව හෝ ප්‍රමාද වන බව සොයා ගනු ලැබුවහොත්, දරනු ලබන යම් පාඩුවක් හෝ හානියක් වෙනුවෙන් වන්දි ගෙවනු ලැබිය යුතු ය. එක් එක් අවස්ථාව ඔප්පු කිරීමේ වගකීම පැමිණිලිකරු මත විය යුතු ය.

39. (1) ශ්‍රී ලංකාවේ වරායකට හෝ ස්ථානයකට පැමිණෙන, (මුහුදු යාත්‍රාකරුවන්ගේ අයිතීන් ඇතුළුව) සම්මුතියේ නියමයන් උල්ලංඝනය කිරීමක් සිදු කරන්නේ යැයි කියනු ලබන නැව්වල යාත්‍රාකරුවන්ට, ඉක්මන් සහ ප්‍රායෝගික ලෙස පහසුකම් සැලැස්වීම සඳහා, එවැනි පැමිණිල්ලක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වාර්තා කිරීමේ අයිතිය ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කළ යුතු ය.

(2) (1) වන අනුනියෝගයේ සඳහන් කරන ලද පැමිණිල්ලක් ලැබීමෙන් පසුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා විසින් මූලික විමර්ශනයක් සිදු කරනු ලැබිය යුතු ය.

(3) පැමිණිල්ලේ ස්වභාවය සලකා බලා, උචිත අවස්ථාවල දී, සම්මුතියේ 5.1.5 වන නියෝගය යටතේ විධිවිධාන සලස්වා ඇති නෞකාස්ථ පැමිණිලි කාර්ය පටිපාටිය සෝදිසි කරනු ලැබ ඇත්තේ දැයි යන්න පිළිබඳ සලකා බැලීමක් මූලික විමර්ශනයට ඇතුළත් කරනු ලැබිය යුතු ය. බලයලත් නිලධරයා විසින් මෙම නියෝගවල 38 වන නියෝගයට අනුකූලව වඩාත් සවිස්තරාත්මක පරීක්ෂා කිරීමක් ද සිදු කරනු ලැබිය හැකි ය.

(4) මෙම නියෝගය යටතේ විධිවිධාන සලස්වා ඇති විමර්ශනය හෝ පරීක්ෂා කිරීම මගින් 38 වන නියෝගයේ (9) වන අනුනියෝගයේ විෂය පථය තුළට අයත් වන අනනුකූලතාවක් හෙළිදරව් කරන අවස්ථාවක දී, එම අනුනියෝගයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) මෙම නියෝගයේ 4 වන අනුනියෝගයේ විධිවිධාන අදාළ නොවන සහ නෞකාස්ථ මට්ටමෙන් පැමිණිල්ල විසඳා නොමැති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ බලයලත් නිලධරයා විසින්, නියමිත කාලසීමාව ඇතුළත, උපදෙස් සහ නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් අපේක්ෂා කරමින්, එම විෂයගත නැව දරනු ලබන ධජය අයත් රාජ්‍යය වෙත වහාම දැනුම් දිය යුතු ය.

(6) මෙම නියෝගයේ (5) වන අනුනියෝගයට අනුකූලව ගන්නා ලද ක්‍රියාමාර්ගවලින් පසුව පැමිණිල්ල විසඳා නොමැති අවස්ථාවක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, බලයලත් නිලධරයාගේ වාර්තාවේ පිටපතක් ජාත්‍යන්තර කම්කරු කාර්යාලය වෙත යැවිය යුතු ය. වාර්තාව සමඟ එම විෂයගත නැව ප්‍රදර්ශනය කරන ධජය අයත් රාජ්‍යයේ නිසි බලධරයාගෙන් නියමිත කාලසීමාව ඇතුළත ලැබෙන යම් පිළිතුරක් යවනු ලැබිය යුතු ය.

(7) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මුහුදු යාත්‍රිකරුවන් විසින් කරනු ලබන පැමිණිලිවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා යෝග්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

40. (1) ශ්‍රී ලාංකික නැවක අයිතිකරු හෝ නෞකාධිපතිවරයා විසින්, (මුහුදු යාත්‍රිකරුවන්ගේ අයිතීන් ඇතුළුව)සම්මුතියේ නියමයන් උල්ලංඝනය කිරීම් යැයි කියනු ලබන මුහුදු යාත්‍රිකරුවන්ගේ පැමිණිලි සාධාරණව, ඵලදායී ලෙස සහ කඩිනම්ව මෙහෙයවීම සඳහා (2) වන අනුනියෝගයේ සඳහන් කරන ලද නෞකාස්ථ පැමිණිලි කාර්ය පටිපාටි යොදා ගනු ලැබිය යුතු ය.

(2) (අ) පැමිණිලිකාර මුහුදු යාත්‍රිකරුවා විසින් ඔහුගේ/ඇයගේ පැමිණිල්ල ලිඛිතව සිදුවීමෙන් දින පහක් ඇතුළත හෝ අවස්ථානුගත කරුණු අනුව, පහත දැක්වෙන අනුපිළිවෙළ අනුගමනය කරමින් ඉදිරිපත් කළ යුතු යඃ

(i) ඉහළ නිලධරයා
(ii) අංශාධිපතිවරයා
(iii) නෞකාධිපතිවරයා

එක් එක් තැනැත්තාට පැමිණිල්ල විසඳීම සඳහා තවදුරටත් දින පහක් ඇත.

(ආ) පැමිණිලි හැකි තරම් පහළ මට්ටමේ දී විසඳා ගැනීමට අපේක්ෂා කළ යුතු අතර; දෙපාර්ශවයම පැහීමට පත් වන පරිදි කාරණාව විසඳා ගනු ලැබීමට නොහැකි වන විට දී පමණක්, එය ඊළඟ මට්ටමකට ලබා දිය යුතු ය.

(ඇ) මුහුදු යාත්‍රිකරුවන්ට, සෘජුවම නෞකාධිපතිවරයා වෙත මෙන්ම ඔවුන් අවශ්‍ය යැයි සලකන අවස්ථාවල දී අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ වරායේ සුදුසු බලයලත් නිලධරයකු වෙත පැමිණිලි කිරීමේ අයිතිය තිබේ.

(ඈ) පැමිණිලිකාර මුහුදු යාත්‍රිකරුවා විසින් පැමිණිල්ල නෞකාධිපතිවරයා වෙත යොමු කරනු ලබන්නේ නම්, නෞකාධිපතිවරයා විසින් පෞද්ගලිකව පැමිණිල්ල මෙහෙයවිය යුතු අතර පැමිණිල්ල මෙහෙයවීම සඳහා නැවේ අයිතිකරු විසින් නම් කරන ලද තැනැත්තාගේ සහාය අපේක්ෂා කරනු ලැබිය හැකි ය.

(ඉ) නෞකාධිපතිවරයාට පැමිණිල්ල විසඳීමට නොහැකි වන්නේ නම්, එය නෞකාධිපතිවරයා හරහා නැවේ අයිතිකරු වෙත ඉදිරිපත් කිරීමට හෝ පැමිණිල්ල මගින් නෞකාධිපතිවරයාට අගතියක් විය හැකි නම්, එවිට සෘජුවම නැවේ අයිතිකරු වෙත ඉදිරිපත් කිරීමට මුහුදු යාත්‍රිකරුට දින දහයක් තිබිය යුතු ය.

(ඊ) කාරණය විසඳීම සඳහා නැවේ අයිතිකරුට සහ අදාළ මුහුදු යාත්‍රාකරුවාට එතැන් සිට දින විස්සක කාලසීමාවක් තිබිය යුතු ය.

(උ) දින විස්සකින් පසුව, පැමිණිල්ල විසඳනු ලබා නොමැති නම්, එවිට කාරණය අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීම සඳහා එක් එක් පාර්ශවයට තවදුරටත් දින විස්සක් තිබිය යුතු ය.

(ඌ) පැමිණිලිකාර මුහුදු යාත්‍රාකරුවාට තවත් අයකු කැටුව යාමට සහ ඔවුන්ගේ තේරීමට අනුව නැවේ වෙනත් මුහුදු යාත්‍රාකරුවකු විසින් නියෝජනය කරනු ලැබීමට අයිතිය තිබේ.

(එ) පැමිණිලි කාර්ය පටිපාටිය තුළ මුහුදු යාත්‍රාකරුවන්ට තවත් අයකු කැටුව යාමට හෝ වෙනත් අයකු විසින් නියෝජනය කරනු ලැබීමට අයිතිය තිබේ.

(ඒ) පැමිණිලිකාර මුහුදු යාත්‍රාකරුවා දඬුවමකට හෝ අසාධාරණයකට ලක් නොවිය යුතු ය.

(ඔ) නැවක නෞකාධිපතිවරයා විසින්, නැවේ එක් එක් නෞකාස්ථ මුහුදු යාත්‍රාකරුවා වෙත-

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිර්ණය කරනු ලැබිය හැකි ආකාරයකින් පැමිණිලි කාර්ය පටිපාටියේ පිටපතක්; සහ

(ආ) (i) අධ්‍යක්ෂ ජනරාල්වරයා; සහ/හෝ

(ii) මුහුදු යාත්‍රාකරුවා පදිංචි රටේ නිසි බලධරයා;

සම්බන්ධ කර ගත හැකි තොරතුරු;

සපයනු ලබන බවට සහතික විය යුතු ය.

(ඕ) සියලු අවස්ථාවල දී, මුහුදු යාත්‍රාකරු විසින් කාර්ය සඳහා යෝග්‍ය යැයි සලකනු ලබන කවර හෝ නෛතික ආකාරයක් මගින් සහන අපේක්ෂා කිරීමේ අයිතිය මුහුදු යාත්‍රාකරුවන්ට තිබිය යුතු ය.

41. (1) ශ්‍රී ලංකාවේ ධජය දරන නැවක් සම්බන්ධව සිදුවන ජීවිත හානියකට හෝ අහිමිවීමකට හේතු වන යම් බරපතල සමුද්‍රීය හදිසි අනතුරක් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිල පරීක්ෂණයක්, පවත්වනු ලැබිය යුතු ය. පරීක්ෂණයක අවසාන වාර්තාව සාමාන්‍යයෙන් ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

(2) මෙම නියෝගයේ 1 වන අනුනියෝගයේ සඳහන් කරන ලද බරපතල සමුද්‍රීය හදිසි අනතුරු පිළිබඳ විමර්ශනයට පහසුකම් සැලසීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වෙනත් ගිවිසුම්කාර රාජ්‍යයන් සමග සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.

(3) (1) වන අනුනියෝගයේ සඳහන් කරන ලද නිල පරීක්ෂණය, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය (IMO) විසින් සම්මත කරන ලද සමුද්‍රීය හදිසි අනතුරු හෝ සමුද්‍රීය සිද්ධි පිළිබඳ ආරක්ෂණ විමර්ශනයක් සඳහා වන ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පරිචයන් පිළිබඳ සංග්‍රහයේ විධිවිධාන (හදිසි අනතුරු විමර්ශන සංග්‍රහය) වලට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

42. මෙම කොටසේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර එයට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් මිලියනයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

## VII වන කොටස

### *සාමාන්‍ය විධිවිධාන*

43. (1) සමුද්‍රීය අංශය වෙත ස්ථිර සහ දක්ෂ ශ්‍රම බලකායන් ලබාදීම සඳහා සහ මුහුදු යාත්‍රාකරුවන්ට ඔවුන්ගේ දක්ෂතා, සුදුසුකම් සහ රැකියා අවස්ථා ශක්තිමත් කර ගැනීමට උපකාරී වීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මුහුදු යාත්‍රාකරුවන් සඳහා වන වෘත්තීය සහ කුසලතා සංවර්ධන සහ රැකියා අවස්ථා දිරි ගැන්විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අදාළ අයිතිකරුවන් සහ මුහුදු යාත්‍රාකරුවන්ගේ සංවිධාන විමසා, දිගටම පවත්නා පුහුණු කිරීම ඇතුළුව, මූලිකව ම නැවේ ආරක්ෂිත මෙහෙයුම් සහ යාත්‍රා කිරීමට අදාළ නෞකාස්ථ කාර්යයන් සහිත මුහුදු යාත්‍රාකරුවන්ගේ වෘත්තිමය මාර්ගෝපදේශනය, අධ්‍යාපනය සහ පුහුණු කිරීම සඳහා පැහැදිලි අරමුණු පිහිටුවනු ලැබිය යුතු ය.

44. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි, සම්මුතියේ විධිවිධානවල අවම තාක්ෂණික ප්‍රමිතීන් සමග අනුකූලව ක්‍රියා කිරීම සඳහා පනතේ 321අ වන වගන්තිය යටතේ යම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

45. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ශ්‍රී ලංකාවේ වරායන්හි ඇති නැව්වල මුහුදු යාත්‍රාකරුවන්ට ප්‍රමාණවත් සුබසාධන පහසුකම් සහ සේවාවන්ට ප්‍රවේශවීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා කලින් කලට ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් නිකුත් කරනු ලැබිය හැකි ය.

46. මේ නියෝගවල-

"පනත" යන්නෙන්, 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත අදහස් වේ;

"සංවත්සර දිනය" යන්නෙන්, අදාළ සහතිකයේ කල් ඉකුත් වීමේ දිනයට අනුරූප වන එක් එක් වර්ෂයේ දිනය සහ මාසය අදහස් වේ;

"නැව්වලට එරෙහි සන්නද්ධ මංකොල්ලය" යන්නෙන්, රාජ්‍යයක අභ්‍යන්තර ජල තීරය, දූපත් ආශ්‍රිත ජල තීරය සහ දේශීය මුහුදු තීරය තුළ, පුද්ගලික අරමුණු සඳහා සිදු කරනු ලබන සහ නැවකට එරෙහිව හෝ එවැනි නැවක නෞකාස්ථ තැනැත්තන්ට හෝ දේපළවලට එරෙහිව මෙහෙයවනු ලබන, මුහුදු කොල්ල කෑමේ ක්‍රියාවක් නොවන, යම් නීති විරෝධී ප්‍රචණ්ඩ ක්‍රියාවක් හෝ රඳවා තබා ගැනීමක් හෝ යම් කොල්ල කෑමේ ක්‍රියාවක් හෝ එයින් තර්ජනය කිරීමක් අදහස් වේ;

"සමූහික කේවල් කිරීමේ ගිවිසුම" යන්නෙන්,

(i) මුහුදු යාත්‍රාකරුවන් ශ්‍රී ලංකා ධජය දරන නැව්වල නෞකාස්ථව සේවයේ යෙදවීම සඳහා මුහුදු යාත්‍රාකරුවන්ගේ වෙළඳ සංගම් සහ ශ්‍රී ලාංකික නැව් අයිතිකරුවන් අතර, කලින් කලට, අත්සන් කරනු ලබන ගිවිසුමක්; හෝ

(ii) විදේශීය ධජය දරන නැව්වල නෞකාස්ථව සේවයේ යෙදවීමක් සඳහා අදාළ වෙළඳ සංගම් සහ සේවායෝජකයන් අතර අත්සන් කරනු ලබන, අදාළ ධජය අයත් රාජ්‍යයේ නීතිවලට අනුකූල වන ගිවිසුමක්;

අදහස් වේ;

"දළ ටොන් ප්‍රමාණය" යන්නෙන්, 1969 නැව්වල ටොන් ප්‍රමාණය මැනීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ හෝ යම් අනුප්‍රාප්තික සම්මුතියක I වන ඇමුණුමේ අන්තර්ගත ටොන් ප්‍රමාණය මැනීමේ නියෝගවලට අනුකූලව ගණනය කරන ලද දළ ටොන් ප්‍රමාණය අදහස් වේ; ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් සම්මත කරන ලද ටොන් ප්‍රමාණය මැනීමේ අතුරු යෝජනා ක්‍රමය ආවරණය වන නැව් සඳහා, දළ ටොන් ප්‍රමාණය යනු ජාත්‍යන්තර ටොන් ප්‍රමාණ සහතිකයේ (1969) සටහන් තීරයේ ඇතුළත් වන ටොන් ප්‍රමාණය වේ;

"IBC සංග්‍රහය" යන්නෙන්, සංශෝධිත පරිදි, MSC 4(48) වන යෝජනා සම්මතය මගින් IMO හි සමුද්‍රීය ආරක්ෂණ කමිටුව විසින් සම්මත කරන ලද, තොග වශයෙන් අන්තරායදායක රසායනික ද්‍රව්‍ය රැගෙන යන නැව් ඉදිකිරීම සහ සම්පාදනය කිරීම සඳහා වන ජාත්‍යන්තර සංග්‍රහය අදහස් වේ;

"ILO" යන්නෙන්, ජාත්‍යන්තර කම්කරු සංවිධානය අදහස් වේ;

"IMO" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය අදහස් වේ;

"IMDG සංග්‍රහය" යන්නෙන්, සංශෝධිත පරිදි, MSC.122 (75) වන යෝජනා සම්මතය මගින් IMO හි සමුද්‍රීය ආරක්ෂණ කමිටුව විසින් සම්මත කරන ලද, ජාත්‍යන්තර සමුද්‍රීය අන්තරායදායක භාණ්ඩ සංග්‍රහය අදහස් වේ;

"ජාත්‍යන්තර ආරක්ෂණ කළමනාකරණ සංග්‍රහය" යන්නෙන්, ජාත්‍යන්තර සමුද්‍රීය සංවිධානය විසින් සම්මත කරන ලද 2002 නැව්වල ආරක්ෂිත මෙහෙයුම් සඳහා සහ දූෂණය වැළැක්වීම සඳහා වන ජාත්‍යන්තර කළමනාකරණ සංග්‍රහය අදහස් වේ;

"සමුද්‍රීය කම්කරු සම්මුතිය'' යන්නෙන්, 2006 පෙබරවාරි මස 23 වන දින ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මහා සමුළුව විසින් සම්මත කරන ලද සහ 2016 ජනවාරි මස 12 වන දින ශ්‍රී ලංකාව විසින් අනුමත කරන ලද 2006 සමුද්‍රීය කම්කරු සම්මුතිය යනුවෙන් හඳුන්වනු ලබන සම්මුතිය අදහස් වේ;

"මුහුදු කොල්ලය" යන්නට, 1982, මුහුදේ නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පිළිගත් සංවිධානය" යන්නෙන්, සංවිධානය විසින් සම්මත කරන ලද පිළිගත් සංවිධාන සඳහා වන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පිළිගනු ලැබ ඇති යම් සංවිධානයක් අදහස් වේ;

"මෙම සම්මුතියේ නියමයන්" යන්නෙන්, මෙම වගන්තිවල සහ සම්මුතියේ සංග්‍රහයේ නියෝගවල සහ "අ" කොටසේ නියමයන් අදහස් වේ;

"මුහුදු යාත්‍රාකරුවා" යන්නෙන්, මෙම සම්මුතිය අදාළ වන නැවක ඕනෑම තත්ත්වයකින් නෞකාස්ථව සේවයේ නියුක්ත කරන ලද හෝ නැවට සම්බන්ධ හෝ නැවේ සේවය කරන, නෞකාධිපතිවරයා ඇතුළු, යම් තැනැත්තකු අදහස් වන නමුත් පහත දැක්වෙන තත්ත්වයන් ඊට ඇතුළත් නොවේ;

(අ) නාවික නියමුවකු;

(ආ) වරායේ සේවකයකු;

(ඇ) නැව වරායේ පවතින කාලසීමාව ඇතුළත එහි තාවකාලිකව සේවයේ නියුක්ත වන තැනැත්තකු;

(ඈ) කිමිදුම්කරුවකු;

(ඉ) සමුද්‍රීය අධීක්ෂකවරයකු;

(ඊ) සමුද්‍රීය සමීක්ෂකයකු;

(උ) අලුත්වැඩියා කිරීමේ තාක්ෂණික ශිල්පියකු;

(ඌ) පර්යේෂකයකු;

(එ) විද්‍යාඥයකු

(ඒ) නැව් පරීක්ෂකයකු; සහ

(ඔ) ඕනෑම තත්ත්වයකින් නැවට නෞකාස්ථව සේවයේ නියුක්ත කරන ලද හෝ නැවට සම්බන්ධ හෝ නැවේ සේවය කරන සහ පහත දැක්වෙන (iii) වන (iv) වන සහ (v) වන අනුඡේදවල දක්වා ඇති යම් උපමානයක් සමග පහත දැක්වෙන (i) වන සහ (ii) වන අනුඡේදවල දක්වා ඇති උපමානයන් සම්පූර්ණ කරන යම් තැනැත්තකු:

(i) ඔහු එම නැවේ නෞකාස්ථව සිටින කාලසීමාව අනුගාමී දින 45 ක් නොඉක්මවයි;

(ii) යම් මාස දොළහක කාලසීමාවක් තුළ ඔහු එම නැවේ නෞකාස්ථව සේවය කරන සමස්ත කාලසීමාව මාස හතරක් නොඉක්මවයි;

(iii) ඔහුගේ කාර්යයේ ස්වභාවය නැවේ දෛනික කටයුතුවල කොටසක් නොවන්නේය;

(iv) ඔහු ඉටුකරන කාර්යය වෙරළේ පිහිටි ඔහුගේ ප්‍රධාන සේවා ස්ථානය සමඟ අවස්ථාවෝචිත වේ; සහ

(v) ඔහුගේ ප්‍රධාන සේවායෝජක විසින් ඉදිරිපත් කරනු ලබන කම්කරු සහ සමාජ කොන්දේසි මේ නියෝගය යටතේ සපයනු ලබන කොන්දේසි සමඟ සමාන වන්නේ ය.

"මුහුදු යාත්‍රාකරුවන්ගේ සේවා නියුක්ති ගිවිසුම" යන්නට, සේවානියුක්ති ගිවිසුමක් සහ ගිවිසුමේ වගන්ති යන දෙකම අයත් වේ;

"මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ සහ ස්ථානගත කිරීමේ සේවය" යන්නෙන්, නැව් අයිතිකරුවන් වෙනුවෙන් මුහුදු යාත්‍රාකරුවන් බඳවා ගැනීමේ හෝ මුහුදු යාත්‍රාකරුවන් නැව් අයිතිකරුවන් සමඟ ස්ථානගත කිරීමේ නිරත වන රාජ්‍ය හෝ පුද්ගලික අංශයේ යම් තැනැත්තකු, සමාගමක්, ආයතනයක්, නියෝජිතායතනයක් හෝ වෙනත් සංවිධානයක් අදහස් වේ;

"නැවේ අයිතිකරු" යන්නෙන්, නැවේ අයිතිකරු හෝ අයිතිකරුගෙන් නැව මෙහෙයවීමේ වගකීම පවරාගනු ලැබූවා වූ ද, එසේ වගකීම පවරා ගැනීමෙන් පසුව, නැවේ අයිතිකරු වෙනුවට වෙනත් යම් සංවිධානයක් හෝ තැනැත්තන් විසින් කාර්ය හෝ වගකීම් ඉටු කරනු ලබන්නේ ද යන්න නොතකා, මෙම සම්මුතියට අනුකූලව නැවේ අයිති -කරුවන් වෙත පවරනු ලබන කාර්ය සහ වගකීම් භාර ගැනීමට එකඟ වී ඇත්තාවූ ද, කළමනාකරු, නියෝජිතයකු හෝ ආවරණ රහිත බෝට්ටු කුලියට දෙන තැනැත්තකු වැනි වෙනත් සංවිධානයක් හෝ තැනැත්තකු අදහස් වේ;

"STCW සම්මුතිය" යන්නෙන්, කලින් කලට සංශෝධිත පරිදි, 1978, මුහුදු යාත්‍රිකයන් පුහුණු කිරීමේ, සහතික කිරීමේ සහ මුරකාවලෙහි යෙදීමේ ප්‍රමිති පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අදහස් වේ;

"පුහුණුවන්නා" යන්නෙන්, නැවක සේවය කිරීමේ හුදු අරමුණ පුහුණුවක් ලබා ගැනීම වන්නාවූ, පුහුණුව ලබාදෙන්නකු සමඟ එළඹි ලිඛිත ගිවිසුමක ("පුහුණු කිරීමේ ගිවිසුමක්") නියමයන් යටතේ නැවක සිටින තැනැත්තකු අදහස් වේ; සහ

"WHO" යන්නෙන්, ලෝක සෞඛ්‍ය සංවිධානය අදහස් වේ.

47. 1975 ජුලි මස 16 වැනි දින 97/5 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ සංශෝධිත 1975 වෙළඳ නැව් (තරුණ අය සේවයේ යෙදවීමේ) නියෝග, 1975 ඔක්තෝබර් මස 1 වැනි දින 183/7 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1975 වෙළඳ නැව් (ආධුනිකත්ව මුහුදු සේවය) නියෝග, සහ 1980 ජුලි මස 29 වැනි දින 99/6 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 1980 වෙළඳ නැව් (නැවියන් සේවයේ නියුක්ත කරවා ගැනීමේ සහ සේවා කොන්දේසි) නියෝග මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

EOG 08-136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.